# ප්‍රමාද වී ලැබුණු යුක්තිය...

RIGHT TO LIFE
HUMAN RIGHTS CENTRE

# ප්‍රමාද වී ලැබුණු යුක්තිය...

පළමු මුද්‍රණය : 2015 සැප්තැම්බර්
දෙවන මුද්‍රණය : 2019 අගෝස්තු

**කර්තෘ**
නීතිඥ උපේන්ද්‍රා ගුණසේකර

---

**ප්‍රකාශනය**
රයිට් ටු ලයිෆ් මානව හිමිකම් මධ්‍යස්ථානය
අංක 07, කොපියාවත්ත පාර, කොළඹ 09.
දුරකථනය/ෆැක්ස් : 011 266 9100
ඊමේල් : right2lifelk@gmail.com වෙබ් : www.right2lifelanka.org

---

**අනුග්‍රහය**
එක්සත් ජාතීන්ගේ වධ හිංසාවට එරෙහි අරමුදල
United Nations Voluntary Fund for Victims of Torture (UNVFVT)

---

**අක්ෂර සංයෝජනය**
නීතිඥ උපේන්ද්‍රා ගුණසේකර

---

**සෝදුපත්**
රංජනී ගමගේ

---

**පිටු සැකැස්ම, කවර නිර්මාණය හා මුද්‍රණය**

adARTS
If you can imagine it, we can create it.
Designing and Printing

No. 111, 1/1, Old Road, Navinna, Maharagama.
**Tel: +94 11 310 3181, +94 76 610 6467**
Email: adartsdp@gmail.com

# පටුන

පිටුව


දෙවන මුද්‍රණයේ පෙරවදන v

පළමු මුද්‍රණයේ පෙරවදන viii

**ජෙරාඩ් පෙරේරා සිද්ධිය හා ලංකාවේ නීති ක්‍රමයේ බේදවාචකය xii**

- සමාජයීය හෘදය සාක්ෂිය (Social Consience) xviii
- යුක්තියෙන් දික්කසාද වුනු නීති ක්‍රියාදාමයක් xxi
- ජෙරාඩ් පෙරේරා පිළිබඳ නඩුව අවුරුදු 17ක පමණ කාලයක් තිස්සේ ඇදී ගියේ ඇයි? xxii

**01. නීතිය ඉදිරියට ගිය වින්දිතයෙකුගේ ඉරණම.... 1**

**02. තමාට එරෙහිව පවරන ලද නඩුවෙන් ගැළවීමට එක් වින්තිකරුවකු විසින් ජෙරාඩ්ව ඝාතනය කරයි... 7**

**03. පියා අහිමි දරු පවුලක් ... 8**

**04. ජෙරාඩ් මර්වින්ගේ ඝාතනයට විරුද්ධව නඩු පැවරෙයි .... 9**

- පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු - දොන් ගයාන් චන්දිමාල් අමරකෝන් 11
- පැමිණිල්ලේ දෙවන සාක්ෂිකරු - ප්‍රදීප් කුමාර 12
- පැමිණිල්ලේ සාක්ෂිකරු - කරුපයියා ජයසිලන් 13
- පැමිණිල්ලේ සාක්ෂිකරු - ජෙරාඩ්ගේ බිරිඳ පද්මා වික්‍රමරත්න 14
- පැමිණිල්ලේ සාක්ෂිකරු - දිලුක්ෂ අල්විස්, වත්තල ප්‍රාදේශීය සභා මන්ත්‍රී 15
- පැමිණිල්ලේ සාක්ෂිකරු - වර්ණපාල ආරච්චිගේ චන්දන අබේසේකර, අපරාධ අංශයේ ස්ථානාධිපති, කඳාන පොලිස් ස්ථානය 16
- පැමිණිල්ලේ සාක්ෂිකරු - අධිකරණ වෛද්‍ය අසරප්පුලිගේ දයාපාල 17
- විත්තියේ සාක්ෂි 18

**05. ජෙරාඩ්ගේ ඝාතනයෙන් පසුව මීගමුව මහාධිකරණයේ විභාග වෙමින් පැවති වධහිංසා නඩුවේ තත්වය ... 26**

**06. උක්ත නඩු තීන්දුව කෙතරම් යුක්ති සහගත ද?... 33**

**07. මහාධිකරණ තීන්දුවට එරෙහිව අභියාචනාධිකරණය කරා.... 41**

**08. ජෙරාඩ්ගේ බිරිඳගේ කථාව... 44**

**09. යුක්තිය සොයා යන වින්දිතයා හා යුක්තියට මඟ පෙන්වන සාක්ෂිකරුවා.... 48**

**10. පසුවදන... 51**

**11. පොලිසිය සහ පුරවැසියා.... 55**

මෙම කෘතිය සම්පාදනයේදී යොදා ගත් මූලාශ්‍ර 57

ජෙරාඩ් පෙරේරා ගැන ලිය වූ කවි 58

# දෙවන මුද්‍රණයේ පෙරවදන

ජෙරාඩ් මර්වින් පෙරේරාගේ සිද්ධි හරහා අපගේ අපරාධ පරීක්ෂණ ක්‍රියාවලියේ හා අධිකරණ ක්‍රියාවලියේ ඇති බරපතල ගැටලුත්, අපරාධ නඩුවක ප්‍රධාන සාක්ෂිකරුවෙකු ඔවුන් ආරක්ෂා කිරීමට ස්ථාපිත කර ඇති ආයතනයක නිලධාරියෙකුගෙන් ආරක්ෂා කර ගැනීමට රජයට නොහැකිවීමත්, මෙම අපරාධයට සම්බන්ධ බවට අධිකරණය හරහා හෙළි වූ පොලිස් පරීක්ෂකවරයාගේ මානසික මට්ටම හා ඔහු හැසිරී ඇති උමතු ආකාරය පිළිබඳවත් විශාල පාඩමක් අපට කියා දෙයි.

එමෙන්ම, මෙම සිද්ධියේ දී අසරණ වන දරු පවුල රැකගැනීමට වින්දිත ආරක්ෂණ ක්‍රමවේදයක් රට තුළ නොතිබීමත්, මුල් අවධියේ ජෙරාඩ්ට සිදු වූ අසාධාරණයට එරෙහිව පෙනී සිටි විවිධ පුද්ගලයන් හා සංවිධානයන්හි අවධානය ක්‍රමයෙන් හීන වී යාමෙන් එම පවුල මුහුණ දුන් තවත් ආකාරයක ගැටලුත්, මෙම අවුරුදු දහනමය තුළ පවුලේ සමහර ඥාතීන් පවා ඔවුන්ව මඟ ඇරීමත්, මෙතරම් විශාල අගතියකට පත් වූ පවුලක් සමාජය විසින් ආරක්ෂා කර රැක ගැනීම වෙනුවට, ඔවුන් දුටු විට මඟ හැර යාමත්, ඔවුන්ව තව දුරටත් අධෛර්ය සම්පන්න කරවන ප්‍රකාශයන් සිදු කිරීම වැනි සිද්ධීන් මත අප අවට සමාජය කොතරම් පරිහානියට පත්ව ඇති ද යන්නත් මෙම සිදුවීම පෙළ හරහා අපට කියාදෙන දෙවැනි පාඩමයි.

මේ සියලු පරිහානීන් මැද දශක දෙකකට ආසන්න කාලයක් ලබා ගනිමින් හෝ ශ්‍රේෂ්ඨාධිකරණය ඇතුළු අධිකරණයන් ලබා දුන් මෙම නඩු තීන්දු මගින් යුක්තිය හා සාධාරණත්වය ඉල්ලා කටයුතු කරනු ලබන සැමට නැවතත් අලුත් බලාපොරොත්තුවක් අධිකරණය විසින් ලබා දී ඇති අතර එය අප විසින් අගය කළ යුතු වගේම එම තත්ත්වය තවදුරටත් සංවර්ධනය කරමින් ආරක්ෂා කළ යුතුව ඇත.

ජෙරාඩ් මර්වින් පෙරේරාට වධහිංසා කිරීමට එරෙහිව 1994 අංක 22 දරන වධහිසංවට එරෙහි පනත යටතේ මීගමුව මහාධිකරණයේ පැවැති නඩුවේ (එච්.සී 326/2003) තීන්දුව නඩුව පවරා අවුරුදු 17කට පසුව එනම් 2019 ජූනි 28 වන දින මීගමුව මහාධිකරණ විනිසුරු ආර්. ඒ. රණරාජා මහතා විසින් ප්‍රකාශයට පත්කරනු ලැබීය. එම නඩු තීන්දුව මගින් ඉහත වධහිංසාවට එරෙහි පනත යටතේ අදාළ චූදිතයින්ගෙන් දෙදෙනෙකු වැරදිකරුවන් කරමින් එම පනත යටතේ ලබා දිය හැකි උපරිම දඬුවම් ලබා දී තිබුණි. එම නඩු තීන්දුවත් සමගම මෙම ජෙරාඩ් මර්වින් සිද්ධිය සම්බන්ධව පැවරී තිබු අවසාන නඩුව ද ඉන් නිමා විය. නමුත් මෙම තීරණයට එරෙහිව අදාල චූදිතයින් විසින් අභියාචනා කිරීමට සූදානම් බවද අප වෙත වාර්තා වී තිබේ.

මෙම සිද්ධියත්, මෙම සිද්ධිය හරහා අප රටේ යුක්තිය පසිදලීමේ ක්‍රියාවලියේ ඇති විශාල ගැටලු පිළිබඳවත් අප නිරන්තරයෙන් සාකච්ඡා කරනු ලැබූ අතර, ඒ පිළිබදව තව දුරටත් මහජන අවධානය යොමු කිරීම සඳහා ජෙරාඩ් මර්වින් පෙරේරා සිද්ධිය හා අප රටේ නීති ක්‍රමයේ කඩා වැටීම යන මැයෙන් මහජන මන්ත්‍රණ සභාවක් පැවැත්වීමට අප සූදානම් කර තිබේ. ඒ නිමිත්තෙන් 2015 සැප්තැම්බර් මාසයේ දී අප විසින් මුද්‍රණය කරනු ලැබූ නීතිඥ උපේන්ද්‍රා ගුණසේකර මෙනවිය විසින් රචිත ප්‍රමාද වී ලැබුණු යුක්තිය නැමැති මෙම සිද්ධිය ගැන විග්‍රහ කෙරෙන ප්‍රකාශනය නැවතත් යාවත්කාලීන කර මුද්‍රණය කිරීමට ද අප කල්පනා කළෙමු.

අද ඔබ අතට පත්වන්නේ එම ප්‍රකාශනයේ දෙවැනි මුද්‍රණයයි. මෙම දෙවැනි මුද්‍රණය සදහා ආසියානු මානව හිමිකම් කොමිසමේ අධ්‍යක්ෂ නීතිඥ බැසිල් ප්‍රනාන්දු මහතා විසින් රචිත ජෙරාඩ් මර්වින් පෙරේරා සිද්ධිය හා ලංකාවේ නීති ක්‍රමයේ බේදවාචකය නැමති පරිච්ඡේදය ද ඇතුළත් කරනු ලැබීය.

එමෙන් ම, ලක්ෂාන් ප්‍රනාන්දු මහතා විසින් රචිත මීගමුව මහාධිකරණයේ පැවැති වධහිංසා නඩුවේ තීන්දුවේ සාරංශයක් ද මෙම පොතේ පසුවදනට එක්කර ඇත.

අවසාන වශයෙන් අද අප අතර නොසිටියත් සදා නොමැකෙන මතක සටහන් ගණනාවක් තබා යමින් මේ රටේ යුක්තිය පසිඳලීමේ

ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා ජීවිත පරිත්‍යාගයෙන් යුතුව විශාල මෙහෙවරක් සිදුකරනු ලැබූ ජෙරාඩ් මර්වින් පෙරේරා ගෞරවයෙන් යුතුව සිහිකරමින්, දශක දෙකකට ආසන්න කාලයක් තම ස්වාමිපුරුෂයාට සිදු වූ අසාධාරණයට එරෙහිව විවිධ බාධක හා කම්කටොළු මැද යුක්තිය ඉල්ලා අනවරත අරගලයක නියුතු වූ ජෙරාඩ් මර්වින් පෙරේරාගේ ආදරණීය බිරිඳ වූ පද්මා වික්‍රමරත්න මැතිණිය ඇතුළු දරුවන් තිදෙනාටත් අපගේ ගෞරව පූර්වක ස්තුතිය පුද කිරීමටද මෙය අවස්ථාවක් කර ගනිමු.

**පිලිප් දිසානායක**
විධායක අධ්‍යක්ෂක,
රයිට් ටු ලයිෆ් මානව හිමිකම් මධ්‍යස්ථානය
03.08.2019

# පළමු මුද්‍රණයේ පෙරවදන

රයිට් ටු ලයිෆ් මානව හිමිකම් සංවිධානය ආරම්භ වෙන්නේ 2002 වසරේ. ආරම්භයත් සමඟම පොලිස් පහර දීම් ඇතුළු සිද්ධි කිහිපයක් අප වෙත වාර්තා වුවත් ඒ අතරින් ඉතා කෲර ලෙස සිදු කළ පොලිස් වධහිංසා සිද්ධි තුනක් පිළිබඳව අපගේ පූර්ණ අවධානය යොමු වෙනවා. ඉන් පළමුවැන්න වුයේ ඒකල නෝත්පෝල් ආයතනයේ කම්කරු නායකයෙකු වූ රසික සම්පත් මහතා ඇතුළු කම්කරුවන් තිදෙනෙකුට ජාඇල පොලිසිය විසින් සිදු කළ අමානුෂික පහරදීමක්. දෙවැන්න වාර්තා වුයේ මට්ටක්කුලිය පිහිටි සිලෝන් ග්‍රීන් එලිවේටර් සමාගමේ කම්කරුවෙකු වු එරික් ඇන්ටෝනියා ක්‍රාමර් මහතාට මෝදර පොලීසිය විසින් සිදු කළ අමානුෂික පහරදීම. මෙම සිද්ධි දෙක සම්බන්ධව අපි කඩිනමින් ක්‍රියාත්මක වීම නිසා අදාළ පොලිස් නිලධාරීන් වැඩ තහනමට පවා ලක් වෙනවා. ඒ සමඟම 2003 වසරේ දී මේ පහර දීම් දෙකටම එරෙහිව නීතිපතිවරයා විසින් වධ හිංසා වැලැක්වීමේ පනත යටතේ නඩු දෙකක් ද පවරනු ලබනවා.

මේ අතර තුන්වැනි සිද්ධිය ලෙස වාර්තා වෙන්නෙ එවැනිම කම්කරුවෙකුට සිදු කළ තවත් පහර දීමක් ගැනයි. එම පහර දීම සිදු වෙන්නෙ 2002.06.14 දින. ඒ වන විට අප වෙත වර්තා වී තිබූ සිද්ධි සමඟ ගත් විට මෙම පහර දීම ඉතා කෲර හා ම්ලේච්ඡ පහර දීමක්, මාධ්‍ය මඟින් මේ සම්බන්ධව වාර්තා වූ අතර, මෙම පහරදීම පිළිබඳව විශාල කතාබහක් සමාජය තුළ නිර්මාණය වුනා. වත්තල ප්‍රදේශයේ සිදු වූ ත්‍රිපුද්ගල මිනීමැරුමක් සම්බන්ධව පොලිසියට ලැබෙන වැරදි තොරතුරු මත කොළඹ වරාය නැව් තටාකාංගනයේ අරක්කැමියෙකු ලෙස සේවය කළ ජෙරාඩ් මර්වින් පෙරේරා වත්තල පොලීසිය විසින් අත්අඩංගුවට ගනු ලබනවා. අත්අඩංගුවට පත් අවස්ථාවේ සිට ඔහුගේ දෑත් පිටුපසට කර බැඳ උඩ එල්ලා පහර දෙන වත්තල පොලීසිය, එදිනම රාත්‍රියේ දැනගන්නවා තමන් අත්අඩංගුවට ගෙන උඩ එල්ලා

පහර දෙන්නේ වැරදි පුද්ගලයෙකුට බව. වත්තල පොලීසිය විසින් පසු දින ඔහුව මුදා හරිනු ලැබුවත් ඔහුට යන්න වෙන්නෙ නිවසට නොව රෝහල වෙතයි. මුලින්ම යක්කල ආයුර්වේද රෝහලටත් ඉන් පසුව නවලෝක රෝහලටත්, එදිනම නවලෝක රෝහලේ දැඩි සත්කාර ඒකකයටත් ඔහු යොමු වෙනවා. ජීවිතයත් මරණයත් අතර සටනක් දෙමින් දින 20කට ආසන්න කාලයක් ඔහුට සිහිසුන් නොමැතිව අසාධ්‍ය තත්වයේ දැඩි සත්කාර ඒකකයේ තබා ප්‍රතිකාර ලබා දෙනවා. එම රෝහලේ ස්නායු රෝග පිළිබඳව විශේෂඥ වෛද්‍ය කොල්වින් සමරසිංහ ඇතුළු විශේෂඥ වෛද්‍යවරු නොසිටින්න ඔහුගේ ජීවිතය ගොඩගැනීමට නොහැකි වනු ඇති බවයි ප්‍රකාශ වුයේ.

මෙම සිද්ධිය හොංකොං හි පිහිටි ආසියානු මානව හිමිකම් කොමිසමේ පුර්ණ අවධානයට යොමු වෙනවා. ඒ අනුව එම කොමිසමේ නීතිඥ බැසිල් ප්‍රනාන්දු මහතාගේ උපදෙස් මත නීතිඥ සංජීව වීරවික්‍රම මහතා ඔහු රෝහලේ සිහිසුන්ව සිටියදීම, ඔහුගේ බිරිඳ වන පද්මා වික්‍රමරත්න මහත්මියගේ ද එකඟත්වය ඇතිව ශ්‍රේෂ්ඨාධිකරණයේ මූලික අයිතිවාසිකම් නඩුවක් ද පවරනු ලබනවා. මෙම නඩුව විභාගයට ගත් ශ්‍රේෂ්ඨාධිකරණය ඔහුගේ මූලික අයිතිවාසිකම් කඩ වී ඇති බව පිළිගෙන රුපියල් ලක්ෂ 8කට ආසන්න වන්දියක් හා ඔහු නේවාසිකව ප්‍රතිකාර ගත් නවලෝක රෝහලේ බිල ගෙවා දැමීම සඳහා තවත් රුපියල් ලක්ෂ 7 කට ආසන්න මුදලක් වන්දි වශයෙන් ප්‍රදානය කරනවා. මෙය මූලික අයිතිවාසිකම් කඩවීමක් සම්බන්ධව ලංකා ඉතිහාසයේ ලබා දුන් විශාලම වන්දිය ලෙසත් වාර්තා වෙනවා.

එම නඩු තීන්දුව මගින් වන්දි ලබා දීම පමණක් නොව පොලිස් වධහිංසාව වැලැක්වීම සඳහා පොලිස්පතිවරයා විසින් ගත යුතු පියවරයන් ගැනත්, මෙම පහර දීමට එරෙහිව අදාල පොලිස් නිලධාරීන්ට එරෙහිව 1994 අංක 22 දරන වධහිංසා වැලැක්වීමේ පනත යටතේ නඩු පැවරිය හැකි බවටත් නඩු තීන්දුවේ සඳහන් කිරීමත් වැදගත් සාධක ලෙස සැලකිය හැකියි.

රයිට් ටු ලයිෆ් සංවිධානය ජෙරාඩ්ගේ සිද්ධිය සමග සෘජුව සම්බන්ධ වන්නේ ශ්‍රේෂ්ඨාධිකරණ නියෝගය අනුව නීතිපතිවරයා

විසින් වධහිංසා පනත යටතේ 2003 වසරේ දී මීගමුව මහාධිකරණයේ නඩු පැවරීමත් සමඟයි. අධිකරණයේදීත් ඉන් පිටතදීත් ජෙරාඩ්ට විවිධාකාරයේ බලපෑම් අදාල පොලිස් නිලාධාරීන්ගෙන් වරින් වර එල්ල වුනා. ඉන් ජෙරාඩ්ව නවත්වන්න බැරි බව තේරුම් ගත් මෙම නිලධාරීන් යම් මුදලකට නඩුව ඉල්ලා අස් කර ගන්නා ලෙස හෝ සමථයකට එන ලෙසත් ඔහුගෙන් ඉල්ලා සිටියා. අවස්ථා කිහිපයකදීම ජෙරාඩ්ගේ අසල්වැසියන් මාර්ගයෙනුත් යම් මුදලකට නඩුව සමථයකට එන ලෙසට ඉල්ලීම් ඉදිරිපත් වෙනවා. නමුත් ඔහු ඒ සඳහා එකඟ වෙන්නෙ නැහැ. මෙම නඩුව මීගමුව මහාධිකරණයේ විභාග වෙමින් තිබෙන අවස්ථාවේ 2004 නොවැම්බර් මාසයේ 21 වන දින එම නඩුවේ වැදගත්ම සාක්ෂිය ලෙස පැවැති ජෙරාඩ් ගේ සාක්ෂි ලබා දීමට ප්‍රථම ඔහුව මහමඟදී කෘෘර ලෙස ඝාතනය කරනු ලබනවා. මෙම ඝාතනයේ ප්‍රධාන සැකකරු වන්නේ 2002 වර්ෂයේ දී ජෙරාඩ්ට පහර දුන් ප්‍රධාන පොලිස් නිලධාරියාමයි.

මෙම කෘෘර හා ම්ලේච්ඡ ඝාතනය අපව විශාල කම්පනයකට පත් කරනවා. එමෙන්ම මෙම සිද්ධිය හරහා අප රටේ යුක්තිය පසිඳලීමේ සංස්ථාවල ඇති කඩා වැටීමත්, පොලිස් නිලධාරීන් පත්ව ඇති මෘගත්වයත් පිළිබඳව පැහැදිලි පණිවුඩයක් අපටත් රටටත් ලෝකයටත් මෙම සිද්ධිය හරහා ලබා දෙනවා. අපරාධ නඩුවක ප්‍රධාන සාක්ෂිකරුවෙකු මෙන්ම වින්දිතයෙකු රැක ගැනීමට නොහැකි අධිකරණයක්, පොලීසියක් හා රජයක් පත්ව ඇති අසරණ බව මෙම සිද්ධිය හරහා කියාපෑවා.

ජෙරාඩ්ට ඔහුගේ ජීවිතය නැවත ලබා දිය නොහැකි වුවත්, ඔහුගේ දරු පවුල රැක ගනිමින් මෙම සිද්ධිය සම්බන්ධව යුක්තිය ලබා ගැනීම වෙනුවෙන් උපරිම ලෙස මැදිහත් විය යුතු බවට අප සියලු දෙනා යම් කිසි එකඟත්වයකට පැමිණියා. ඒ සදහා මෙම සිද්ධිය සම්බන්ධව එක පැත්තකින් නීතිමය පියවර, අනෙක් පැත්තෙන් මහජන දැනුවත් කිරීම්, මහජන උද්ඝෝෂණ හා රජයට හා රාජ්‍ය ආයතන වෙත බලපෑම් කිරීම සඳහා අප ජාතික හා ජාත්‍යන්තර වශයෙන් ආසියානු මානව හිමිකම් කොමිසමේ මූලිකත්වයෙන් සංවිධාන ජාලයක් ලෙස කටයුතු කරනු ලැබුවා.

එහි ප්‍රතිඵලයක් ලෙසයි අවුරුදු 10කට වැඩි කාලයක් ගත වී හෝ මෙවැනි නඩු තීන්දුවක් ලබා ගැනීමට හැකි වුයේ. (ජෙරාඩ් ඝාතන නඩුවේ සැකකරුවන් දෙදෙනාටම පසුගියදා මරණ දඬුවම ලබා දෙනු ලැබුවා). නමුත් 2003 වසරේ නීතිපති විසින් පැවරූ වධහිංසා නඩුව අවුරුදු 12 ක් තිස්සේ තවමත් මීගමුව මහාධිකරණයේ විභාග වෙනවා. මුල් අවස්ථාවේ එම නඩුවේ අදාල චූදිතයන් එවකට සිටි මහාධිකරණ විනිසුරුවරිය විසින් නිදොස් කොට නිදහස් කරනු ලැබුවත්, එම තීන්දුව අභියෝග කරමින් ඊට එරෙහිව ගත් ක්‍රියා මාර්ග නිසා ඇපීල් උසාවියත් පසුව ශ්‍රේෂ්ඨාධිකරණයත් එම තීන්දුව වැරදි බවට නියෝග කරමින් මෙම නඩුව නැවත මුල සිට විභාග කරන ලෙසත් එම නඩුව 2014 දෙසැම්බර් වන විට අවසන් කරන ලෙසටත් ශ්‍රේෂ්ඨාධිකරණය විශිෂ්ට තීන්දුවක් ලබා දුන්නා. නමුත් ජෙරාඩ්ගේ වධහිංසා නඩුව මීගමුව මහාධිකරණයේ තවමත් විභාග වෙනවා.

ජෙරාඩ්, පැවති ජඩ දේශපාලන ක්‍රමයේ ගොදුරක් වෙමින් මේ රටේ ප්‍රගතිශීලී මිනිසුන්ගේ හෘද සාක්ෂිය අවදි කරමින් පැවති දූෂිත ක්‍රමය වෙනස් කළ යුතුයි කියන තැනකට අපව යොමු කළා. එහි ප්‍රතිඵලයක් ලෙස අවුරුදු 12කට ආසන්න අරගලයකින් පසුව අපට යාන්තමින් හුස්මක් ගන්න පුළුවන් තැනකට අපි මේ රට නැවත ගෙනවිත් තිබෙනවා. එම ගෞරවයෙන් සැහෙන කොටසක් යුක්තිය වෙනුවෙන් තම ජීවිතය පරදුවට තැබූ ජෙරාඩ්ට හිමි විය යුතුයි. මේ රටේ යුක්තිය නැවත ගෙන ඒම සඳහා ජෙරාඩ් තම ජීවිතය පූජා කරමින් කළ පරිත්‍යාගය අමරණීයයි.

**පිලිප් දිසානායක**
විධායක අධ්‍යක්ෂ,
රයිට් ටු ලයිෆ් මානව හිමිකම් මධ්‍යස්ථානය
26.09.2015

# ජෙරාඩ් පෙරේරා සිද්ධිය හා ලංකාවේ නීති ක්‍රමයේ ඛේදවාචකය

(නීතිඥ බැසිල් ප්‍රනාන්දු මහතා දෙවැනි මුද්‍රණය සඳහා ලියන ලද්දකි)

ජෙරාඩ් පෙරේරා මහතාට මුලින් වධහිංසා කිරීමත්, පසුව ඔහු ඝාතනය කිරීමත් එහි ප්‍රතිඵල වශයෙන් පොලිස් නිලධාරීන් දෙදෙනකු වධහිංසාව සම්බන්ධයෙන් වසර 10ක සිරදඬුවම්වලට යටත්වීමත් මිනීමැරීම සම්බන්ධයෙන් උප පොලිස් පරීක්ෂක නිලධාරියෙකු හා ඔහුගේ සගයා එල්ලා මැරීමට අධිකරණයෙන් ගත් තීන්දුවත් ආදිය පිළිබඳව අපි සිහිපත් කරන්නේ කිසියම් ජයග්‍රහණයක් සිහිපත් කරන්නාක් මෙන් නොවේ. ඇත්තෙන්ම අප සිහිපත් කරන්නේ මහා පරිමාන ඛේදවාචකයක් හා ඒ සම්බන්ධයෙන් තවත් සිදු වූ ඛේදවාචක ගණනාවක් සම්බන්ධයෙනි.

මෙය ජෙරාඩ් පෙරේරා නමැති රටවැසියා පිළිබඳ ඛේදවාචකයකි. ජෙරාඩ් පෙරේරා නමැති ස්වාමි පුරුෂයා හා පියා පිළිබඳව සිදු වූ ඛේදවාචකයකි. සමාජයේ බොහෝ දෙනෙකු ආදරයෙන් ඇසුරු කළ මිනිසෙකු පිළිබඳව ඔහුට හා එම මිතුරන්ටත් පවුල්වල සාමාජිකයන්ටත් සිදු වූ ඛේදවාචයකි.

එය ආදරණීය බිරිඳකට සිදු වූ ඛේදවාචකයකි. එය ආදරණීය දරුවන් තිදෙනකුට සිදු වූ ඛේදවාචකයකි. එය දෙපාර්ශවයේම පවුල්වල සමාජිකයන්ට සිදු වූ ඛේදවාචකයකි.

එය ලංකාවේ පවතින නීති ක්‍රමය තුළ ඇති මහා පරිමාන ඛේදවාචක තත්වයක් එළිදරව් කිරීමකි.

එමෙන්ම එය ලාංකික සමාජය පුරා පැතිර පවතින සමාජයීය හෘදය සාක්ෂියේ අඩුපාඩුකම් කියාපාන ඛේදවාචකයකි.

මේ සියලුම ඛේදවාචකයන්ගේ ප්‍රතිඵල අප දැක අවසාන නැත. ඒවායේ ප්‍රතිඵල පුද්ගලික ක්ෂේත්‍රයේත්, සමාජ ක්ෂේත්‍රයේත් තව බොහෝ කලක් පවතිනු ඇත. එය ද ඛේදවාචකයකි.

මෙම අපරාධය කළ පුද්ගලයන් හා ඔවුන්ගේ පවුල් සම්බන්ධයෙන්ද අවසානයට ලැබී ඇති ප්‍රතිඵලයද සාධාරණීය ප්‍රතිඵලයක් වුවත් ඒ තුළින් කියැවෙන්නේ යම් වරදක් වළක්වා ගැනීමට බැරි වීම නිසා එම අපරාධකාරයන් හා ඔවුන්ගේ පවුල් සම්බන්ධයෙන් ද සිදු වී ඇති ඛේදවාචකයකි.

**මුලින්ම ඇසිය යුතු ප්‍රශ්නය වන්නේ මෙම ඛේදවාචකය නැති කර ගැනීමට හෝ සිදුවීම වැළැක්වීමට ඉඩ තිබුණාද යන ප්‍රශ්නයයි. එය දෛවගත සිදුවීමක් නොව වළක්වා ගත හැකිව තිබූ වැරදි ගණනාවක් වළක්වා නොගැනීම හේතුවෙන් සිදු වූ ඛේදවාචකයක් බව පැහැදිළිව පෙනී යයි.**

මුලින්ම මෙම ඛේදවාචකය වළක්වා ගත හැකි වූයේ ජෙරාඩ් පෙරේරා මහතාට විරුද්ධව කිසියම් පැමිණිල්ලක් කවුරුන් හෝ විසින් කර තිබුණානම් ඒ මහතා එම පැමිණිල්ල සම්බන්ධයෙන් අත්අඩංගුවට ගැනීමට පෙර ලැබී තිබූ පැමිණිල්ලේ කිසියම් සත්‍යතාවයක් තිබේද නැද්ද යන ප්‍රශ්නය පොලිසිය විසින් විභාග කළ යුතුව තිබුණි. ලෝකයේ සියලුම දියුණු නීති ක්‍රමයක් පවතින රටවල දැන් අත්අඩංගුවට ගැනීම් සිදු වන්නේ ඒ ආකාරයටය. කවුරුන් හෝ පැමිණිල්ලක් කළ පමණින් පැමිණිල්ලට භාජනය වූ පුද්ගලයා අත්අඩංගුවට ගැනීම අශීලාචාර සම්ප්‍රදායක් පමනක් නොව නීතිවිරෝධී සම්ප්‍රදායක් ලෙසද සලකනු ලැබීම දැන් ශතවර්ෂ දෙකකට වඩා වැඩි කාලයකට පෙර සිට දියුණු නීති පද්ධතීන් පවතින රටවල පිළිපදින මූලික අදහසකි. එවැනි සොයා බැලීමක් මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් කෙරුණා නම් ජෙරාඩ් පෙරේරා මහතා අත්අඩංගුවට ගැනීමක් වත් සිදු වන්නේ නැත.

ඔහුට විරුද්ධව කිසියම්ම හෝ සාධාරණ සැකයක් ඇති කිරීමට තරම් කිසිදු කරුණක් මේ පිළිබඳව පැවතුනු එකදු නඩු විභාගයකදීවත් එළි වුනේ නැත. අවුරුදු 17 ක පමණ කාලයක් තිස්සේ දිග්ඇදුනු නඩු විභාග ගණනාවක් පැවැත්වුණා. ශ්‍රේෂ්ඨාධිකරණයේ මානව හිමිකම් පිළිබඳ

නඩුවත්, මීගමුව මහාධිකරණයේ වධහිංසාව හා මිනීමැරීම පිළිබඳව තිබූ නඩු දෙකත්, අභියාචනාධිකරණයේ මීගමුව මහාධිකරණයෙන් වධහිංසාව පිළිබඳව දුන් පළමු තීන්දුවට විරුද්ධව කරන ලද අභියාචනය සලකා බැලීමේදීවත්, ඊට පසුව ඒ පිළිබඳවම පැවති ශ්‍රේෂ්ඨාධිකරණයේ දී පැවති විභාගයේදීවත් ජෙරාඩ් පෙරේරා මහතාට විරුද්ධව අබමල් රේණුවක වරදක් සම්බන්ධයෙන් කිසියම්ම හෝ හෙළිදරව් වීමක් කෙරී නැත. මෙයින් ඉතා පැහැදිළිව පෙනී යන්නේ එවැනි කිසියම් වරදක් කිරීමට හෝ එම වරදට අනුබල දීම හෝ වෙනත් ආකාරයකින් සහාය දීමක් පිළිබඳව කිසියම්ම හෝ පදනම් සහිත සාක්ෂියක් නොපැවති බව ය. මේ බව ඒ මහතා අත්අඩංගුවට ගැනීමට පෙරම පොලිසියට සොයා ගත හැකිව තිබුණි.

පොලිසියේ පරීක්ෂණය මෙහෙයවන ලද්දේ සහකාර පොලිස් අධිකාරී වරයෙකුගේ අධීක්ෂණය යටතේ ය. සහකාර පොලිස් අධිකාරීවරයෙකු යනු යම් අත්දැකීමක් හා බුද්ධියක් ඇත්තෙකු යැයි සැලකිය හැකි ය. එවැනි මගපෙන්වීමක් තිබෙන තත්ත්වයක් යටතෙත් මෙවැනි සාපරාධී අත්අඩංගුවට ගැනීමක් සිදු වූයේ කෙසේ ද? මෙයින් අදහස් වන්නේ අදාළ සිද්ධිය සම්බන්ධයෙන් මෙම සහකාර පොලිස් අධිකාරීවරයාගේ ද සහභාගිත්වය තිබූ බව ය. මෙම වරද වළක්වා ගැනීමට තිබුනු දෙවන අවස්ථාව වූයේ ජෙරාඩ් පෙරේරා මහතා අත්අඩංගුවට ගැනීමෙන් පසුව ඔහුගෙන් යම් ප්‍රශ්න ඇසුවා නම්, උදාහරණයක් වශයෙන් ඔහු ගැන සැක කළ කරුණු තිබුණා නම් එම සැකය පිළිබඳ එය තහවුරු කර ගැනීමට හෝ නැතහොත් එම සැකය දුරු කර ගැනීමට හැකි වන සේ සුළු කාලයක් ප්‍රශ්න කිරීමක් සිදු කළා නම් දැන් සිදු වී තිබෙන ඛේදවාචකය වළක්වා ගන්නට ඉඩ තිබුණි.

**එහෙත් එයට විරුද්ධව දැඩි මතවාදයක් එම කාලයේ දී පොලිසිය තුළ තිබුණේය. එම මතවාදය නම් කිසිම කෙනෙක් ඔහුට විරුද්ධව ඇති චෝදනාවක් ගැන ඇත්ත කියන්නේ නැත. ඒ නිසා එවැනි ප්‍රශ්න කිරීමක් කිරීම නිශ්ඵල කාර්යයකි. ප්‍රශ්න කිරීම කළ යුත්තේ වධහිංසා කිරීමත් සමඟ ය.**

එවිට ඔහු සමහර වෙලාවට වධහිංසාවට ඇති භය නිසා ඇත්ත ප්‍රකාශ කරනු ඇත. මෙය වනාහී ම්ලේච්ඡ මතවාදයකි. අපරාධ පරීක්ෂණයක් යනු විද්‍යාත්මක පරීක්ෂණයකි. සෑම විද්‍යාත්මක පරීක්ෂණයක්

වෛද්‍යවරයෙක් ලෙඩක් සොයා ගැනීම සඳහා කරන පරීක්ෂණයක්, දහසකුත් ප්‍රශ්න සම්බන්ධයෙන් විවිධ විද්‍යාඥයන් විවිධ ක්ෂේත්‍රයන් තුළ කරනු ලබන පරීක්ෂණ හා අපරාධ පරීක්ෂණ අතර වෙනසක් නැත. එය දත්ත මත එනම් සැබෑ ඔප්පු කරන ලද කරුණු මත පමනක් පදනම් වෙන විධික්‍රමයකි. එම විධික්‍රමය අභ්‍යන්තර ගත කර ඇති කිසිම පුද්ගලයෙකු මෙවැනි මතවාදයක් පිළිගන්නේ නැතුවා පමණක් නොව එය පිළිකුලෙන්ද බැහැර කරනු ඇත. එවැනි පිළිකුල් සහගත මතවාදයක් පොලිස් විධික්‍රමය තුළ ගැබ් වීමට තරම් පසුගාමීත්වයකට ඉඩ දුන්නේ කවුද? එවැනි මතවාද දුරුකිරීමට උත්සාහ ගෙන තිබුණේ නැත්තේ ඇයි? අපරාධ පරීක්ෂණය විද්‍යාත්මක පදනමක සිට පමණක් කළ හැකි ය යන පදනම අපරාධ පරීක්ෂණ කරන සියල්ලන්ගේ ම ඔලුවට වැටෙන තත්වයක් නිර්මාණය කිරීමට උත්සාහයක් ගෙන නොමැත්තේ ඇයි? ඒ පිළිබඳව සොයන විට පොලිසියේ සියලු නිලධාරීන් ද අදාළ රාජ්‍ය සංස්ථාවල සියලු නිලධාරීන් ද මෙවැනි මතවාද පොලිසිය තුළ තිබීම සම්බන්ධයෙන් වගකිවයුතු සේ පෙනේ. මේ අනුව මෙම බේදවාචකයේත් ඒ හා සමාන වෙනත් බේදවාචකවලටත් වැරදි කරුවන් අතරට ඔවුන්ද එකතු කළ යුතුව ඇත.

ඉහත කී පියවර දෙක ගත්තා නම් ජෙරාඩ් පෙරේරා මහතාට විරුද්ධව ඉතාමත් දරුණු ආකාරයේ පහරදීමක් සිදු කීරීම මුළුමනින්ම වළක්වා ගත හැකිව තිබුණි. එම පහරදීම කොතරම් බරපතල වූවාද කිවහොත් ඔහුගේ වකුගඩු ක්‍රියාත්මක වීම පවා අවසානය වන විට කඩා වැටුණේය. දින ගණනාවක් සිහිකල්පනාවක් නැතිව රෝහල් ගතව සිටීමට ඔහුට සිදුවිය. දෛවයේ කිසියම් වාසනාවක් නිසා ඔහුට එම අවස්ථාවේදී දිවි ගලවා ගත හැකිවිය.

මේ පිළිබඳව කටයුතු කළ සියලුම වෛද්‍යවරුන් කළ ඉමහත් සේවය මතක් කළ යුතුය. මහා බේදවාචක මැද පවා මනුෂ්‍යත්වය රැක ගෙන වෘත්තීය සම්ප්‍රදායනට අනුව තමන් අතින් කෙරෙන්නට තිබෙන යුතුකම කරන්නන් සමාජය තුළ තවමත් ඉතිරිව පැවතීම කිසියම් සාධනීය ලක්ෂණයකි.

මෙම සිද්ධිය සිදු වූවාට පසු ඒ තුළින් තවත් සිද්ධීන් පැනනැගීම වළක්වා ගන්නට ද ඉඩකඩ පැවතුනි. වධහිංසාව පිළිබඳව නිසියාකාර පරීක්ෂණයක් ක්ෂණිකවම පැවැත්වීමට පොලිස්පතිවරයාත් වෙනත්

ඉහළ නිළධාරීනුත් කටයුතු කළා නම් ඉතා පැහැදිලිව ම බරපතල අපරාධයක් සිදු වී ඇති බව තහවුරු කර ගන්නට ඉඩ තිබුණි. එසේ නම් ඒ පිළිබඳව ගත යුතු නීත්‍යානුකූල ක්‍රියාමාර්ගද එමෙන්ම වින්දිතයා වෙනුවෙන් කෙරෙන්නට තිබූ යුතුකම් ද කිරීමේ හැකියාව ඔවුන්ට පැවතියේය. එහෙත් අභාග්‍යකට මෙන් සිදු වූයේ සිදු වූ සිදුවීම යටපත් කිරීමට හා එය යටපත් කිරීමට කරන ලද ප්‍රයත්න මිස ඇත්ත තත්වය දැන ගැනීමටවත් ඒ උඩ ක්‍රියාත්මක වීමවත් නොවේ.

**මෙම වධහිංසාවෙන් පසු අවුරුදු 17ට ආසන්න කාලයක් ගත වී තිබුනත් මේ වනතුරුත් ලංකාවේ පොලිසිය හා එහි ඉහළ නිළධාරීන් මේ සිද්ධිය පිළිබඳ කිසියම්ම හෝ පිළිගත හැකි පරීක්ෂණයක් පවත්වා නැත.**

මෙවැනි පරීක්ෂණයක් පැවැත්වුනා නම් මෙවැනි අපරාධයක් සිදුවී ඇති බව දකින්නට නොහැකි වන්නේ අන්ධයෙකුට පමණි. පොලිසිය අභ්‍යන්තරයේ සිදුවන වැරදි සම්බන්ධයෙන් අන්ධ ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම ඉහළ සිට පහළට සිදු වී ඇති සිද්ධියකි. මෙය පොලිසියේ හෝ මහජනතාවගේ සුබසිද්ධියට ගැලපෙන ක්‍රියාමාර්ගයක් නොවේ. මෙහිදී අප දකින්නේ අමුතු ම්ලේච්ඡ මතවාදයක් පොලිසිය ඇතුලේ මුල් බැස ගෙන තිබෙන බවය. එම මතවාදය නම් තමන්ගෙන් සිදුවන වැරදි වසා ගැනීමටත් ඒවා පිළිබඳව ඇත්ත නොකියා සිටීමටත් අධිකරණවලට පවා ඒ පිළබඳව බොරු කීමටත් සැදුම්ලත් මානසික තත්වයක් පවතින බව ය. මෙය ද නැති කිරීම කෙරෙහි කිසියම්ම ප්‍රයත්නයක් දරා නැති බව ඉතා පැහැදිළි ය. මාර්ක් ප්‍රනාන්දු ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරුතුමා විසින් ප්‍රකාශ කළේ පොලිස්පතිවරයා මෙවැනි සිද්ධීන් ඇතිවීම වැළැක්වීම සඳහා පියවර ගත යුතුව තිබෙන බව ය. එසේ කරන ලෙස නිර්දේශයක් ද කරන ලදි. එම නිර්දේශයට කිසියම්ම හෝ ඇහුම්කන්දීමක් මේ දක්වාත් සිදු වී නැත.

**මෙම සිද්ධිය ගැන වහාම හා අව්‍යාජව පොලිසිය ක්‍රියා කළා නම් එයින් පසු වින්දිතයා මරා දැමීමට තත්ත්වයක් උදා නොවන්නට ඉඩ තිබුණි.**

වින්දිතයා ආරක්ෂා කිරීමට පොලිසිය බැඳී සිටී. එය රජය වෙනුවෙන් කෙරෙන බැඳීමකි. වින්දිතයාට ආරක්ෂාවක් නොදෙන තත්වයක් තුළ අධිකරණ ක්‍රමයකට පැවතිය නොහැකි ය. වින්දිතයා වධහිංසාවකට භාජනය වූවෙක් මෙන් ම වෙනත් අපරාධයකට භාජනය වූවෙක් විය

හැකි ය. ස්ත්‍රී දූෂණයකට, ලිංගික ප්‍රහාරයකට, දරුවන් ලිංගික වශයෙන් අනතුරට භාජන කිරීමකට හෝ මිනීමැරීම හා බලයෙන් අතුරුදහන් කිරීම වැනි බලවත් වැරදි සියල්ල සම්බන්ධයෙන් පවතින මූලික සම්ප්‍රදාය නම් එවන් දෙයක් ගැන පැමිණිල්ලක් කරන පැමිණිලිකරු නීත්‍යානුකූලව ආරක්ෂා කිරීමේ යුතුකමක් හා වගකීමක් රජයට පැවරෙන බවත් එම වගකීම පොලිසිය තුළින් ක්‍රියාත්මක විය යුතු බවත් ය. එහෙත් මෙවැනි මූලික නීතිමය සිද්ධාන්තයක් නොසලකා හැරීම ලංකාව තුළ සිදුවෙන තත්වයක් නිර්මාණය වී තිබුණේ කෙසේ ද? වධහිංසාවට භාජනය වී ඉන්පසු ඒ ගැන අධිකරණයට සාක්ෂි දීමට යෑමට නියමිතව සිටි පුද්ගලයා මරා දමන තත්වයක් ඇති වනු තුරුත් ඔහුට ආරක්ෂාවක් සලසා දීමට අපොහොසත් වූයේ ඇයි? ඒ පිළිබඳව වරද පොලිසියවත් රජයවත් විවෘතව පිළිගෙන නොමැත්තේ ඇයි? මේ පිටුපස ද ඇත්තේ පොලිසිය ක්‍රියාකරන ආකාරය පිළිබඳව කිසියම් නුසුදුසු මතවාදයක් පොලිසිය තුළම පවතින බව ය. ඔවුන්ට විරුද්ධව පැමිණිලි කරන්නන් විනාශ කර දැමීමට සුදුසු යැයි යන මතවාදය නිසා විපතට පත් කී දෙනෙකු සිටී ද? බියට පත් කී දෙනෙකු සිටී ද? එහෙත් මෙම මතවාදය අපරාධ නීතියට මුළුමනින්ම පටහැනි වූ මතවාදයකි. අපරාධ නීතියක් ක්‍රියාත්මක කරවා ගත හැක්කේ වින්දිතයන් සාක්ෂිකරුවන් හා වෙනත් විපතට පත්විය හැකි පුද්ගලයන් ආරක්ෂාව පිළිබඳව බැඳීමක් ඇති වන තාක් තුරුපමනි.

මේ සියල්ලෙන්ම පෙනී යන්නේ මෙම සිදුවීම් දෙකම වළක්වා ගත හැකිව තිබූ සිදුවීම් බව ය. **නීතිපතිවරයා ගන්නා ක්‍රියාමාර්ගය ඔහු මුලින්ම ගත්තා නම් මෙම ඛේදවාචකය වළක්වා ගැනීමට ඉඩ තිබුණි.** දෙවැන්න ඔහු යම් අවධියකදී මෙම පොලිස් නිළධාරීන්ට විරුද්ධව නඩු පැවරීමේ තීන්දුවක් ගත්තා නම් එයත් සමඟම වින්දිතයා ආරක්ෂා කිරීමට පියවර ගත්තා නම් මෙම ඛේදවාචකයන් සිදු නොවීමට බොහෝ දුරට ඉඩ තිබුණි.

මේ අනුව මෙම සිද්ධිය බොහෝ දෙනෙකුගේ නොසැලකිල්ල හෝ කෙළින්ම සහභාගිත්වය තුළ සිදුවුණු සිද්ධීන් මාලාවක් බව ඉතා පැහැදිළිව පෙනී යයි. මේ සියල්ල දෙස බලන විට යම් මූලික දර්ශනවාදී ප්‍රශ්නයන් පැනනගී. **පොලිසිය තුළ ක්‍රියාත්මක වන්නේ කුමන දර්ශනවාදයක් ද?** එය නීතිය මත පදනම් වී ශිෂ්ඨාචාරය රැකීම

සඳහා කැපවුනු දර්ශනයක් ද? එය ලෝකය පුරාම ශතවර්ෂ ගණනාවක් තිස්සේ වර්ධනය වුනු අපරාධ පරීක්ෂණ පැවැත්වීම සහ අපරාධ වැළැක්වීම සඳහා ගත යුතු පියවර ගැනීම පිළිබඳව පදනම් වූ දර්ශනවාදයක් ද? එසේත් නැත්නම් ලංකාවේ පොලිසිය තුළම වර්ධනය කර ගත් කිසියම් ම්ලේච්ඡ මතවාදයක් ද? මෙය ලාංකීය සමාජය විසින්ම සලකා බැලිය යුතු ප්‍රශ්නයකි.

සමාජය රැකෙන්නේ සමාජයේ පවතින ප්‍රබල සංස්ථාවන්ගේ ක්‍රියාකාරිත්වය යටතේ ය. සමාජයේ පවතින ප්‍රබල සංවිධාන ඒවාට අදාල නීතියටත් එමෙන්ම එම නීතිය පිටුපස පවතින ශිෂ්ඨසම්පන්න දර්ශන වාදයටත් යටත් නැත්නම් ඉන් අනතුරට පත් වන්නේ රටවැසියන් මෙන්ම සකල සමාජයයි. **ශිෂ්ඨ සමාජයක් හා ම්ලේච්ඡ පොලිස් ක්‍රමයක් පැවතිය නොහැකි ය.** ශිෂ්ඨ සමාජයක් හා ම්ලේච්ඡ මතවාදයන් තුළින් පරිපාලනය කරන සංස්ථාවන් එකට පැවතිය නොහැකිය. මේ නිසා සැලකිය යුතු ප්‍රධාන ප්‍රශ්නය නම් අපගේ බලවත් සංස්ථා අතරට වැටෙන පොලිසිය තුළද පවතින්නේ කුමන වර්ගයක හෘදය සාක්ෂියක්ද යන්න ය.

## සමාජයීය හෘදය සාක්ෂිය (Social Consience)

ශිෂ්ඨාචාරය යනු යම් රටක ජීවත් වන පුද්ගලයන් මෙන්ම එම රටේ පාලනයට සම්බන්ධ වන ප්‍රබල සංස්ථාවන්හි නිළධාරීන් තුළ පවතින පොදු හෘදය සාක්ෂිය යන්නයි. හෘදය සාක්ෂිය යනු හොඳ නරක පිළිබඳව කළු සුදු මෙන් වෙන් කර ගත් වෙනසක් හඳුනා ගැනීමත්, හොඳ යැයි සිතන දේ සෑම ආකාරයකින් ම ප්‍රගුන කිරීමත්, වැරදි යැයි සිතන දේ පිළිකුල් සහගතව සලකා බැහැර කිරීමත් එක් එක් පුද්ගලයාගේ සිත් තුළම කළ යුතු බව ය. ජෙරාඩ් පෙරේරා මහතාට සිදු වූ වැරදි සම්බන්ධයෙන් මොනයම් ආකාරයක හෘදය සාක්ෂියක් වුවත් පොලිසිය තුළින් හෝ රජයක් තුළින් ප්‍රකාශයට පත් වුනා ද?

එම හෘදය සාක්ෂිය ප්‍රකාශයට පත්වීම අපට දැකිය හැක්කේ ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරු විසින් මෙම මානව හිමිකම් නඩුව පැවති අවස්ථාවේ දී ඒ පිළිබඳව ගන්නා ලද ස්ථාවරය තුළ ය. මාර්ක් ප්‍රනාන්දු නමැති ශ්‍රේෂ්ඨාකධිරණ විනිසුරුවරයා මෙහිදී ප්‍රදර්ශනය කළේ සමාජ හෘදය සාක්ෂිය යන්නෙහි ඇති අර්ථය යි. ඔහු මෙම ක්‍රියාව තදින් හෙළා

දැක ඒ පිළිබඳව ප්‍රකාශයක් කළා පමණක් නොව ඊට අදාළ වූ සියලුම කරුණු ඔහුගේ නඩු තීන්දුව මගින් ප්‍රකාශයට පත් කොට එතෙක් මෙවැනි නඩුවක දී ලබා දුන් වැඩිම වන්දි ගෙවීමද කිරීමට නියම කරන ලදි. මෙය එම අවස්ථාවේදී ශ්‍රේෂ්ඨාධිකරණය විසින් සමාජයීය හෘදයසාක්ෂිය කුමක්ද යන්න ප්‍රදර්ශනය කිරීමක් විය. එවැනි ප්‍රදර්ශනය කිරීමක් මෙවැනි සෑම සිද්ධියක් සම්බන්ධයෙන් ම කෙරෙන්නේ නම් අදාළ වැරදි හදා ගැනීම සඳහා විශාල බල කිරීමක් අදාළ සංස්ථාවන් තුළ සිදුවනවාට නොඅනුමාන ය. අධිකරණය වනාහී සමාජයක හෘදය සාක්ෂිය දැඩිව ප්‍රකාශයට පත් කරන අවසාන සංස්ථාවය. මෙය කොතෙක් දුරට නිරන්තරවම සිදු වේද යන ප්‍රශ්නය අධිකරණයේම සැලකිල්ලට භාජනය විය යුතු ය.

මෙම සමාජයීය හෘදය සාක්ෂිය අධිකරණයෙන් පිළිබිඹු වීමට විරුද්ධව බලපාන ප්‍රධානම සාධකය නම් ලංකාවේ පවතින නඩු පමාවය. එය ලාංකීය සමාජීය හෘදය සාක්ෂියක් ගොඩනැගීමට ඇති ප්‍රධානම බාධකයක් බවට පත්වී ඇත. වරදට දඬුවම ඉතා කෙටි කාලයක් ඇතුළතම කෙරෙන්නේ නම් එම දඬුවම විශාල දඬුවමක්ද අඩු දඬුවමක්ද යන ප්‍රශ්න එතරම් වැදගත් වන්නේ නැත. වැරදි වළක්වා ගැනීමට පෙළඹීම සිද්ධ වන්නේ අනිවාර්යෙන්ම වරදක් කළහොත් එයට කෙටි කාලයක් ඇතුළත නිසි දඬුවමක් ලැබෙනවාය යන මතවාදය රටක් තුළ ගැඹුරින් පැළපදියම් වී පැවතුනොත් පමණි. එවැනි සමාජයන් තුළ නීතිය කැඩීම පිළිබඳව දැඩි බියක් පවතී. එම බිය පැවතිය යුත්තේ මහජනතාව තුළ පමණක් නොවේ. නීතිය ක්‍රියාත්මක කරන සංස්ථා තුළද එම බිය පැවතිය යුතු ය. පොලිස් පරීක්ෂණයක් කරන නිළධාරියෙකු තුළ නිතරම පැවතිය යුතු බිය නම් මා මෙහි වරදක් කළහොත් මටද දඬුවම් ලැබිය හැකිය යන්න ය. හෘදය සාක්ෂිය දඬුවම් පිළිබඳ ප්‍රශ්නයක් පමනක් නොවේ. එය පුද්ගලයෙකුට ඔහුගේ සිත තුළින්ම ඔහුට හොඳ කීම හෝ වැරදි බව පෙන්වා දොස් කීම යන කරුණු අනුව සිදු වන්නකි.

යමෙක් යම් වරදක් කළ විට ඔහුගේ අභ්‍යන්තරයෙන් ඔහුට කියනවා නම් මේ කළේ බරපතල වරදක් කියා ඔහු තමාගේම සිත සංසිඳවා ගැනීම සඳහා ඒ පිළිබඳව ඉක්මනින් වරද පිළිගෙන අනිත් අතින් එම වරද නිසා සිදු වුනු යම් ප්‍රතිඵල තිබේ නම් ඒවා නිවැරදි කිරීමට

උත්සාහයක යෙදේ. එමෙනම එවැනි ක්‍රියාවක් නැවත නොකිරීමට ද ඔහු සිතා ගනී. මන්ද යත් එසේ කළහොත් ඔහුගේ සිත ඔහුට වද දෙන බැවිනි. මෙය සියලුම අංශවල නීතිපති දෙපාර්තමේන්තුව, අධිකරණය හා දේශපාලන ක්ෂේත්‍රය ආදී සියල්ල කෙරෙහි බලපැවැත්විය යුතු ක්‍රියාවකි. වැරද්දක් කොට එය ජයග්‍රහණය කිරීමේ මතවාදයක් තිබේ නම් එම සමාජය තුළ කිසියම් බරපතල වරදක් පවතී. කිසියම් ම්ලේච්ඡත්වයක් පවතී. මේ නිසා සමාජීය හෘදය සාක්ෂිය පිළිබඳව ගැටලුව සිවිල් සමාජයේ සාකච්ඡාවට භාජනය විය යුතුම කරුණකි.

ජෙරාඩ් පෙරේරාට අදාළ සිද්ධිය සිදු වූ වහාම එම ප්‍රදේශවාසීන්, නීතිඥවරුන් හා මේ පිළිබඳව දැනගත් සියල්ලන් විශේෂ මැදිහත්වීමක් කළා නම් ඒ තුළින් සමාජීය හෘදය සාක්ෂිය හා පොලිසිය තුළ ඇති හෘදය සාක්ෂිය හා ගැටෙන්නට පටන් ගනී. එහෙත් කී දෙනෙක් මේ ප්‍රශ්නය පිළිබඳව ගැඹුරු කැක්කුමකින් වේදනාවකින් ඉදිරිපත් වී කටයුතු කළා ද? එසේ කටයුතු කළ සමහරුන් සිටීම ඇත්තෙන්ම සතුටට කරුණකි. ජෙරාඩ් පෙරේරාගේ මිනිමැරීම සම්බන්ධයෙන් පැවති පෙළපාලියට විශාල පිරිසක් සහභාගි විය. ප්‍රදේශය තුළ කිසියම් කම්පනයක් බොහෝ කාලයක් තුළ පැවතුනි. එහෙත් ඒවා ක්‍රියාවට භාජනය කරමින් තමන්ගේ සහභාගිත්වය රටේ හොඳ නරක පිළිබඳ අවබෝධය දියුණු කිරීම පිළිබඳ ප්‍රයත්නයක් අපට දැක ගත නොහැකි විය.

සමාජයීය හෘදය සාක්ෂය හා සමාජය තුළ එකිනෙකා අතර අන්‍යෝන්‍ය සහභාගිත්වය තුළින් සියලු දෙනාගේම ප්‍රගතිය උදාකර ගැනීම තුළ පමනක් සංවිධානාත්මක රාජ්‍යයකට පැවතිය හැකිය. සංවිධානාත්මක රාජ්‍යයක් යනු එහි සංස්ථාවන් තුළින් සමාජයීය හෘදය සාක්ෂිය පිළිබිඹු කර ගැනීමට හා එළිදරව් කර ගැනීමට හැකි තත්වයක් ඇති ස්ථානයකි. ලංකාව එවැනි ස්ථානයක් ද? මෙය මේ අවස්ථාවේ දී බැරෑරුම්ව සලකා බැලීම තුළින් සිදුවූ බේදවාචකයන්ගෙන් යම් පාඩමක් ඉගෙන ගැනීමට සමාජයට හැකි වනු ඇත.

## යුක්තියෙන් දික්කසාද වුනු නීති ක්‍රියාදාමයක්

**නීතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාදාමය පැවතිය යුතු වන්නේ යුක්තිය ඉටු කිරීම සඳහා ය. එහෙත් විශේෂයෙන්ම ඒකාධිපතිවාදය හෝ පසුගාමීත්වය පවතින රටවල යම් නීති ක්‍රියාදාමයක් මතුපිටින් පෙන්වන්නට හැකි වුවත් ඇත්තෙන්ම එම ක්‍රියාදාමය කටයුතු කරන්නේ යුක්තිය පිළිබඳව පදනම් වන මූලධර්මයන් මත නොවේ. එවැනි නෛතික ක්‍රියාදාමයන් යුක්තියෙන් දික්කසාද වුන ඒවා ලෙස සැලකිය හැකි ය. යුක්තිය යනුවෙන් අදහස් වන්නේ සාධාරණත්වයයි. සාධාරණත්වය යනුවෙන් සිංහලට පරිවර්තනය වන්නේ (fairness) යන අර්ථයයි. fairness යනුවෙන් අදහස් කරන්නේ යම් නීති කර්තව්‍යයකට සහභාගි වන සියලු දෙනාටම සාධාරණව පවත්වා ගෙන ගොස් එහි නිගමන ද එම ප්‍රතිපත්තිය මතම සිදු කිරීම ය. සාධාරණත්වය නොපවතින නීති කර්තව්‍යයක් ඉටු කරන්නේ එයින් ඉටු විය යුතු කාර්යය නොව බොහෝ දුරට මර්දනකාරී පිළිවෙතක් හෝ එසේත් නැත්නම් බොරුවකි.**

අපරාධ නීතිය තුළ හෝ සිවිල් නීතිය තුළ කිසියම් පාර්ශවයන් දෙකක් තමන්ගේ ආරවුල නීති කෘතියකට භාජන කරන්නේ අවසානයේදී ලැබෙන නිගමනය තමන් බලාපොරොත්තු වන සාධාරණත්වය මත ප්‍රකාශයට පත් වනවාය යන විශ්වාසය මත ය. අධිකරණ ක්‍රියාවලියකින් තොරව තමන්ටමද තමන්ගේ ආරවුල් විසඳා ගන්නා ක්‍රම තිබේ. එම ක්‍රම අවසාන වශයෙන් කරන්නේ ප්‍රචණ්ඩත්වය මත පදනම් වී ආරවුල් බලවතාගේ වුවමනාවට අනුව විසඳීම ය. නෛතික ක්‍රියාදාමයක් තුළ බලාපොරොත්තු වන්නේ කාගේවත් බලය පිළිබඳව බලපෑමකින් තොරව මූලික නෛතික ප්‍රතිපත්ති මත පමණක් පදනම් වී ආරවුල් සාධාරණව විසඳා ගැනීම ය.

**බලය හා යුක්තිය වෙන් කිරීමට නම් යුක්තිය ඉටු කරන කිසියම්ම හෝ නිළධාරියෙකුට ඔහුගේ ක්‍රියා වලට බාධා කිරීම බරපතල වරදක් සේ සැලකිය යුතු වෙයි. මෙසේ බලපෑම් කිරීම විවිධාකාරවලින් සිදුවිය හැකි ය. එය මුලින්ම සිදුවිය හැකි වන්නේ දේශපාලන බලකිරීම් තුළිනි. අහවලාව අත්අඩංගුවට ගැනීමට හෝ අත්අඩංගුවට ගත් අයෙකු මුදා හැරීමට හෝ පරීක්ෂණයක් පැවැත්වීමට බාධා කිරීමෙන් හෝ එම**

**පරීක්ෂණයේදී ගත යුතු නිගමන පිටින් ඉදිරිපත් කිරීම මගින් හෝ එවැනි යුක්තිය පිළිබඳ සහභාගි වන නිළධාරියෙකුට පගා දීමෙන් හෝ පගා ගැනීමෙන් හෝ විවිධ බලපෑම් උඩ නඩු පැවරීමට ලක් විය යුත්තන්ට නඩු නොපවරන තත්ත්වයක් ඇති කිරීමෙන් හෝ ආදී වශයෙන් යුක්තිය පසිඳලීම නතර කිරීමට හෝ අඩපන කිරීමට දරන සෑම ප්‍රයත්නයක්ම බරපතල අපරාධයක් කොට සලකා ඊට දඬුවම් කළ යුතුය. එසේ දඬුවම් කිරීමට නොහැකි නම් එම නීති කර්තව්‍ය කෙරෙන්නේ නීති කර්තව්‍ය හා යුක්තිය එකිනෙකින් දික්කසාද වූ තත්වයක් තුළය. යුක්තිය පිළිබඳ මූලධර්මයන් මත ගැනෙන නිගමන නොව ඊට හාත්පසින්ම වෙනස් කරුණු මත නීති කෘත්‍යයක මුල සිට අග දක්වා එකිනෙක බලපෑම් පවතියි නම් එවිට සිදු වන්නේ ඇත්තෙන්ම යුක්තියට පයින් ගසා අයින් කිරීම ය.**

## ජෙරාඩ් පෙරේරා පිළිබඳ නඩුව අවුරුදු 17ක පමණ කාලයක් තිස්සේ ඇදී ගියේ ඇයි?

එහිදී නඩු පැවරිය යුතු ප්‍රබල පුද්ගලයන් එනම් මෙම පහරදීම හා මිනීමැරීම සිදු කළ පොලිස් නිළධාරීන් මෙහෙයවූ සහකාර පොලිස් අධිකාරී වරයා හෝ වත්තල පොලිසියේ එකල සිටි ස්ථානාධිපතිවරයා මෙම නඩුවල දී චෝදනා නොලැබුවේ ඇයි? එය සාධාරණය කිරීමට හේතුන් පවතිනවා ද?

මෙම සිද්ධිය පිළිබඳ නිසියාකාර පරීක්ෂණයක් කෙටි කාලයක් තුළ පවත්වා සිදු වූ වරදට නිවැරදි කර එම වරද කළ පුද්ගලයන්ට දඬුවම් දීම මගින් එම ක්‍රියාකලාපය තවදුරටත් ඉදිරියට ගෙන යාමට ඉඩ නොදෙන තත්වයක් පොලිස්පතිවරයා හා ඉහළ පොලිස් නිළධාරීන් අතින් සිදු වූයේ කෙසේ ද? එයින් පෙනෙන්නේ යුක්තියෙන් දික්කසාද වුණු නීති ක්‍රමයක් ක්‍රියාකරන ආකාරයයි.

**නීති කෘතියක් පැවතිය යුත්තේ අවසාන වශයෙන් යුක්තිය ඉටු කරලීමට ය. බොහෝ කාලයක් ගොස් යම් තීරණයකට එළඹීම වනාහි යුක්තිය මුළුමනින්ම අමතක කර දැමීමකි. මුලින් පහර දෙනු ලැබූ පුද්ගලයා මරා දැමීමට මුල් වරද කළ පුද්ගලයන්ටම හැකිනම් මේ ක්‍රමය තුළ පවතින යුක්තිය හා සාධාරණය කුමක් ද? අවුරුදු ගණන් නඩු කීම**

**තුළින් ඇති වන වියදම් දරා ගැනීමට තමන්ගේ හිතවතෙකු හා ස්වාමිපුරුෂයෙකු නැති වුණු පවුලකට අවුරුදු 17ක කාලයක් තිස්සේ කළ හැකි වැඩක් ද? මෙසේ නඩු පමා කිරීම වින්දිතයන් නිරායුධ කිරීමක් නොවේ ද? නීති ක්‍රමයම කිසියම් වංචාවක යෙදීමක් මෙහි දී සිදුවන්නේ නැද්ද?**

මේ සියලුම කරුණු යුක්තිය පිළිබඳව නෛතික මූලධර්ම හා බැඳී ඇති ඉතා වැදගත් කරුණුය. අවසාන වශයෙන් නඩුවක් ගැන ඇසිය යුතු වන්නේ නඩුව කවුරුන් දිනුවා ද පැරදුනා ද යන්න නොවේ. ඇසිය යුතු ප්‍රශ්නය වන්නේ එම නඩුව තුළ යුක්තිය සිදු වුණාද නැද්ද යන්න ය. යුක්තිය යනු හුදු මනඃකල්පිත දෙයක් නොවේ. එය ඉතාමත්ම ප්‍රායෝගික දෙයකි. යුද්ධය ඉටු වීම මගින් වරදකට භාජනය වූ පුද්ගලයාගේ ආරක්ෂාව, ඔහුට සිදු වූ හානියට වගකිව යුත්තන්ට දඬුවම් කිරීම මෙන්ම එම හානියට රජය විසින් වන්දි ගෙවීම හා එම ගැටීම තවදුරටත් පවත්වා ගෙන යාමට ඉඩ නොදී අදාළ පුද්ගලයන් ආරක්ෂා කිරීම ආදී සියල්ල සමගම බැඳේ. එසේ නොකර අවුරුදු 17ට පසු යම් නඩු තීන්දුවක් ප්‍රකාශ කළ පලියට එයින් සිදු වූ අපරාධ නිසා ඇති වුනු විපත්ති වළක්වා ලීමට නොහැකි ය.

**යුක්තිය ක්‍රියාත්මක කිරීමට බාධා කිරීම කොපමණ බරපතල වරදක් සේ සැලකෙන්නේ ද යත් ඇමෙරිකාවේ බලවත් ජනාධිපතිවරයෙකුව සිටි රිචඩ් නික්සන් මහතාට ජනාධිපතිධුරයෙන් ඉල්ලා අස්වීමට සිදු වූයේ යුක්තිය පසඳිලීම සම්බන්ධයෙන් ඔහු බලපෑම් කළා යැයි එළිදරව් වූ නිසා ය.**

පැවතිය හැකි සාක්ෂි විනාශ වන සේ සමහර ටේප් පටි විනාශ කර දැමීමත්, සාක්ෂි කරුවනට බිය ඇති වන සේ විවිධාකාර තර්ජන කිරීමත් යුක්තියේ ක්‍රියාදාමය නිසි ලෙස පවත්වාගෙන ස්වාධීන නිගමනයක් කරා යෑමට ඔහුගෙන් බාධා පැමිණුන බව ඔප්පු වීමත් සමගම ඔහු දෝශාභියෝගයකට මුහුණ දීය යුතුය යන්න ඇමෙරිකානු නීතිය තුළ තහවුරු විය. මේ අවස්ථාවේ නික්සන් හිරේ යාමෙන් වැළකුනේ වාහම තම නිළයෙන් ඉවත්වීම සමඟ ය. දැනට බලයේ සිටින ජනාධිපතිවරයාට විරුද්ධවත් එවැනිම චෝදනාවක් ඇත. ඒ පිළිබඳව බරපතල පරීක්ෂණ පැවැත්වෙමින් යයි. ඒ පිළිබඳව ඔහු

යුක්තිය ඉටු කිරීම සඳහා වූ ක්‍රියාදාමයට බාධා පමුණුවා ඇතැයි යන්න ඔප්පු වුවහොත් ඔහුට ද සිදුවන්නේ රිචඩ් නික්සන් ට සිදු වූ දෙයමය.

එහෙත් යුක්තිය ඉටු කිරීමට බාධා පැමිණවීම පිළිබඳව මහා පරිමානව දොස් කියන තතත්වයක් ලංකාව පුරා පවතින නමුත් යුක්තිය පසිඳලීමට බාධා කිරීමේ අපරාධය මත පවරන ලද නඩු ඇතොත් එය ඉතා සුළු ප්‍රමාණයක් පමණකි. යුක්තිය පසිඳලීමේ ක්‍රියාදාමයට බාධා කිරීමට බොහෝ ආකාරවලින් බලපෑම් යෙදෙන නමුත් එසේ බලපෑම් කිරීමම පදනම් කොට අපරාධ පරීක්ෂණයකට ලක් කොට ඔවුන්ට දඬුවම් කිරීමක් සිදු නොවේ. මේ අනුව මහා අපරාධ ගැන පවා බොහෝ විට සිදු වන්නේ දේශපාලන හරඹයන් මිස යුක්තිය හා නීතිය පිළිබඳව කෙරෙන ක්‍රියාදාමයන් නොවේ.

මේ නිසා යුක්තියත් නීතිය ක්‍රියාත්මක වන ආකාරයත් අතර විශාල දික්කසාදයක් ලංකාවේ පවතිනවාය යන්න අද කාටවත් රහසක් නොවේ. එම තත්වය වෙනස් කර ගැනීමට තරම් හැකියාවක් ලාංකික ජනතාවට තිබේද නැද්ද යන්න මත ලංකාවේ යුක්තියේ අනාගතය රැඳී ඇත.

නීතිඥ බැසිල් ප්‍රනාන්දු
28.07.2019

# නීතිය ඉදිරියට ගිය වින්දිතයෙකුගේ ඉරණම....

2002 වසරේ දී ජෙයරාජ් නමැත්තෙකු ත්‍රිපුද්ගල මනුෂ්‍ය ඝාතනයක් සිදු කළ බවට වත්තල පොලිසියට තොරතුරක් ලැබුණි. මෙම තොරතුර මත හඹා ගිය වත්තල පොලිසිය අත්වැරදීමකින් අත්අඩංගුවට ගෙන තිබුණේ වත්තල, මාකේවිට ප්‍රදේශයේ ජීවත් වූ කොළඹ නැව් තටාකාංගන අංශයේ අරක්කැමියෙකු ලෙස සේවය කළ ජෙරාඩ් මර්වින් පෙරේරා නම් තැනැත්තෙකුය.

වත්තල පොලිසිය විසින් ජෙරාඩ් මර්වින් අත්අඩංගුවට ගැනීමෙන් අනතුරුව ඔහුව ඉතාම දරුණු හා කෲර ලෙස වධහිංසාවට ලක් කළහ. ඔහුගේ දෑස් ආවරණය කොට, දෑත් එකට බැඳ, යට ලීයක එල්ලා යකඩ හා ලී පොලු වලින් ඔහුට පහර දුන්හ. පසුව ඔහුව පොළව මත මුනින් අතට පෙරළා ඔහුගේ දෑත් දැල්වූ ගිනි කූරු මඟින් පිළිස්සූහ.[1]

කෙසේ වුවද තමන් අත්අඩංගුවට ගෙන වධ හිංසා පමුණුවා ඇත්තේ වැරදි පුද්ගලයෙකුට බව තේරුම් ගත් වත්තල පොලිසිය විසින්

---

[1] පසුව මේ සම්බන්ධයෙන් විභාග වූ ශ්‍රේෂ්ඨාධිකරණ නඩුවේදී ජෙරාඩ්ගේ තුවාල කැළැල් සම්බන්ධව අධිකරණ වෛද්‍යවරයා සාක්ෂි ලබා දී ඇත්තේ මෙසේය.

"දකුණු අතේ පිටුපස කළු පාට පැල්ලම් දෙක පත්තු කරන ලද ගිනි කූරු මඟින් පිළිස්සීම පිලිබඳ කථාවට අනුකූල වේ. දකුණු හා වම් මැණික් කටු ළඟ පැල්ලම් දෙකක් ඇති අතර එය කඹයකින් එල්ලීම ගැන සඳහනට අනුකූල වේ. වම් දණ හිසෙන් පහළ කොටසේ ඉදිරිපස ඇති දුර්වර්ණ සළකුණ යකඩ පොල්ලකින් පහර දීමට අනුකූල වේ. ගාත්‍රා දෙකේම ඉහළ කොටස දුර්වල වීම ඉහළ එල්ලීමට අනුකූල වේ. එවැනි එල්ලීමක් මඟින් ඉන්ද්‍රිය මාංස හා කංචරාවට හානි සිදු විය හැකි අතර ඉහළ බාහුවේ දුර්වල වීමක් හා හානි සිදු වීමක් විය හැකිය. මාංශපේශීන් තැලීම මඟින් සෛලවලින් අහිතකර ද්‍රව්‍ය රුධිරයට එක් වීමෙන් ඇති වන රැබ්ඩොමයෝසීස් (Rhabdomyolysis) තත්වය සිදු විය හැකි අතර ඒ මඟින් තීව්‍ර වකුගඩු අක්‍රීය වීම සිදු විය හැකිය."

පසු දින ඔහුව මුදා හැරියේය. ජෙරාඩ්ව අත්අඩංගුවෙන් මුදා හරින අවස්ථාවේ දී ඔහු ඉතාම අසාධ්‍ය තත්වයේ[2] පසු වූ අතර ඔහුගේ තත්වය දුටු ජෙරාඩ්ගේ බිරිඳ හා සොහොයුරා ඔහුව ගම්පහ ආයුර්වේද රෝහලට රැගෙන ගියහ. නමුත් එහි වෛද්‍යවරුන් විසින් ඔහුගේ තත්වය අවදානම් නිසා ඔහුව වහාම හොඳ රෝහලකට රැගෙන යන ලෙස දන්වා සිටියහ.

ඉන් අනතුරුව ජෙරාඩ් කොළඹ නවලෝක රෝහලට ඇතුළත් කළ අතර එහි දැඩි සත්කාර ඒකකයේ සති කීපයක් නේවාසිකව හිඳ ප්‍රතිකාර ගැනීමට ඔහුට සිදු විය. රෝහල්ගත වන අවස්ථාවේ ජෙරාඩ්ගේ ශරීරය පහර දීමට ලක් වීම නිසා ශරීරයේ පේශීන් තැලීමෙන් ඒවායේ අහිතකර ද්‍රව්‍ය රුධිරයට එක් වී ඔහු වකුගඩු අක්‍රීය වීමකට ලක්ව සිටියේය. තවද ජෙරාඩ්ගේ අත්වල ඇති විශාල ස්නායු දෙකෙහි සියුම් නාලිකා අක්‍රිය වීමෙන් ඔහුගේ දෙවුර මාංශපේශීන් මුළුමනින්ම බලවිරහිත වී තිබුණ අතර අත් දෙකෙහිම භාවිතය උරහිස ළඟින් අක්‍රීය වී තිබුණි. තවදුරටත් ඔහුගේ ඇඟිලි සෙළවීමට හැකි වුවත් යමක් අතින් ග්‍රහණය කර ගැනීමේ හැකියාව ද ඔහුට නොවුණි. නවලෝක රෝහලේ දැඩි සත්කාර ඒකකයේ සති කිහිපයක් සිටි ජෙරාඩ් එම රෝහලෙන් මුදා හැරිය පසුව කොළඹ ජාතික රෝහලේ ද නේවාසිකව ප්‍රතිකාර ගෙන රෝහලින් පිටව ගියේය.

---

[2] රෝහල්ගතව සිටි ජෙරාඩ්ගේ තත්වය පිළිබඳව වෛද්‍යවරයා අධිකරණය ඉදිරියේ ලබා දී ඇති සාක්ෂි මෙසේය.

"වෛද්‍යවරයා නිගමනය කර ඇත්තේ වින්දිතයාගේ ශරීරය පහර දීමට ලක් වීම නිසාත්, ශරීරයේ පේශීන් තැලීමෙන් එම පේශීන්ගෙන් අහිතකර ද්‍රව්‍ය රුධිරයට එක් වීමෙන් බොහෝ දුරට ඇති වන රැබ්ඩොමයෝසීස් (Rhabdomyolysis) තත්වය ඇති වීමත් එම නිසා වින්දිතයා තීව්‍ර වකුගඩු අක්‍රීය වීමකට (acute renal failure) ලක් වීමත් එම නිසා වකුගඩු අක්‍රීය වීම නිසා බහිශ්‍රාවීය කටයුතු කෘතිමව සිදු කිරීමටත් හීමෝඩයලිසිස් ක්‍රමය (haemodialysis) මඟින් රුධිරය පිරිසිදු කිරීමටත් සිදුව ඇති බවයි. එමෙන්ම වින්දිතයාගේ ශරීරයේ අල්නර් (ulner) සහ මීඩියන් (median) නමැති අත්වල ඇති විශාල ස්නායු දෙකේ ඇක්සෝනල් (axonal) නමැති සියුම් නාලිකා අක්‍රීය වීමක් ඇති වී ඇති බවයි. එමෙන්ම ඔහුගේ ශරීරයේ බෙල්ලේ සිට විහිද යන 8 වන ස්නායුව හා පපුව ප්‍රදේශයේ සිට විහිද යන්නා වූ 1 වන ස්නායුව ව්‍යාප්තව ඇති ප්‍රදේශවල දැනීම් ඇති වීම අක්‍රීය වී ඇති බවත්ය. SCFR Application No. 328/2002

ජෙරාඩ් රෝහල්ගතව සිටින අතරතුරම ඔහු වෙනුවෙන් නීතිඥ ඩබ්ලිව්.ආර්. සංජීව මහතා ශ්‍රේෂ්ඨාධිකරණයේ මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගොනු කළ අතර සෘජුවම මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වූ වින්දිතයා රෝහල්ගතව සිටින අවස්ථාවක ඔහු වෙනුවෙන් නීතිඥවරයෙකු මූලික අයිතිවාසිකම් පෙත්සමක් ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කළ ප්‍රථම අවස්ථාව මෙය බවට වාර්තා විය. වත්තල පොලිසියේ ස්ථානාධිපති සේන සුරවීර, පොලිස් පරීක්ෂක කෝසල නවරත්න, උප පොලිස් පරීක්ෂක සුරේෂ් ගුණසේන, උප පොලිස් පරීක්ෂක වීරසිංහ, උප පොලිස් පරීක්ෂක රේණුක, උප පොලිස් පරීක්ෂක නලින් ජයසිංහ, පොලිස් කොස්තාපල් පෙරේරා, පොලිස්පති හා නීතිපති වගඋත්තරකරුවන් ලෙස නම් කරමින් ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 11 **වගන්තිය**[3], 13(1) **වගන්තිය**[4], 13(2) **වගන්තිය**[5] උල්ලංඝනය වී ඇති බවට පවරන ලද මෙම මූලික අයිතිවාසිකම් නඩුකරයේ[6] තීන්දුව 2003/04/04 වන දින ලැබුණි.

එම මූලික අයිතිවාසිකම් පෙත්සම විභාග කළ ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු මාක් ප්‍රනාන්දු, විනිසුරු එදුසූරිය, විනිසුරු විග්නේශ්වරන් යන විනිසුරු මඩුල්ල ජෙරාඩ් මර්වින් වත්තල පොලිසියේ දී කෲර හා අමානුෂික ලෙස වධ හිංසාවට ලක් වී ඇති බවටත්, ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 11 වගන්තිය, 13(1) වගන්තිය හා 13(2) වගන්තිය යටතේ

[3] කිසිම තැනැත්තෙකු වධ හිංසාවට හෝ කෲර, අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලකට නැතහොත් දඬුවමකට යටත් නොකළ යුත්තේය.

[4] නීතියෙන් නියම කරනු ලැබූ කාර්ය පටිපාටියට අනුකූලව මිස කිසිම තැනැත්තෙකු සිරභාරයට ගැනීම නොකළ යුත්තේය. යම් තැනැත්තෙකු සිරභාරයට ගනු ලබන්නේ යම් හේතුවක් මතද ඒ හේතුව එම තැනැත්තාට දැන්විය යුතුය.

[5] අත්අඩංගුවෙහි තබා ගනු ලැබූ හෝ රඳවා තබා ගනු ලැබූ හෝ අන්‍යාකාරයකින් පෞද්ගලික නිදහස අහිමි කරනු ලැබූ හෝ සෑම තැනැත්තෙකුම නීතියෙන් නියම කරනු ලැබූ කාර්යපටිපාටිය අනුව ආසන්නතම නිසි අධිකරණයේ විනිශ්චයකාරවරයා ඉදිරියට ගෙන යා යුතු අතර, නීතියෙන් නියම කරනු ලැබූ කාර්ය පටිපාටියට අනුකූලව ඒ විනිශ්චයකාරවරයා විසින් කරනු ලැබූ ආඥාව මත සහ ආඥාව ප්‍රකාර මිස ඒ තැනැත්තා තවදුරටත් අත්අඩංගුවේ තබා ගැනීම හෝ රඳවා තබා ගැනීම හෝ ඒ තැනැත්තාගේ පෞද්ගලික නිදහස අහිමි කිරීම හෝ නොකළ යුත්තේය.

[6] S.C.(FR) Application No. 328/2002

ඔහුට හිමි කර දී ඇති  මූලික අයිතිවාසිකම් වගඋත්තරකරුවන් විසින් උල්ලංඝනය කොට ඇති බවටත් තීරණය කොට වෛද්‍ය ප්‍රතිකාර සඳහා වූ වියදම් හැර රුපියල් ලක්ෂ අටක මුදලක් වන්දි හා නඩු වියදම් ලෙස ජෙරාඩ්ට ලබා දීමට නියෝග කරන ලදී. එම වන්දි මුදල 01 වන වගඋත්තරකරු විසින් රුපියල් 70,000ක් ද, 03 වන වගඋත්තරකරු විසින් රුපියල් 40,000ක් ද, 06 වන වගඋත්තරකරු විසින් රුපියල් 20,000ක් ද, 07 වන වගඋත්තරකරු විසින් රුපියල් 20,000ක් ද, රජය විසින් රුපියල් 650,000ක් ද වශයෙනි.[7]

මෙම මූලික අයිතිවාසිකම් පෙත්සමේදී ජෙරාඩ්ට නවලෝක රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ගැනීම සඳහා වැය වූ වියදම ආපසු ගෙවන ලෙස පෙත්සම්කරු ඉල්ලා සිටියේය. නමුත් එහිදී වගඋත්තරකරුවන් වෙනුවෙන් පෙනී සිටි නීතිඥවරයා නවලෝක රෝහලේ වියදම් ඉතා වැඩි බවත්, ඔහුට රජයේ රෝහලක ප්‍රතිකාර ලබා ගැනීමට අවස්ථාව තිබියදීත් නවලෝක රෝහල තෝරා ගැනීම නිසා ප්‍රතිකාර සඳහා වැය වූ මුදල ඉල්ලා සිටීම යුක්තිසහගත නොවන බවත් ප්‍රකාශ කරමින් එම ඉල්ලීම ප්‍රතික්ෂේප කළේය. නමුත් මෙහිදී විනිසුරු මඩුල්ල කියා සිටියේ පෙත්සම්කරුගේ බිරිඳ හා සහෝදරයා ඔහුව මුල් අවස්ථාවේදීම නවලෝක රෝහල වෙත රැගෙන නොගිය බවත්, වික්‍රමාරච්චි ආයුර්වේදයට රැගෙන ගිය විට ජෙරාඩ්ගේ තත්ත්වය අවදානම් බව දුටු ආයුර්වේද වෛද්‍යවරුන් විසින් ඔහුව වහාම හොඳ රෝහලකට රැගෙන යන ලෙස දැන්වූ බැවින් ඔවුහු ජෙරාඩ්ව නවලෝක රෝහල වෙත රැගෙන ගිය බවත්ය. රජයේ රෝහල්වල ප්‍රතිකාර කෙතරම් හොඳ වුවත්, වඩාත් හොඳින් සැළකිල්ලෙන් ප්‍රතිකාර ලබා දෙන්නේ පෞද්ගලික රෝහල්වල බවට වන විශ්වාසය හා රජයේ රෝහල්වල ප්‍රතිකාර ලබා ගැනීමේදී ඇති වන ප්‍රමාදය, තදබදය, නිරන්තර වැඩවර්ජන, යන්ත්‍ර හා ඖෂධ හිඟය යන කරුණු මත බොහෝ ශ්‍රී ලාංකිකයින් පෞද්ගලික රෝහල් කරා යති. තම සැමියාගේ ජීවිතය අවදානම් තත්වයක තිබුණ මොහොතක ඔහුගේ ජීවිතය බේරා ගැනීමට ජෙරාඩ්ගේ බිරිඳ පෞද්ගලික රෝහලක් තෝරා ගැනීම

[7] නඩු තීන්දුව කියවීමට අවශ්‍ය නම් මෙම වෙබ් ලිපිනය වෙත පිවිසෙන්න http://www.alrc.net/doc/mainfile.php/cl_srilanka/199/

අතාර්කික නොවන බව ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු මඩුල්ලේ තීරණය විය. ඒ අනුව නවලෝක රෝහලේ ප්‍රතිකාර සඳහා පෙත්සම්කරුට වැය වූ වියදම ලෙස රුපියල් 704,788ක මුදලක් ද ප්‍රදානය කිරීමට ශ්‍රේෂ්ඨාධිකරණය විසින් රජයට නියෝග කරන ලදී.

මෙම තීන්දුවේ වැදගත්කම නම් මෙහිදී ආර්ථික, සමාජ හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය කෙරෙහි ද අවධානය යොමු කර තිබීමයි. මෙම සම්මුතිය අනුව සියලුම පුරවැසියන්ට "ඉහළම ප්‍රමිතියේ ශාරීරික හා මානසික සෞඛ්‍ය අත්පත් කර ගැනීමට ඇති අයිතිය"[8] පිළිගෙන ඇති අතර ජාත්‍යන්තර නීතියේ දක්වා ඇති අයිතිවාසිකමක් දේශීය නඩු තීන්දුවක් හරහා පිළිගෙන තිබීම යහපත් ප්‍රවණතාවයක් ලෙස හඳුනා ගත හැකිය.

මෙම ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවේ තවත් වැදගත්කමක් වන්නේ මෙහිදී විනිසුරු මඩුල්ල පොලිස්පතිවරයාගේ වගකීම කෙබඳු විය යුතුද යන්න පැහැදිලිව දක්වා තිබීමයි. පොලිස් නිලධාරීන් විසින් සිදු කරන විනයවිරෝධී හා නීතිවිරෝධී ක්‍රියාවන් සම්බන්ධව නිසි පරීක්ෂණ සිදු කරමින් ඔවුන් එබඳු ක්‍රියාවන් සිදු කිරීමෙන් වැලැක්වීමේ වගකීම පවතින්නේ පොලිස්පතිවරයාටය. ගරු විනිසුරු මඩුල්ල විසින් පොලිස්පතිවරයාගේ වගකීම පහත අයුරින් ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවේ දක්වා ඇත.

> **"2002-06-14 දින හෝ ඊට ආසන්න දිනක පැමිණිලිකරු 08 වන වගඋත්තරකරු වන පොලිස්පතිවරයාට පැමිණිල්ලක් ඉදිරිපත් කළ බව පෙත්සමේ ප්‍රකාශ කොට ඇත. එවැනි පැමිණිල්ලක් ලැබුණ බව ප්‍රතික්ෂේප කරමින් හෝ ඔහු විසින් ගන්නා ලද ක්‍රියාවන් විස්තර කරමින් ඔහු දිවුරුම් පෙත්සමක් ඉදිරිපත් කොට නැත. පොලිස් ස්ථාන තුළ සිදු වන වධහිංසා සහ කෲර, අමානුෂික හා අවමන්සහගත සැලකිලි පිළිබඳ ලැබෙන පැමිණිලිවල අඩුවක් පෙනෙන්නට නැත. 4(ඩී) වගන්තිය මඟින් වධහිංසාවෙන් නිදහස්**

[8] Article 12 of the International Covenant on Economic, Social and Cultural Rights recognizes the right of "everyone to the enjoyment of the highest attainable standard of physical and mental health"

**වීම ඇතුළු මූලික අයිතිවාසිකම්වලට ගරු කිරීමට, අත්පත් කර දීමට හා වැඩිදියුණු කිරීමට පවරා ඇති වගකීම ආණ්ඩුවේ සියලුම අංශයන්ට පවරා ඇති අතර පොලිසියේ ප්‍රධානියාට එම වගකීම්වලින් බැහැර කරවනු ලැබූ අයෙකු ලෙස තමා සළකා කටයුතු කළ නොහැක. අඩුම වශයෙන් ඔහු කලින් නොදන්වා පොලිස් ස්ථානවලට කරන පැමිණීම් හා සම්මුඛ සාකච්ඡා කිරීම් මඟින් අත්අඩංගුවේ රඳවා සිටින්නන්ගේ තත්ත්වය හා ඔවුන් ලබන සැලකිල්ල ගැන වාර්තා ඉදිරිපත් කිරීමට බලය පැවරූ විශේෂ පොලිස් නිලධාරින් පත් කිරීම මඟින් හා/හෝ මානව හිමිකම් නිලධාරින් හෝ නියෝජිතයින් හා/හෝ ප්‍රාදේශීය ප්‍රජා නායකයින්ගේ පැමිණීම් සැලසුම් කළ යුතුය. 11 වන වගන්තිය උල්ලංඝනය කිරීම වළක්වාලීම සඳහා සැලසුම් සාර්ථක විය හැකි උපදේශාත්මක අණ කිරීම් දීමට බොහෝ කාලයක් තුළ පැහැර හැරීමෙන් හා කෙසේ වුවත් සිදු වන උල්ලංඝනයන් ගැන නිසි පරීක්ෂණ පැවැත්වීමට හා විනය හා අපරාධ ක්‍රියා පටිපාටින් ගැනීමට වග බලා නොගැනීමෙන් වරදට අනුබල දීම ඉවසා සිටීම (නොඑසේ නම් අනුමැතිය හා එසේ කිරීමට බලය පැවරීම) කෙරී ඇතැයි සාධාරණව නිගමනය කළ හැකිය."**

ඊට අමතරව ජෙරාඩ් කෲර හා අමානුෂික ලෙස වධ හිංසාවට ලක් කිරීම හේතුවෙන් වත්තල පොලිස් ස්ථානයේ පොලිස් නිලධාරින්ට එරෙහිව 1994 අංක 22 දරන වධ දීමට හා අනෙකුත් කෲර අවමන්සහගත සැළකීමට එරෙහි සම්මුති පනත යටතේ මහාධිකරණයේ නඩුවක් පැවරීමට ද ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නීතිපතිවරයාට නියෝග කරන ලදී.

ඒ අනුව 2003 වසරේ වත්තල පොලිස් ස්ථානයේ සේවයේ නියුතු සුරේෂ් ගුණසේන ඇතුළු පොලිස් නිලධාරින් හය දෙනෙකුට විරුද්ධව 1994 අංක 22 දරන වධ දීමට හා අනෙකුත් කෲර අවමන්සහගත සැළකීමට එරෙහි සම්මුති පනත යටතේ මීගමුව මහාධිකරණයේ නඩුවක් පැවරුණි.

# තමාට එරෙහිව පවරන ලද නඩුවෙන් ගැළවීමට එක් විත්තිකරුවකු විසින් ජෙරාඩ්ව ඝාතනය කරයි...

**HC 326/03** යන අංකයෙන් මීගමුව මහාධිකරණයේ මෙම නඩුව විභාග වෙමින් පවතින විට විත්තියේ නීතිඥවරයාගෙන් සුරේෂ් ගුණසේන නම් පොලිස් නිලධාරියාට උපදෙස් ලැබී ඇත්තේ මෙම නඩුවෙන් නිදහස් වීමට නම් වධ හිංසාවට ලක් වූ ජෙරාඩ්ගේ සාක්ෂි අධිකරණය වෙත ලබා දීම වැළැක්විය යුතු බවයි. එම උපදෙස අනුව ක්‍රියාත්මක වූ සුරේෂ් ගුණසේන වත්තල ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙකු වන දිලුක්ෂ ප්‍රශංස අල්විස් සමඟ පැමිණ රුපියල් ලක්ෂ තුනක මුදලක් ලබා දී නඩුව සමථයකට පත් කර ගැනීමට ජෙරාඩ් සමඟ සාකච්ඡා කළ නමුත් ජෙරාඩ් මර්වින් ඊට එකඟ වී නොමැත.

අනතුරුව මහාධිකරණ නඩුවේ සාක්ෂිකරුවෙකු ලෙස සාක්ෂි ලබා දීමට නියමිත දිනයට දින කීපයකට පෙරාතුව එනම් 2004 නොවැම්බර් මස 21 වන දින පොදු බස් රථයකින් තම සේවා ස්ථානයට ගමන් කරමින් සිටියදී ජෙරාඩ් මර්වින්ට පොලිස් පරීක්ෂක සුරේෂ් ගුණසේන විසින් මෙහෙයවන ලද අජිත් නිශාන්ත නම් තැනැත්තෙකු විසින් වෙඩි තබා ඝාතනය කරන ලදී.

# පියා අහිමි දරු පවුලක් ...

ජෙරාඩ් මර්වින් මිය යන විට ඔහු තිදරු පියෙකි. ඔහුගේ බිරිඳ පද්මා වික්‍රමරත්න රැකියාවක් නොකළ ගෘහණියකි. ජෙරාඩ් ඝාතනයට ලක් වන විට ඔහුගේ බාලම දරුවාට වයස මාස හයක් ලැබුවා පමණි. මුළු පවුලක්ම රැක බලා ගත් ජෙරාඩ්ගේ වියෝව ඔහුගේ බිරිඳට දැනුණේ මුළු ලෝකයම තම දෙපා මුල එක්වර කඩා වැටුණාක් මෙනි. කුඩා දරුවන් තිදෙනෙකු සමඟ තනි වූ ජෙරාඩ්ගේ බිරිඳට තම දරු පවුල රැක ගැනීමට ජීවිතය සමඟ බොහෝ පොර බඳින්නට සිදු විය.

තම සැමියා ඉපයූ ආදායම හැරෙන්නට ඔවුන්ට ජීවත් වීමට කිසිදු ආදායම් මාර්ගයක් ද නොවුණි. පද්මාගේ දෙවන දරුවා ආබාධිත දරුවෙකු වූ බැවින් පද්මාට රැකියාවක් සඳහා යාමට ද අවස්ථාවක් නොලැබුණි. එම ආබාධිත දරුවා නිතරම රෝගාතුර වූ අතර ඔහුගේ වෛද්‍ය ප්‍රතිකාර සඳහා විශාල මුදලක් අවශ්‍ය විය. ජෙරාඩ්ගේ මරණයෙන් පසුව ආර්ථික දුෂ්කරතාවයන්ගෙන් දැඩිව පෙළුණ පද්මාට තම දරුවන් පෝෂණය කිරීමට කඩයප්පන් තම්බා විකිණීමට සිදු විය.

නොසිතූ මොහොතක තමාත්, තම දරු පවුලත් රැක බලා ගත් එකම රැකවලා මෙලොව හැර ගිය විට ඔහුගේ බිරිඳ මානසිකව බෙහෙවින් ඇද වැටුණාය. ජීවත් වීමට කිසිදු මඟක් නොතිබුණ පද්මාට දරු තිදෙනෙකු සමඟ හිටිහැටියේ තනි වීමට සිදු වීම දරා ගත නොහැකි විය. ඇය කෙතරම් මානසිකව ඇද වැටුණාද කිවහොත් ඇයට මනෝවිද්‍යා උපදේශනයන් පවා ලබා දීමට සිදු විය.

# ජෙරාඩ් මර්වින්ගේ ඝාතනයට විරුද්ධව නඩු පැවරෙයි ....

ජෙරාඩ් මර්වින් වෙඩි තබා ඝාතනය කිරීම සම්බන්ධයෙන් මීගමුව මහාධිකරණයේ **HC 445/2005** දරණ අංකයෙන් නඩුවක් පැවරුනි. මෙම නඩුව පැවරුනේ වත්තල පොලිසියේ සේවය කළ පොලිස් පරීක්ෂක සුරේෂ් ගුණසේන හා අජිත් නිශාන්ත නම් තැනැත්තන්ට විරුද්ධවයි. ජෙරාඩ් මර්වින්ගේ ඝාතන නඩුව වසර දහයක් තිස්සේ විභාග වීමෙන් අනතුරුව 2015 ජූනි මස 22 වන දින එහි තීන්දුව ලැබුණි.

---

**මෙම නඩුවේ චූදිතයින් වන 01 මාකවිටගේ සුරේෂ් ගුණසේන හා 02 පොල්වත්ත රතුබදුගේ අජිත් නිශාන්ත යන අයට 2004/11/21 වැනි දින හෝ ඊට ආසන්න දිනකදී මෙම අධිකරණ බල සීමාව තුළදී වත්තල දී වරාගොඩ මුදලිගේ ජෙරාඩ් මර්වින් පෙරේරාගේ මරණය සිදු කිරීමට අනුබල දීමේ පොදු පරමාර්ථයකින් යුතුව එකඟ වීමෙන් මිනීමැරීමේ කුමන්ත්‍රණයේ වරද සිදු කළ බවත් එහෙයින් විත්තිකරු දණ්ඩ නීති සංග්‍රහයේ 113 හා 102 සමඟ කියවෙන දණ්ඩ නීති සංග්‍රහයේ 96 වගන්තිය යටතේ වරදකරු බවත් ප්‍රකාශ කරමි. දෙවන විත්තිකරු වරාගොඩ මුදලිගේ ජෙරාඩ් මර්වින් පෙරේරාගේ මරණය සිදු කිරීමෙන් ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 296 වගන්තිය යටතේ වරදකරු බවට තීරණය කරමින් ඒ අනුව එකී චෝදනාවන්ට 01 හා 02 චූදිතයින් වරදකරුවන් කරමි. මේ අනුව 01 හා 02 චූදිතයින්ට මරණ දඬුවම හිමි වේ.**

---

ඉහත කී චෝදනාවන් ඔප්පු කිරීමට පැමිණිල්ල විසින් සාක්ෂිකරුවන් විසි අට දෙනෙකු[9] නඩු විභාගය සඳහා කැඳවන ලදී. නීතියෙන් පිළිගන්නා පරිදි පැමිණිල්ල විසින් චූදිතයින් ඉහත කී දණ්ඩනීය වරද සිදු කර ඇති බව සාධාරණ සැකයෙන් තොරව ඔප්පු කරන තාක් කල් ඔවුන් නිර්දෝශීය. මෙම නඩුවේ පළමු විත්තිකරු වන සුරේෂ් ගුණසේනට ඇති චෝදනාව වන්නේ ජෙරාඩ් මර්වින් මරණයට පත් කිරීම හෝ මිනී මැරීමට කුමන්ත්‍රණය කිරීම හෝ අනුබල දීමයි. මෙහි ජෙරාඩ් මර්වින් මරණයට පත් කිරීමට ආධාර අනුබල දීම යන්න ඔප්පු කිරීමට පැමිණිල්ල විසින්

- ***01 වන විත්තිකරු විසින් මෙම වරද කිරීමට යම් කෙනෙකු පෙළඹවූ බව***
- ***යම් දෙයක් කිරීමට කුමන්ත්‍රණය කළ බව***
- ***ඔහුගේ මරණය සිදු කිරීමට යම් ක්‍රියාවක් සිදු කළ බව ඔප්පු කළ යුතුය***

මෙහි 01 වන විත්තිකරු විසින් ජෙරාඩ් මර්වින් මරණයට පත් කිරීමට කුමන්ත්‍රණය කිරීම යන චෝදනාව සම්බන්ධයෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 113(අ) වගන්තිය අදාළ වේ. එම වගන්තිය අනුව යම් වරදක් සිදු කිරීමට කුමන්ත්‍රණය කළේ නම් එම සිදු කරන ලද වරදට අදාළ දඬුවම දිය යුතුය. ඒ අනුව 01 වන විත්තිකරුට ඇත්තේ මිනීමැරුමට කුමන්ත්‍රණය කිරීමේ චෝදනාව වන බැවින් මිනීමැරීම නම් වරදට දිය යුතු දඬුවම මෙහිදී මිනීමැරීමට කුමන්ත්‍රණය කිරීම සඳහා ද දිය යුතුය.

මෙම නඩුවේදී චූදිතයින් ***සාපරාධී චේතනාවෙන්*** යුතුව ක්‍රියා කර ඇති බව පැමිණිල්ල විසින් පෙන්වා දිය යුතුය. ඒ සඳහා සිද්ධිය ඇසින් දුටු සහ ඊට යටත් වූ සාක්ෂිකරුවන් ද, ඊට අමතර සාක්ෂි

[9] මෙහි පැමිණිල්ලේ සාක්ෂිකරුවන් විසි අට දෙනාගේම සාක්ෂි අන්තර්ගත කොට නොමැති අතර තීන්දුව කරා එළඹීමට වැදගත්ම වූ සාක්ෂි පමණක් අන්තර්ගත කොට ඇත.

තහවුරු කිරීම සඳහා අමතර සාක්ෂිකරුවන් ද, පරිවේෂණ සාක්ෂි [10]ද පැමිණිල්ල විසින් අධිකරණය ඉදිරියේ ගෙන හැර දක්වා ඇත.

## පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු - දොන් ගයාන් චන්දිමාල් අමරකෝන්

පළමු සාක්ෂිකරු මෙම නඩුවේ පළමු විත්තිකරු වන සුරේෂ් ගුණසේන බියගම පොලිසියේ සේවය කරන කාලයේ පොලිසියට තොරතුරු සපයන්නෙකු ලෙස ක්‍රියා කළ පුද්ගලයෙකි. මොහුගේ සාක්ෂි අනුව 2004 නොවැම්බර් 21 වන දින උදෑසන කඩයට යමින් සිටින විට 01 වන විත්තිකරු වන සුරේෂ් ගුණසේන ඔහුගේ මෝටර් රථයෙන් පැමිණ මධුර නම් කෙනෙකු අත්අඩංගුවට ගැනීමට අවශ්‍ය බව පවසා ඔහුව කැටුව ගොස් ඇත. එම අවස්ථාවේ මෝටර් රථය තුළ බියගම පොලිස් ස්ථානයේ සේවය කළ කොස්තාපල් කෙනෙකු වූ ප්‍රදීප් යන අයත්, මීට පෙර හඳුනා ගෙන නොසිටි පුද්ගලයෙකු වූ අජිත් නම් තැනැත්තෙකු ද සිට ඇත.

ඉන් පසුව පළමු සාක්ෂිකරුව ගම්පහ රේල් පාර අසළ බස්සවා ඇත. එම ස්ථානයේ හිඳිමින් කළු මහත කෙනෙකු අතුරු පාරෙන් පැමිණි විගස 01 වන විත්තිකරු වන සුරේෂ් ගුණසේනට දුරකථන ඇමතුමක් ලබා දෙන ලෙස දන්වා සුරේෂ් විසින් ඔහුට සිම් කාඩ්පතක් ද ලබා දී ඇත. විනාඩි 45ක පමණ කාලයක් එම ස්ථානයේ රැඳී සිටීමෙන් අනතුරුව කළු, මහත තැනැත්තෙකු නොපැමිණි බව පවසා පළමු සාක්ෂිකරු විසින් සුරේෂ් ගුණසේනට දුරකථන ඇමතුමක් ලබා දී ඇත.

පසුව එම මෝටර් රථය පළමු සාක්ෂිකරු හිඳි ස්ථානයට පැමිණ ඔහුව එයට නංවා ගෙන ගම්පහ සිට කොළඹ දෙසට යන බස්

[10] ආරවුලට කෙලින්ම පදනම් නොවූ ප්‍රශ්නගත කරුණු පිළිබඳ අනුමිතියකට එළඹීමට යොදා ගන්නා සාක්ෂි වේ. ඇසින් දුටු සාක්ෂි පැහැදිලි නැති විටක පරිවේෂණ සාක්ෂි සියල්ල එක්ව ගත් කළ පිළිගත හැකි සම්පූර්ණ සිදුවීමක් ඇති කරයි ද යන්න සළකා බැලිය යුතුය.

ගුණසේන තේනබදු, ශ්‍රී ලංකාවේ අපරාධ සාක්ෂ්‍ය නීතිය, පිටු අංක 15

රථයක් පසුපස යන්නට විය. ඒ වන විට ද එම මෝටර් රථය තුළ සුරේෂ් ගුණසේනට අමතරව අජිත් නිශාන්ත හා ප්‍රදීප් යන අය සිටියහ. පසුව ඔවුන් ඉදිරියෙන් ගිය බස් රථය නැවැත්වූ විට එයින් කළු, මහත පුද්ගලයෙකු බැස වෙනත් බස් රථයකට නැංගේය. එවිට සුරේෂ් ගුණසේන, මෙම නඩුවේ දෑනට 02 වන විත්තිකරු වන අජිත් නිශාන්තට හා ප්‍රදීප් යන අයට එම බස් රථයට නගින ලෙස දැනුම් දී මෝටර් රථය දිගටම බස් රථය පිටුපසින් ධාවනය කරන්නට විය.

බස් රථය පාර මැද නතර කළ අවස්ථාවක අජිත් කළු තුවක්කුවක් රැගෙන බස් රථය පිටුපසින් බැස තමා සිටි මෝටර් රථයට නැංග බවත්, එම අවස්ථාවේ එම නවතා තිබූ බස් රථයෙන් මගීන් බියෙන් කෑ ගසමින් කලබලයෙන් මෙන් බසිනු දුටු බවත් පළමු සාක්ෂිකරු පැවසීය. අජිත්, සුරේෂ්ට "ගිය වැඩේ හරි" කී බවත් සුරේෂ් "මම බලා ගන්නම්" කී බවත් එදින සවස 5ට පමණ බියගම විලේජ් හෝටලයේ දී අජිත් හා සුරේෂ් ඔහුට මුණ ගැසුණ බවත් මිය ගිය පුද්ගලයාගේ නම ජෙරාඩ් බව දැන ගන්නට ලැබුණ බවත් පළමු සාක්ෂිකරු තම සාක්ෂියේදී පැවසීය.

## පැමිණිල්ලේ දෙවන සාක්ෂිකරු - ප්‍රදීප් කුමාර

දෙවන සාක්ෂිකරු මෙම සිද්ධිය වන විට 01 වන විත්තිකරු වන සුරේෂ් ගුණසේන යටතේ සේවය කළ පොලිස් නිලධාරියෙකු විය. මෙම සිද්ධිය වූ දින සුරේෂ් ගුණසේන විසින් මධුර නම් පුද්ගලයෙකු අත්අඩංගුවට ගැනීමට ඇති බව පවසා තමාව ඔහුගේ මෝටර් රථයේ නංවා ගෙන ගිය අතර අතරමගදී සුරේෂ්ගේ පෞද්ගලික ඔත්තුකරුවෙකු වන අජිත් නම් තැනැත්තෙකු ද මෝටර් රථයට නංවා ගෙන ඇත. ඉන් පසුව තවත් පෞද්ගලික ඔත්තුකරුවෙකු වන ගයාන් නම් තැනැත්තාව ද මෝටර් රථයට නංවා ගෙන ගොස් ගම්පහ රේල් පාර පසු කොට ගයාන්ව බස්සවා කළු, උස, මහත පුද්ගලයෙකු පැමිණියහොත් තමාට දුරකථන ඇමතුමක් දෙන ලෙස දන්වා 01 වන විත්තිකරු විසින් මෝටර් රථය ඉදිරියට ධාවනය කොට ඇත.

පසුව එබඳු පුද්ගලයෙකු නොපැමිණි බවට ගයාන් දුරකථන ඇමතුමක් දුන් බැවින් නැවත මෝටර් රථය හරවා ගෙන ගොස් ඔහුවද

නංවා ගෙන ඉදිරියට ගොස් තුන් මං හන්දියක නවතා මෙම නඩුවේ දෙවන විත්තිකරු වන අජිත් හා දෙවන සාක්ෂිකරු බස්සවා ඇත. පසුව පැමිණි බස් රථයකට අජිත් නැංග අතර අනතුරුව දෙවන සාක්ෂිකරු ද ඊට නැඟ ඇත.

දෙවන සාක්ෂිකරු පවසා සිටියේ තමා බස් රථයේ දකුණු පස අසුනක හිඳ ගත් බවත් අජිත් වම් පස අසුනක හිඳ ගත් බවත්ය. මොහුගේ සාක්ෂි අනුව මොහොතකින් ඩෝං යන ශබ්දය ඇසුණ අතර බස් රථයේ සිටි මගීන් කෑ ගසන්නට පටන් ගෙන ඇත. එවිටම පිටුපස දොරින් අජිත් බැස දිව යනු දෙවන සාක්ෂිකරු දැක ඇති අතර එම අවස්ථාවේ අජිත්ගේ අතේ කළු පැහැති පිස්තෝලයක් ද තිබෙනු දෙවන සාක්ෂිකරු දැක ඇත.

ඉන් පසුව දෙවන සාක්ෂිකරු එම බසයෙන් බැස වෙනත් බසයක නැඟී පැලියගොඩට පැමිණ 01 වන විත්තිකරු වන සුරේෂ්ට දුරකථන ඇමතුමක් ලබා දී "අජිත් මෙහෙම වැඩක් කළා සර් කොහෙද ඉන්නෙ" විමසා ඇත. එවිට සුරේෂ් මහතා තමාට "කට වහගෙන පොලිසියට වරෙන්" යයි කිවූ බව තම සාක්ෂියේ දී දෙවන සාක්ෂිකරු පවසා ඇත.

ඒ අනුව ඔහු පොලිසියට ගොස් ඇති අතර සවස 5.30 ට පමණ බියගම විලේජ් හෝටලය වෙත සුරේෂ් දෙවන සාක්ෂිකරුව කැටුව ගොස් ඇත. එහිදී 01 වන විත්තිකරු විසින් දෙවන සාක්ෂිකරුට "මගෙ නඩුවෙ එකාට ගැහුවෙ" කිවු බවත් එහිදී මිය ගිය පුද්ගලයාගේ නම ජෙරාඩ් බව තමාට දැන ගන්නට ලැබුණ බවත් දෙවන සාක්ෂිකරු සාක්ෂි දෙමින් පවසා ඇත.

## පැමිණිල්ලේ සාක්ෂිකරු - කරුපයියා ජයසිලන්

මෙම සිද්ධිය වන විට මොහු මිනුවන්ගොඩ කොටුව මාර්ගයේ 62-8509 බස් රථයේ කොන්දොස්තරවරයා ලෙස සේවය කොට ඇත. 2004-11-21 වන දින තමා කොන්දොස්තරවරයා ලෙස සේවය කරමින් සිටි බස් රථය කොළඹට එමින් සිටින අවස්ථාවේ මාබෝලේ සමරසිංහ තෙල් මෝල අසළ දී තමාට ශබ්දයක් ඇසුණ බවත් එවිට ඔහු බස්

රථයේ පසුපස දොරේ සිටි බවත් පැවසීය. රථය තුළ සිටි සෙනඟ අම්මෝ කියා කෑ ගසමින් දොරවල් දෙකින්ම එළියට බසිමින් සිටි අතර එක් විශේෂ පුද්ගලයෙකු පිස්තෝලයක් ද අතැතිව පසුපස දොරින් බැස ගිය බවත් ඒ යන අතරතුර පිටුපස හැරී බැලූ බවත් සාක්ෂිකරු පැවසීය.

බසය තුළට ගිය විට එක් පුද්ගලයෙකු ලේ පෙරෙමින් වැටී සිටි අතරතුර ඔහු ජා-ඇලින් බසයට නැගුණ පුද්ගලයෙකු බවත් මොහුට වෙඩි තබා පළා ගිය පුද්ගලයා, වෙඩි වැදී බිම වැටී සිටි පුද්ගලයාගේ අසුනට පසුපස අසුනේ හිඳ සිටි බව තමාට මතක බවත් මෙම කොන්දොස්තර තම සාක්ෂියේදී ප්‍රකාශ කර ඇත.

## පැමිණිල්ලේ සාක්ෂිකරු - ජේරාඩ්ගේ බිරිඳ පද්මා වික්‍රමරත්න

මෙම නඩුවේ මරණකරු[11] වන ජේරාඩ් මර්වින්ගේ බිරිඳ වන මෙම සාක්ෂිකාරිය ප්‍රකාශ කර සිටියේ තම සැමියා කිසිවෙකු සමඟ ආරවුල් ඇති කර නොගන්නා ඉතාම සාමකාමී පුද්ගලයෙකු වූ බවයි. 2002 වසරේ දිනක නාඳුනන පුද්ගලයින් කිහිප දෙනෙකු පැමිණ තම දෑස් ඉදිරිපිටම සැමියාව රැගෙන ගිය අතර එම සිද්ධිය සිදු වූයේ තම දියණිය පෙර පාසලට රැගෙන යන අතරතුරදී බව ඇයගේ සාක්ෂියෙන් ප්‍රකාශ විය.

එසේ තම සැමියාව රැගෙන ගියේ වත්තල පොලිසියෙන් බව පසුව දැන ගන්නට ලැබුණ බවත්, පසුව ඔහුව නිදහස් කළ බවත් නිදහස් කරන විට තම සැමියා පහර කෑමට ලක්ව ආබාධිත තත්වයේ පසු වූ බවත් ඇය වැඩිදුරටත් ප්‍රකාශ කළාය. පසුව පොලිස් අත්අඩංගුවේදී වධහිංසාවන්ට ලක් වීමේ සිද්ධිය මුල් කොටගෙන තම සැමියා විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ මූලික අයිතිවාසිකම් නඩුවක් පැවරූ අතර ඉන්

[11] සාමාන්‍යයෙන් මනුෂ්‍ය ඝාතන නඩුවක ඝාතනයට ලක් වූ පුද්ගලයා හඳුන්වනු ලබන්නේ මරණකරු ලෙසයි. ඒ අනුව මෙම සිද්ධියේ මරණකරු ලෙස දක්වා ඇත්තේ ජේරාඩ් මර්වින් පෙරේරාය.

රුපියල් ලක්ෂ දහසයක වන්දි මුදලක් ලැබුණු බවද ඇයගේ සාක්ෂියෙන් ප්‍රකාශ විය.

මීගමුව මහාධිකරණයේ වධ හිංසා නඩුවක් පවරා ඇති බවට 2004-11-02 වන දින තම සැමියාට සිතාසි ලැබුණ පසුව වත්තල ප්‍රදේශයේ දේශපාලනඥයෙකු වන දිල්රුක්ෂ නමැත්තෙකු පැමිණ එම නඩුව ඉවත් කර ගන්නා ලෙසත්, එසේ ඉවත් කරගතහොත් රුපියල් ලක්ෂ තුනක මුදලක් දෙන බවටත් පොරොන්දු වී ඇත. එවිට තම සැමියා විසින් එම දේශපාලනඥයාට තමාට එම නඩුව ඉවත් කර ගැනීමට හැකියාවක් නොමැති බවත්, එය පවරා ඇත්තේ මානව හිමිකම් කොමිසමේ නීතිඥවරයෙකු විසින් බවත් පවසනු ඇසුණ බව පද්මාගේ සාක්ෂියෙන් ප්‍රකාශ විය. ඉන් සති කීපයකට පසුව එනම් 2004-11-21 වන දින තම සැමියාට වෙඩි තබා ඇති බව අල්විස් ටවුන් හි මිතුරෙකුගෙන් දැන ගන්නට ලැබුණ බව වැඩිදුරටත් ඇය ප්‍රකාශ කළාය.

## පැමිණිල්ලේ සාක්ෂිකරු - දිලුක්ෂ අල්විස්, වත්තල ප්‍රාදේශීය සභා මන්ත්‍රී

මොහු කියා සිටියේ තමා වසර 19ක පමණ සිට දේශපාලන කටයුතුවල නිරත වන බවත් දැනට වත්තල ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙකු ලෙස කටයුතු කරන බවත්ය. මෙම නඩුවේ මරණකරු තමාගේ ඡන්ද දායකයෙකු වූ අතර ඔහුගේ වැඩිමහල් සහෝදරයා තමාගේ දේශපාලන කටයුතුවලට ක්‍රියාකාරී ලෙස සහයෝගය ලබා දුන් බව ද ඔහු වැඩිදුරටත් ප්‍රකාශ කළේය. මෙම නඩුවේ පළමු චූදිත තමා හඳුනන බව පැවසූ සාක්ෂිකරු වැඩිදුරටත් කියා සිටියේ ජෙයරාජ් නම් අයෙකු සිදු කළ ත්‍රිපුද්ගල මනුෂ්‍ය ඝාතනයක් සම්බන්ධව මෙම නඩුවේ මරණකරුව වත්තල පොලිසිය විසින් අත්අඩංගුවට ගත් බවත් පසුව මරණකරු නවලෝක රෝහලට ඇතුළු වී ප්‍රතිකාර ලබා ගත් බව දැන ගන්නට ලැබුණ බවත්ය.

එසේ ප්‍රතිකාර ගැනීමට සිදු වූයේ අත්අඩංගුවේ දී සිදු වූවක් සම්බන්ධයෙන් බවත් එම සිදුවීමට විරුද්ධව පොලිස් ස්ථානාධිපති සුරවීර, සුරේෂ් ගුණසේන හා තවත් පොලිස් නිලධාරීන් කිහිප දෙනෙකු

විත්තිකරුවන් කොට නඩුවක් විභාග වෙමින් පැවති බව තමා දැන සිටි බවත් මෙම සාක්ෂිකරුගේ සාක්ෂියෙන් ප්‍රකාශ විය. තමා මෙම නඩුවේ මරණකරුව දැන සිටි බැවින් වත්තල පොලිස් ස්ථානයේ පොලිස් නිලධාරීන් පැමිණි මෙම නඩුව සමථයකට පත් කර ගැනීම සම්බන්ධයෙන් තමාගෙන් උපකාර ඉල්ලූ බව සාක්ෂිකරු පැවසූ අතර ඒ අතර මෙම නඩුවේ පළමු විත්තිකරු සුරේෂ් හා තවත් කිහිප දෙනෙකු සිටි බව ද වැඩිදුරටත් පැවසීය. ඒ අනුව තමා පළමු විත්තිකරු ද සමඟ මෙම නඩුවේ මරණකරු හමු වීමට ගිය අතර තමා පැමිණි කරුණ ඔහුට කී විට මෙම නඩුව දමා ඇත්තේ මානව හිමිකම් එකෙන් බැවින් තමාට තීරණයක් ගත නොහැකි බවත්, මානව හිමිකම් එකේ නීතිඥවරයා සමඟ කථා කොට දැනුම් දෙන්නම් යයි මරණකරු විසින් පැවසූ බවත් සාක්ෂිකරු වැඩිදුරටත් ප්‍රකාශ කළේය.

## පැමිණිල්ලේ සාක්ෂිකරු - වර්ණපාල ආරච්චිගේ චන්දන අබේසේකර, අපරාධ අංශයේ ස්ථානාධිපති, කඳාන පොලිස් ස්ථානය

2004-11-21 වන දින වෙඩි තැබීමේ සිද්ධියක් වාර්තා වූ අතර ඒ අනුව දහවල් 12ට පමණ මහබාගේ සතොස වෙළඳ සංකීර්ණයේ අපරාධ ස්ථානයේ නිරීක්ෂණ සටහන් යොදා ගත් බවත්, තුවාලකරුව එම බස් රථයේම රාගම රෝහල වෙත ගෙන ගොස් තිබූ බව දැන ගන්නට ලැබුණ බවත් මෙම සාක්ෂිකරු පැවසීය.

ඒ අනුව තමා දහවල් 1.00ට පමණ රාගම රෝහල වෙත ගිය බවත් ඒ වන විට තුවාලකරු ශල්‍යාගාරයේ ට්‍රොලියක හාන්සි වී සිටි අතර ඔහු උඩට හැඳ සිටි ඇඳුමේ ලේ තැවරී තිබුණ බවත් තමා එම සිද්ධිය ගැන විමසූ විට තුවාලකරු කථා කිරීමට උත්සාහ කළත් එය අසාර්ථක වූ බවත් සාක්ෂිකරු පැවසීය. වැඩිදුරටත් සාක්ෂිකරු කියා සිටියේ වෛද්‍යවරයා විසින් තුවාලකරුගේ මුඛයේ තිබූ සෙම ඉවත් කළ විට තුවාලකරු තමාට වෙඩි තැබූ පුද්ගලයාව නොහඳුනන බවත් මෙය වත්තල පොලිසියේ කේස් එකක් බවත් තමාට පැවසූ බවයි.

# පැමිණිල්ලේ සාක්ෂිකරු - අධිකරණ වෛද්‍ය අසරප්පුලිගේ දයාපාල

2004-11-21 වන දින තමා කොළඹ අධිකරණ වෛද්‍ය කාර්යාලයේ සේවය කළ අතර කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේ මහේස්ත්‍රාත්තුමාගේ නියෝගයක් මත ජෙරාඩ් මර්වින් නමැත්තාගේ මෘත දේහය සම්බන්ධයෙන් පශ්චාත් මරණ පරීක්ෂණයක් සිදු කළ බව සාක්ෂිකරු අධිකරණයේ සාක්ෂි දෙමින් පැවසීය. මෘත දේහයේ දක්නට ලැබුණ තුවාල පහත පරිදි සාක්ෂිකරු විස්තර කර ඇත.

**බාහිර තුවාල අංක 01 -** ගෙල පිටුපස සෙන්ටිමීටර් 1ක වට ප්‍රමාණයක ගිනි අවි උණ්ඩයකින් ඇති වූ තුවාලයක් විය.

**බාහිර තුවාල අංක 02 -** ගිනි අවියකින් නිකුත් වූ උණ්ඩයකින් ඇති වූ තවත් තුවාලයක් ශරීරයේ වම් පැත්තේ පිට ප්‍රදේශයේ විය.

**බාහිර තුවාල අංක 03 -** පපුවේ උගුරු ඇටයේ සිට සෙ.මී. 11ක් පහළින් මඳක් දකුණු පසට වන්නට තවත් තුවාලයක් විය. එය ශරීරයේ පිටුපසින් ඇතුළු වූ උණ්ඩයක් ශරීරයෙන් පිට වීමේදී හට ගත් තුවාලයකි.

තවදුරටත් සාක්ෂිකරු කියා සිටියේ මෙම තුවාල දෙස බැලීමේදී මරණකරුට පිටුපසින් තරමක් ඈත් වී තුවක්කුව පහළ දෙසට මානා තබන ලද වෙඩි පහරක් නිසා මෙම තුවාල හට ගෙන ඇති බවත්, සිට ගෙන සිටින පුද්ගලයෙකු විසින් හිඳ ගෙන සිටින පුද්ගලයෙකුට වෙඩි තැබූ විට මෙවැනි තුවාල ඇති විය හැකි බවත්ය. මරණකරුගේ ශරීරයේ ඇති 01 වන තුවාලය හට ගෙන ඇත්තේ කශේරුකාවෙන් වෙඩි උණ්ඩයක් ඇතුළු වී ස්වාසනාලය සිදුරු වී කාටිලේජ තුවාල කොට ගලනාලයෙන් පිටව යාමෙන් බවත්, 02 වන තුවාලය ඇති වී ඇත්තේ උරස් කුහරයෙන් වෙඩි උණ්ඩයක් ඇතුළු වීමෙන් බවත්, එය කොඳු ඇට පෙළ කැඩී අක්මාව දක්වා තුවාල වී ආමාශයේ කුඩා

බඩවැල සම්බන්ධ කොටස දක්වා තුවාල කරමින් පිටව ගොස් ඇති බවත් සාක්ෂිකරු පැවසීය.

පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාවේ ජෙරාඩ් මර්වින්ගේ මරණයට හේතුව ලෙස සඳහන් කර ඇත්තේ ගිනි අවියකින් සිදු වූ තුවාල මඟින් ශ්වාසනාලය, ගලනාලය, අක්මාව, බඩවැල්වලට, දකුණු අධිවෘක්ක ග්‍රන්ථිවලට සිදු වූ හානිවල සංකූලතාවයන් වශයෙන් ශරීරයේ බහුවිධ ඉන්ද්‍රියන් අකර්මන්‍ය වීමයි.

## විත්තියේ සාක්ෂි

### 01 වන චූදිත - සුරේෂ් ගුණසේන

මොහු අධිකරණය ඉදිරියේ සාක්ෂි දෙමින් කියා සිටියේ 2014-11-21 වන දින ජෙරාඩ් මර්වින් නමැත්තෙකු ඝාතනය කිරීම සම්බන්ධයෙන් සැක පිට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් තමාගෙන් ප්‍රශ්න කොට පිළිතුරු සටහන් කර ගත් බවයි. 01 වන චූදිත කියා සිටියේ තමාට විරුද්ධව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් නඩු පැවරීම පුදුමයක් බවත්, මෙලෙස පහත් තත්වයකට වැටී සිදු කරන පරීක්ෂණය අදහා ගත නොහැකි බවත්ය.

මෙම සිද්ධියේ 02 වන චූදිත පෞද්ගලික ඔත්තුකරුවකු වන බවත් ඉන් එහා කිසිදු සම්බන්ධතාවයක් ඔහු සමඟ තමාට නොමැති බවත් ඔහු වැඩිදුරටත් තම සාක්ෂියේදී පැවසීය. තවද 01 වන චූදිත කියා සිටියේ ජෙරාඩ් මර්වින්ගේ ඝාතනය සම්බන්ධයෙන් තමා කිසිවක් නොදන්නා බවත්, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් තමාට පහර දී අදාළ ප්‍රකාශයන් ලබා ගත් බවත්ය. තමාට ජෙරාඩ් මර්වින් ඝාතනය කිරීමට කිසිදු අවශ්‍යතාවයක් නොමැති බවත් මෙම චෝදනාවෙන් තමාව නිදොස් කොට නිදහස් කරන ලෙසත් 01 වන චූදිත අධිකරණයෙන් ඉල්ලා සිටියේය.

### 02 වන චූදිත - පොල්වත්ත රතුබදුගේ අජිත් නිශාන්ත

තමා මීට පෙර දෙවතාවක් බන්ධනාගාරගතව සිටි බවත්, විවාහක සිවු දරු පියෙකු වන තමා අම්පාර ප්‍රදේශයේ ජීවත් වන බවත්

02 වන චූදිත සාක්ෂි දෙමින් ප්‍රකාශ කළේය. 2005.02.02 වන දින ආපන ශාලාවකට යමින් සිටියදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් තමාව අත්අඩංගුවට ගත් බවත්, 2004-11-21 වන දින සිදු වූ මනුෂ්‍ය ඝාතනයක් සම්බන්ධයෙන් ප්‍රශ්න කරමින් තමාට ඔවුන් පහර දුන් බවත් මොහු වැඩිදුරටත් අධිකරණය ඉදිරියේ ප්‍රකාශ කළේය.

ඉන් පසුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ගෙන ගොස් කට උත්තරයකට අත්සන් කරන ලෙස තමාට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරින් බල කළ බවත්, පහර දෙනවාට ඇති බිය නිසා තමා අත්සන් කළ බවත් ඔහු පැවසීය. අවසාන වශයෙන් ඔහු අධිකරණය ඉදිරියේ සාක්ෂි දෙමින් කියා සිටියේ තමා ජෙරාඩ් මර්වින් නම් පුද්ගලයෙකු නොහඳුනන බවත්, කිසි දිනක දැක නැති පුද්ගලයෙකු ඝාතනය කිරීමට තමාට කිසිදු අවශ්‍යතාවයක් නොමැති බවත්, මෙම නඩුවේ 01 වන විත්තිකරු වන සුරේෂ් ගුණසේන මහතාව තමා හඳුනන බැවින් තමාව මෙම අපරාධයට නිකරුණේ ඇතුළු කළ බවත් එබැවින් මෙම නඩුවෙන් තමාව නිදොස් කොට නිදහස් කරන ලෙසත්ය.

**මේ දක්වා ඉදිරිපත් කරන ලද සියලුම සාක්ෂි සළකා බලමින් අධිකරණය අවසාන තීන්දුව කරා එළඹීමට පහත පරිදි සාක්ෂි විශ්ලේෂණය කර ඇත.**

- මෙම නඩුවේ විත්තිකරුවන්ට අදාළ අපරාධය සිදු කිරීමට යම් ***පෙළඹවීමේ හේතුවක්*** පැවතුනේද යන්න අධිකරණය පළමුව සළකා බැලිය යුතුය.

01 වන විත්තිකරු සහ මෙම නඩුවේ මරණකරු ජෙරාඩ් මර්වින් අතර යම් ප්‍රශ්නගත සිද්ධි ගණනාවක් සිදුව ඇති බව සාක්ෂි අනුව පෙනී යයි. 01 වන විත්තිකරු වත්තල පොලිසියේ අපරාධ ස්ථානාධිපති ලෙස සේවය කරන අවධියේ මරණකරු අත්අඩංගුවට ගෙන පසුව නිදහස් කොට ඇති අතර අත්අඩංගුවේදී වධහිංසාවට ලක් වීම හේතුවෙන් මරණකරු විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ මූලික අයිතිවාසිකම් නඩුකරයක් ද පවරා ඇත. එම මූලික අයිතිවාසිකම් නඩුකරයේ තීන්දුව අනුව 01 වන විත්තිකරුට රුපියල් හතළිස් දහසක මුදලක් මරණකරු

වෙත වන්දි ලෙස ගෙවීමට නියම විය. තවද එම නඩු තීන්දුවේම ශ්‍රේෂ්ඨාධිකරණය විසින් විත්තිකරුවන්ට එරෙහිව 1994 අංක 22 දරන වධ දීමට හා අනෙකුත් කෲර අවමන්සහගත සැළකීමට එරෙහි සම්මුති පනත යටතේ මහාධිකරණයේ නඩු පවරන මෙන් නීතිපතිවරයාට නියෝග කර ඇත.

ඉන් අනතුරුව **HC 326/03** යන අංකයෙන් මීගමුව මහාධිකරණයේ නඩුවක් පවරා ඇති අතර 01 වන විත්තිකරු වන සුරේෂ් ගුණසේන අවස්ථා කීපයකදීම තමාට විරුද්ධව ඇති මෙම නඩුව සමථයකට පත් කර ගැනීම සඳහා උත්සාහ දරා ඇති බව සාක්ෂි අනුව පැහැදිලි විය. 01 වන විත්තිකරු විසින් මරණකරු වන ජෙරාඩ්ගේ නිවස ආසන්නයේ පදිංචිව සිටි මිරිහාන පොලිස් ස්ථානයේ සේවය කළ පොලිස් නිලධාරියෙකුට රුපියල් හතළිස් දහසක මුදලක් ලබා දී ජෙරාඩ් සමඟ කථා කොට මෙම නඩුව සමථයකට පත් කර දෙන ලෙස ඉල්ලා සිටි බව සාක්ෂි අනුව අනාවරණය වූ අතර වත්තල ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වූ දිලුක්ෂ හරහා ද ජෙරාඩ් සමඟ නඩුව සම්බන්ධයෙන් සමථයකට පැමිණීමට 01 වන විත්තිකරු උත්සාහ කොට තිබුණි. මරණකරු වන ජෙරාඩ්ගේ බිරිඳගේ සාක්ෂියෙන් ද කියවුනේ මෙම නඩුව සමථයකට පත් කර ගැනීම සඳහා 01 වන විත්තිකරු වූ සුරේෂ් ගුණසේන විසින් කිහිප දෙනෙකුම තම නිවසට එවා තිබූ බවත් එම සමථය සඳහා රුපියල් ලක්ෂ තුනක මුදලක් ලබා දීමට සූදානම් වූ බවත්ය.

මෙම සාක්ෂි අනුව පැහැදිලිව පෙනී යන්නේ 01 වන විත්තිකරු වන සුරේෂ් ගුණසේනට මෙම නඩුව සමථයකට පත් කර ගැනීම සඳහා දැඩි උවමනාවක් පැවති බවයි. මරණකරුගේ සාක්ෂිය 01 වන විත්තිකරුට අභියෝගයක්ව පැවති අතර අධිකරණය ඉදිරියේ එම සාක්ෂි ලබා දීම වැළැක්වීමට 01 වන විත්තිකරුට අවශ්‍යව තිබූ බව පැහැදිලිය. 01 වන විත්තිකරු විසින් මරණකරු සමඟ සාමකාමීව කථා කොට අල්ලසක් ලබා දී නඩුව සමථයකට පත් කර ගැනීමට දරන ලද උත්සාහය ව්‍යර්ථ වීමෙන් අනතුරුව කෙසේ හෝ නඩුව අවසන් කිරීමට ඔහු සිතුවා විය හැකිය. මේ අනුව 01 වන විත්තිකරු වන සුරේෂ් ගුණසේනට තමාට විරුද්ධව ඇති නඩුවේ සාක්ෂි ලබා දීම වළක්වමින්

මරණකරු වූ ජෙරාඩ් මර්වින් යන අයව විනාශ කිරීමට පැහැදිලි හේතුවක් තිබූ බව වටහා ගත හැකිය.

- **මීළඟට අධිකරණය සළකා බැලිය යුත්තේ 01 වන විත්තිකරු විසින් මරණකරු ඝාතනය කිරීම සඳහා 02 වන විත්තිකරුව යෙදවූවාද යන්නයි.**

මෙම නඩුවේ පැමිණිල්ලේ 01 වන සාක්ෂිකරු ගයාන් අමරකෝන් ලබා දුන් සාක්ෂි අනුව 01 වන විත්තිකරු වන සුරේෂ් ගුණසේන විසින් මධුර නම් පාතාලයේ පුද්ගලයෙකු අත්අඩංගුවට ගැනීම සඳහා ඔහුගේ මෝටර් රථයේ තමාව නංවා ගෙන ගිය අතර එහි සිටි දෙවන විත්තිකරු වන අජිත් නිශාන්ත හා ප්‍රදීප් කුමාර යන අයව 01 වන විත්තිකරු විසින් බස්සවා බස් රථයකට නගින ලෙස පවසා ඇත. එම බස් රථයට නැග ටික දුරක් යාමෙන් පසුව 02 වන විත්තිකරු විසින් දුරකථනයෙන් 01 වන විත්තිකරු අමතා කළු, උස, මහත පුද්ගලයෙකු එම බස් රථයෙන් බැසීමට සූදානම් වන බව පැවසූ විට 01 වන විත්තිකරු වහාම 02 වන විත්තිකරුට බසයෙන් බැස කළු, උස, මහත පුද්ගලයා ඊළඟට නඟින බස් රථයටද නඟින ලෙස උපදෙස් ලබා දී ඇත.

එම බස් රථය පසුපසින් 01 වන විත්තිකරුගේ මෝටර් රථය ගිය අතර හදිසියේම ඉදිරියෙන් ගිය බස් රථය නැවැත්වූ බවත්, මගීන් තැති ගත් ස්වරූපයකින් කෑ ගසමින් බස් රථයෙන් බසිනු තමා දුටු බවත් පසුව 02 වන විත්තිකරු වන අජිත් නිශාන්ත කළු පැහැති තුවක්කුවක් අතින් ගෙන බසයේ පිටුපස දොරින් බැස තමා සිටි මෝටර් රථයට නැග ගත් බවත්, "ගිය වැඩේ හරි" කියා 01 වන විත්තිකරුට පවසනු තමාට ඇසුණ බවත් මෙම නඩුවේදී සාක්ෂි දෙමින් 01 වන සාක්ෂිකරු ප්‍රකාශ කොට ඇත. එදිනම සවස බියගම විලේජ් නම් හෝටලයේ දී මෙම සාක්ෂිකරුට 01 වන විත්තිකරු හමු වූ අතර 01 වන විත්තිකරු විසින් එදින උදෑසන බස් රථයේදී වෙඩි පහරින් මිය ගියේ ජෙරාඩ් නම් පුද්ගලයෙකු බව පවසා ඇත.

02 වන සාක්ෂිකරු ද තම සාක්ෂියේ දී ප්‍රකාශ කළ කථාව මුළුමනින්ම 01 වන සාක්ෂිකරුගේ කථාවට සමාන වූ අතර ඔවුන් දෙදෙනාගෙම සාක්ෂි එකිනෙක ගැළපුණි.

**මෙම සාක්ෂි විග්‍රහ කිරීමේදී අධිකරණයට පෙනී යන්නේ 01 වන විත්තිකරු විසින් මධුර නම් පුද්ගලයෙකු සෙවීමට යන බවට පළමු හා දෙවන සාක්ෂිකරුවන් නොමඟ යවමින් මෙම අපරාධයට හවුල් කොට ගෙන 01 වන විත්තිකරුට විරුද්ධව ඇති නඩුවේ වින්දිතයා[12] වන ජෙරාඩ් මර්වින් ඝාතනය කොට ඇති බවයි.**

මෙම නඩුවේදී සළකා බැලිය යුතු තවත් වැදගත් සාක්ෂියක් වන්නේ අදාළ අපරාධය සිදු වූ බස් රථයේ කොන්දොස්තර වශයෙන් එදින සේවය කළ ජයශීලන් නම් තැනැත්තාගේ සාක්ෂියයි. මෙම සාක්ෂිකරුගේ සාක්ෂි අනුව එදින බස් රථය තුළ වෙඩි පහර දෙකක් ඇසීමෙන් අනතුරුව මෙම නඩුවේ දූනට 02 වන විත්තිකරු වන අජිත් නිශාන්ත නම් තැනැත්තා කළු පැහැති තුවක්කුවක්ද රැගෙන බසයේ පසුපස දොරින් බැස පසුපස නවතා තිබූ සුදු පැහැ මෝටර් රථයකට නැග යනු ඔහු දුක ඇත. තවද මෙම සාක්ෂිකරු විසින් මහේස්ත්‍රාත් අධිකරණයේ පවත්වන ලද හඳුනා ගැනීමේ පෙරට්ටුවේදී 02 වන විත්තිකරු අදාළ අපරාධය සිදු වූ දින තුවක්කුවක් රැගෙන බසයෙන් බැස ගිය පුද්ගලයා ලෙස හඳුනා ගෙනද ඇත.

තවද මෙම සාක්ෂිකරු අධිකරණය ඉදිරියේ සාක්ෂි දෙමින් පවසා ඇත්තේ අපරාධය සිදු වූ බස් රථය තුළ තමා කොන්දොස්තර වශයෙන් සිටියදී මරණකරුට පසුපස අසුනේ 02 වන විත්තිකරු වන අජිත් නිශාන්ත හිඳ සිටි බව තමාට මතක බවයි. ඔහු ඉදිරිපත් කරන ලද මෙම සාක්ෂිය නිවැරදි බව පෙනී යන්නේ මෙම නඩුවේ පැමිණිල්ල වෙනුවෙන් 02 වන සාක්ෂිකරු ලෙස පෙනී සිටි ප්‍රදීප් කුමාර එනම්

---

[12] 2015 අංක 04 දරන අපරාධ වින්දිතයින් හා සාක්ෂිකරුවන්ට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනතේ අර්ථ නිරූපණ වගන්තිය අනුව ලංකාවේ යම් නීතියකින් වරදක් ලෙස හඳුනා ගත් ක්‍රියාවකට ලක් වීමෙන් කායික, මානසික හෝ ආර්ථික අලාභයක් වන හිංසාවක්, හානියක්, දුබලතාවයක් හෝ ආබාධයක් අත්විඳින තැනැත්තෙකු වින්දිතයෙකු ලෙස හඳුන්වයි. ඒ අනුව මෙම සිද්ධියේ වින්දිතයා ලෙස හඳුන්වන්නේ ඝාතනයට ලක් වූ ජෙරාඩ් මර්වින් පෙරේරාය.

අජිත් නිශාන්ත සමග බස් රථයේ ගිය පුද්ගලයාගේ සාක්ෂිය ද මීට සමාන වන බැවිනි. තවද මෙම නඩුවේදී සාක්ෂි ලබා දුන් අධිකරණ වෛද්‍යවරයා විසින් මරණකරුගේ දේහය පරීක්ෂා කොට තුවාලවල ස්වරූපය අනුව ලබා දුන් සාක්ෂි අනුව ද කියවුණේ මරණකරුට ආසන්නයේ පිටුපස හිඳ තබන ලද වෙඩි පහරකින් එම තුවාලය හට ගත් බවයි. එබැවින් බසයේ කොන්දොස්තර ලබා දුන් සාක්ෂිය කිසිම ආකාරයකින් අභියෝගයකට ලක් වී නැති අතර කිසිම පාර්ශවයකට පක්ෂපාතීත්වයක් දැක්වීමට ඔහුට කිසිදු අවශ්‍යතාවයක් නැති බව අධිකරණයේ වැටහීමයි.

තවද මෙම නඩුවේ 01 වන හා 02 වන සාක්ෂිකරුවන් 01 වන විත්තිකරුගේ ක්‍රියාවට සහයෝගය ලබා දී තිබුණත් ඔවුන් එයට සහාය වී ඇත්තේ නිලධාරි මට්ටමින් හා 01 වන විත්තිකරු විසින් සිදු කිරීමට නියමිත ක්‍රියාව පිලිබඳ දැනුමක් හෝ අවබෝධයක් නොමැතිවය. 01 වන විත්තිකරු වන සුරේෂ් ගුණසේන විසින් 02 වන විත්තිකරු වන අජිත් නිශාන්තව රැගෙන ගොස් මධුර නම් පාතාල කල්ලියේ සාමාජිකයෙකු අත්අඩංගුවට ගැනීමේ මුවාවෙන් මරණකරු වන ජෙරාඩ් මර්වින් ලුහුබැඳ යාම සිදු කොට ඇති බව පෙනේ. මෙතෙක් ඉදිරිපත් වූ සාක්ෂි අනුව 02 වන විත්තිකරු පෙර සිටම මේ සම්බන්ධව දැනුවත්ව සිටි බව අනාවරණය වන අතර ඔහු මරණකරු වූ ජෙරාඩ් හිඳ සිටි ආසනයේම පසුපස ආසනයේ හිඳ ගැනීමෙන් හා නිවැරදිව හඳුනා ගනිමින් ඔහුට වෙඩි තැබීම තුළින් 02 වන විත්තිකරු මරණකරුව දැන සිටි බව ද හොඳාකාරවම පැහැදිලි වේ.

පැමිණිල්ල වෙනුවෙන් ඉදිරිපත් වූ 01 වන සාක්ෂිකරු ලබා දුන් සාක්ෂි අනුව 02 වන විත්තිකරු විසින් මරණකරුට වෙඩි තැබීමෙන් අනතුරුව 01 වන විත්තිකරුගේ මෝටර් රථයට නැගීමෙන් පසුව ඇති වූ සංවාදයේදී 02 වන විත්තිකරු විසින් "ගිය වැඩේ හරි" ලෙස 01 වන විත්තිකරුට පැවසූ බව ප්‍රකාශ විය. ඊට 01 වන විත්තිකරුගේ ප්‍රතිචාරය වී ඇත්තේ "මම බලා ගන්නම්" යන්නයි. ඉන් පැහැදිලි වන්නේ මරණකරු වන ජෙරාඩ් මර්වින් ඝාතනය කිරීම පිළිබඳව 01 වන විත්තිකරු හා 02 වන විත්තිකරු මීට පෙර සැළසුම් කර ඇති බව හා කුමන්ත්‍රණය කර ඇති බවයි.

**මෙම සියලුම සාක්ෂි සළකා බැලීමේදී අධිකරණයට පෙනී ගොස් ඇත්තේ ජෙරාඩ් මර්වින් 02 වන විත්තිකරු විසින් වෙඩි තබා ඝාතනය කර ඇති බවත්, මෙම ඝාතනය 02 වන විත්තිකරු විසින් සිදු කොට ඇත්තේ 01 වන විත්තිකරුගේ උවමනාව මත නැතිනම් අනුබල කිරීම මත බවත්ය. මරණකරු ඝාතනය කිරීමට හේතුව වී ඇත්තේ පැහැදිලි වශයෙන්ම මරණකරු විසින් 01 වන විත්තිකරුට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයට හා මානව හිමිකම් කොමිසමට පැමිණිලි කිරීම නිසා ඇති වූ අමනාපයයි. තවද ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව අනුව 1994 අංක 22 දරන වධ දීමට හා අනෙකුත් කෲර අවමන්සහගත සැළකීමට එරෙහි සම්මුති පනත යටතේ මහාධිකරණයේ නඩුවක් පැවරීමට ද නියෝග කළ අතර එම නඩුවේදී මරණකරු විසින් සාක්ෂි ලබා දීම වැළැක්වීමට 01 වන විත්තිකරු විසින් දරන ලද සියලුම උත්සාහයන් ව්‍යර්ථ වූ තැන ඔහුව ඝාතනය කර ඇති බව පැහැදිලිය.**

මෙම නඩුවේ සිදුව ඇති සාවද්‍ය මනුෂ්‍ය ඝාතනය මිනීමැරුමක් බව පැමිණිල්ල විසින් ගෙන හැර දක්වා ඇති සියලුම සාක්ෂි මගින් මනාව ඔප්පු කොට ඇත. ඉහත විග්‍රහ කරන ලද සියලු කරුණු අනුව මෙම නඩුවේ චූදිතයින් වන මාකවිටගේ සුරේෂ් ගුණසේන හා පොල්වත්ත රතුබදුගේ අජිත් නිශාන්ත යන අය විසින් 2004-11-21 වන දින වත්තලදී වරාගොඩ මුදලිගේ ජෙරාඩ් මර්වින් පෙරේරාගේ මරණය සිදු කිරීමට අනුබල දීමේ පොදු පරමාර්ථයකින් යුතුව එකඟ වීමෙන් මිනී මැරීමට කුමන්ත්‍රණය කිරීමේ වරද සිදු කළ බවත් එහෙයින්;

***01 වන විත්තිකරු වන මාකවිටගේ සුරේෂ් ගුණසේන*** දණ්ඩ නීති සංග්‍රහයේ 113[13] හා 102[14] යන වගන්ති සමඟ කියවෙන දණ්ඩ නීති සංග්‍රහයේ 296 වගන්තිය[15] යටතේ අධිකරණය විසින් වරදකරු ලෙස තීරණය කොට ඇත.

***02 වන විත්තිකරු වන පොල්වත්ත රතුබදුගේ අජිත් නිශාන්ත*** විසින් වරාගොඩ මුදලිගේ ජෙරාඩ් මර්වින් පෙරේරාගේ මරණය සිදු කිරීම නිසා දණ්ඩ නීති සංග්‍රහයේ 296 වගන්තිය යටතේ වරදකරු ලෙස අධිකරණය තීරණය කොට ඇත.

ඒ අනුව මෙම නඩුවේ 01 වන හා 02 වන විත්තිකරුවන් දෙදෙනාටම අධිකරණය මරණීය දණ්ඩනය පනවන ලදී.

[13] යම් වරදක් සිදු කිරීමේදී හෝ සිදු කිරීම සඳහා නැතහොත් වරදකට අනුබල දීමේදී හෝ අනුබල දීම සඳහා පොදු අරමුණක් සහිතව කලින් සම්මතයක් හෝ පිළියෙල වීමක් ඇතිව හෝ නැතිව දෙදෙනෙකු හෝ ඊට වැඩි ගණනක් එක්ව යම් වරදක් සිදු කිරීමට හෝ ඊට අනුබල දීමට හෝ ක්‍රියා කිරීමට එකඟ වුවහොත්, ඒ වරද කිරීමට හෝ ඊට අනුබල දීමට කුමන්ත්‍රණය සිදු කිරීමේ වරද සඳහා අවස්ථාව පරිදි ඔවුන්ගෙන් එක් එක් කෙනෙක් වැරදිකාරයෙක් වේ.

[14] අනුබල දීමේ ප්‍රතිඵලයක් වශයෙන් අනුබල දෙනු ලැබූ ක්‍රියාව සිදු කළ විටද, එබඳු අනුබල දීමක් සඳහා දඬුවමක් පිළිබඳව විධිවිධානයක් මේ සංග්‍රහයෙන් ප්‍රකාශිතව සලස්වා නොමැති විට ද, එබඳු වරදකට අනුබල දෙන්නාට ඒ වරද සඳහා නියමිත දඬුවමෙන් දඬුවම් කළ යුතුය.

[15] මිනීමැරුම සිදු කරන තැනැත්තෙකුට මරණීය දඬුවමින් දඬුවම් කළ යුතුය.

# ජෙරාඩ්ගේ ඝාතනයෙන් පසුව මීගමුව මහාධිකරණයේ විභාග වෙමින් පැවති වධහිංසා නඩුවේ තත්වය ...

මෙම කථාවේ ආරම්භය සිදු වූවේ ජෙරාඩ් මර්වින් වත්තල පොලිසියේදී වධහිංසාවට ලක් වීමේ සිද්ධියකිනි. ඒ සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ පවරන ලද මූලික අයිතිවාසිකම් නඩුකරයේ නියෝගය අනුව නීතිපතිවරයා විසින් මීගමුව මහාධිකරණයේ 1994 අංක 22 දරන වධ දීමට හා අනෙකුත් කෲර අවමන්සහගත සැළකීමට එරෙහි සම්මුති පනත යටතේ නඩුවක් පවරන ලදී. ජෙරාඩ් විසින් එම නඩුවට සාක්ෂි දීමෙන් සත්‍ය හෙළි වන නිසා ඔහුව ඝාතනය කළේ එම නඩුවේම එක් විත්තිකරුවෙකු විසිනි. ජෙරාඩ්ව ඝාතනය කරන විට එම නඩුව මීගමුව මහාධිකරණයේ විභාග වෙමින් පැවතුණි.

**එච්. සී. 326/2003** අංකයෙන් මීගමුව මහාධිකරණයේ පැවරුණ මෙම නඩුවේ විත්තිකරුවන්ට එරෙහි චෝදනාව වූයේ **"2002 ජූනි මස 03 වන දින හෝ ඊට ආසන්න දිනක මෙම අධිකරණ බල සීමාව තුළ පිහිටි වත්තල පොලිස් ස්ථානය තුළදී සැක පිට පොලිස් අත්අඩංගුවට ගන්නා ලද වරාගොඩ මුදලිගේ ජෙරාඩ් මර්වින් පෙරේරා නමැත්තාගෙන් යම් තොරතුරක් හෝ පාපොච්චාරණයක් ලබා ගැනීම සඳහා හෝ, සහ එකී තැනැත්තා බිය ගැන්වීම හෝ ඔහුට බල කිරීම සඳහා වධ දෙමින් දණ්ඩ නීති සංග්‍රහයේ 32 වගන්තිය[16] සමඟ කියවිය යුතු 1994 අංක 22 දරන වද දීම සහ අනෙකුත් කෲර, අමානුෂික හෝ**

---

[16] සියල්ලන්ගේ පොදු අදහස ඉෂ්ට කර ගැනීම් වශයෙන් කීප දෙනෙකු විසින් අපරාධයක් කළ කල්හි තමා විසින් එය තනිවම කරන ලද්දක් සේ, එකී තැනැත්තන්ගෙන් එක් එක්කෙනාම එකී ක්‍රියාව සඳහා යටත් විය යුතුය.

**නින්දිත සැලකීමට හෝ දඬුවම්වලට එරෙහි වූ සම්මුති පනතේ 2(4) වගන්තිය [17]යටතේ දඬුවම් ලැබිය යුතු වරද සිදු කළ බවයි."**

උක්ත පනත යටතේ වධ දීම යන්නෙන් අදහස් කෙරෙන්නේ ජනරජය යටතේ වැටුප් ලබන රැකියාවක නියුක්ත රජයේ නිලධාරියෙකු හෝ නිල තත්වයෙන් කටයුතු කරන වෙනත් තැනැත්තෙකු විසින් හෝ එම තැනැත්තාගේ හෝ නිලධාරියාගේ කැමැත්ත ඇතිව හෝ ඔවුන්ගේ විරෝධය නැතිව පහත සඳහන් අරමුණුවලින් එකක් සාක්ෂාත් කර ගැනීම සඳහා කරනු ලබන ක්‍රියාවලියක ප්‍රතිඵලයක් වශයෙන් ශාරීරික හෝ මානසික වශයෙන් අධික වේදනාවක් යම්කිසි පුද්ගලයෙකුට ලබා දීමයි.

- යම්කිසි පුද්ගලයෙකුගෙන් හෝ තුන් වන පාර්ශ්වයන්ගෙන් යම් තොරතුරක් ලබා ගැනීමට කරනු ලැබූ යම් දෙයක්, හෝ
- යම් පුද්ගලයෙක් හෝ තුන් වන පාර්ශ්වයක් හෝ කරනු ලැබූ යම් ක්‍රියාවකට නැතහොත් එවැනි ක්‍රියාවක් කරන ලදැයි සැක කිරීම මත දෙන ලද දඬුවමක් හෝ,
- යම් පුද්ගලයෙකු තුන් වන පාර්ශ්වයක් බිය ගැන්වීම හෝ ඔහුට බල කිරීම සඳහා කරනු ලැබූ යම් ක්‍රියාවක්

මෙම නඩුවේ විත්තිකරුවන් හය දෙනෙකු[18] සිටි අතර ඔවුන් හය දෙනාම 2002-06-03 වන දින ජෙරාඩ් මර්වින් අත්අඩංගුවට ගැනීම සඳහා ගිය බව පිළිගෙන ඇත. ජෙරාඩ් අත්අඩංගුවට ගන්නා විට ඔහු යහපත් සෞඛ්‍ය තත්වයෙන් පසු වූ බවට ඔහුගේ බිරිඳ, ඔහුගේ සහෝදරයා සහ ඔහු අත්අඩංගුවට පත් වූ දින උදෑසන වැඩ මුරයේ ඔහු සමඟ සේවයේ යෙදුණු ඩොක්යාඩ් ආයතනයේ මුළුතැන්ගෙය භාර

---

[17] මෙම පනත යටතේ වූ යම්කිසි වරදක් සම්බන්ධව මහාධිකරණය ඉදිරියේ පැවති නඩු විභාගයකින් පසුව වරදකරු වූ චූදිතයෙකුට දෙයාකාරයකින් කවරාකාරයක වූ හෝ, අවුරුදු හතත්, දහයත් අතර කාල සීමාවක සිර දඬුවමකට හෝ රුපියල් 10000ත්, 50000ත් අතර දඩයකට හෝ දඬුවම් දෙකටම යටත් විය යුතුය.

[18] මාකවිටගේ සුරේෂ් ගුණසේන, ජයසිංහ ආරච්චිගේ නලින් චන්දිමාල් ජයසිංහ, හේරත් අධිකාරිලාගේ ප්‍රසාද් දිල්හාර පෙරේරා, හේරත් මුදියන්සේලාගේ අසේල කුමාර හේරත්, එදිරිසිංහ ආරච්චිගේ අමිල තුෂාන්ත, අධිකාරි මුදියන්සේලාගේ විනීත බණ්ඩාර (ජෙරාඩ්ගේ ඝාතන නඩුවේ විත්තිකරුවකු ලෙස මේ වන විට මරණ දණ්ඩනය ලබා ඇත්තේ මෙහි 01 වන විත්තිකරුය.)

විධායක නිලධාරිවරයාත් අධිකරණයේ සාක්ෂි ලබා දී ඇත. ඒ අනුව ඔහු අත්අඩංගුවට පත් වන අවස්ථාව වන විට යහපත් සෞඛ්‍ය තත්වයෙන් පසු වූ බව අධිකරණය ද පිළිගෙන ඇත.

කෙසේ වුවද ජෙරාඩ් අත්අඩංගුවට පත් වීමෙන් පසුව පොලිසිය විසින් පරීක්ෂණ කටයුතු මෙහෙයවන ලද ආකාරය පිළිබඳව ඇසින් දුටු සාක්ෂි කිසිවක් අධිකරණය ඉදිරියේ ඉදිරිපත් වී නැත. අත්අඩංගුවට පත් වීමෙන් පසුව පළමු වරට ඔහුගේ බිරිඳ ඔහුව දකින විට ඔහුගේ අත් දෙක කඩා වැටී, කම්මුල් ඉදිමී තිබුණ බවත්, ඇස් දෙක රතු වී තිබුණ බවටත්, ශරීරය සිව් ගුණයකින් පමණ ඉදිමී තිබුණ බවත් ජෙරාඩ්ගේ බිරිඳගේ සාක්ෂියෙන් ප්‍රකාශ විය.

ජෙරාඩ්ගේ සොහොයුරා ද ජෙරාඩ් බැලීමට වත්තල පොලිස් ස්ථානය වෙත ගොස් තිබුණ අතර ඔහුගේ සාක්ෂි අනුව කියවුණේ වත්තල පොලිස් ස්ථානයේ කිසිම සිර මැදිරියක් තුළ ජෙරාඩ් නොසිටි බවත්, තමා අපරාධ අංශය සමීපයේ සිටියදී උප පොලිස් පරීක්ෂක රේණුක නම් තැනැත්තා සහ තවත් පොලිස් කොස්තාපල්වරයෙකු විසින් ජෙරාඩ් මර්වින් අල්ලා ගෙන පොලිස් ස්ථානාධිපතිවරයාගේ කාමරයට රැගෙන යනු තමා දුටු බවත්ය. එම අවස්ථාවේ ජෙරාඩ් හඳුනා ගැනීමට නොහැකි තරම් කළු පැහැ වී සිටි අතර ඉතාම අපහසුතාවයෙන් ඔහු ඇවිද ගිය බවත් ඔහු තම සාක්ෂියේදී පවසා ඇත. ජෙරාඩ්ගේ සහෝදරයා පසුව දෙවන වතාවටත් වත්තල පොලිසියට ගොස් ඇති අතර එවිට පොලිස් කොස්තාපල්වරයෙකු හා තවත් අයෙකු ජෙරාඩ්ට සිද්ධාලේප ආලේප කරමින් සිටි බවත්, ඔහුගේ අත් දෙකම පණ නැති ස්වභාවයෙන් පැවති බවත් වැඩිදුරටත් සාක්ෂි දෙමින් මොහු පවසා ඇත. ජෙරාඩ්ව වත්තල පොලිස් ස්ථානයෙන් මුදා හැරිය පසුව ඔහුගේ බිරිඳ හා සහෝදරයා විසින් ඔහුව යක්කල ආයුර්වේදය වෙත ගෙන යන අවස්ථාවේ ඔහුට කථා කිරීමට හැකියාවක්වත් නොතිබුණ අතර වාහනයේ අසුන මත වාඩි වීමට පවා අපහසු වූ බව මොහුගේ සාක්ෂියෙන් කියවුණි. මේ අනුව අධිකරණය ඉදිරියේ ඉදිරිපත් වූ සියලුම සාක්ෂි අනුව ජෙරාඩ් පොලිස් අත්අඩංගුවේ සිටියදී වධහිංසාවට ලක්ව ඇති බව පැහැදිලි විය.

රෝහල්ගතව සිටියදී ජෙරාඩ්ව පරීක්ෂාවට ලක් කළ සහකාර අධිකරණ වෛද්‍ය නිලධාරි විජේවර්ධන මහතා ද මෙම නඩුවේදී සාක්ෂි ලබා දී ඇති අතර ඒ අනුව වෛද්‍යවරයා විසින් ජෙරාඩ්ව පරීක්ෂා කරන අවස්ථාවේදී ඔහුට සාමාන්‍ය පරිදි අත් චලනය කිරීමේ හැකියාව ද නොවුණ බවත් වෛද්‍යවරයා විසින් තමාගේ ඇඟිලි දෙකක් දිගු කොට ජෙරාඩ්ට අල්ලන ලෙස පැවසුවත් එසේ අල්ලා ගැනීමට තරම් හැකියාවක්වත් ඔහුට නොවුණ බවත් වෛද්‍යවරයාගේ සාක්ෂියෙන් කියවිණි. තවද මෙම වෛද්‍යවරයාගේ සාක්ෂිය අනුව ජෙරාඩ්ගේ ශරීරයේ තුවාල හයක් දක්නට ලැබී ඇත. එම තුවාල අතරින් දෙකක් ගිනි කූරුවලින් සිදු කරන ලද පිළිස්සුම් තුවාල වූ අතර තවත් තුවාල දෙකක් කඹයකින් ගැට ගසා එල්ලා තිබීම නිසා මැනික් කටු දෙකෙහි ඇති වූ තුවාල වශයෙන් ද වෛද්‍යවරයා තම දැනුම අනුව ප්‍රකාශ කළේය. වම් කකුලෙහි තවත් තුවාලයක් තිබුණ අතර එය යකඩ පොල්ලකින් පහර දීම නිසා හට ගත් තුවාලයක් ලෙසත්, ජෙරාඩ්ගේ අත් දෙක අප්‍රාණික වීමට හේතුව වී ඇත්තේ ඔහුගේ අත් පිටුපසට කර මැනික් කටුවලින් එල්ලා තිබීම නිසා විය හැකි බවත් ඔහු ප්‍රකාශ කළේය. ඒ අනුව ජෙරාඩ්ගේ රෝග ඉතිහාසය[19] සමඟ තුවාලවල ස්වභාවය ගැළපෙන බව වෛද්‍යවරයාගේ අදහස විය.

තවදුරටත් මෙම නඩුවේදී වෛද්‍ය මහාචාර්ය රවින්ද්‍ර ප්‍රනාන්දු මහතා තම වෘත්තිය දැනුම, පළපුරුද්ද හා නිපුණත්වය උපයෝගී කර ගනිමින් අධිකරණය ඉදිරියේ සාක්ෂි ලබා දී ඇත. ජෙරාඩ් නවලෝක රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ලබා ගන්නා අතරතුර ඔහුට ඩොලබින් නමැති වේදනා නිවාරණ ඖෂධය ලබා දී ඇති අතර එය ලබා දෙන්නේ අධික වේදනාවෙන් පසු වන රෝගින්ටය. තමා නිරීක්ෂණය කළ ආකාරයට පහර දීම නිසා හා අත් දෙකින් එල්ලා තිබීම නිසා මෙබඳු රෝග ලක්ෂණ දක්නට ලැබිය හැකි බව ද වෛද්‍ය මහාචාර්ය රවින්ද්‍ර ප්‍රනාන්දු මහතා වැඩිදුරටත් තම සාක්ෂියේදී ප්‍රකාශ කළේය. මෙම විශේෂඥ වෛද්‍යවරයාගේ සාක්ෂියෙන් අනාවරණය වූයේ ද ජෙරාඩ් පොලිස් භාරයේ සිටියදී ඉතා දරුණු ලෙස වධ හිංසාවට ලක් වී ඇති බවයි.

---

[19] වින්දිතයෙකු තමාට හිංසනය සිදු වූ ආකාරය පිළිබඳව කියන කථාව

**ඉන් පසුව අධිකරණය අවධානය යොමු කොට ඇත්තේ ජෙරාඩ් වධ හිංසාවට ලක් කොට ඇත්තේ කවුරුන් විසින් ද යන කරුණට සළකා බැලීමටයි.**

2002-06-02 වන දින උප පොලිස් පරීක්ෂක සුරේෂ් ගුණසේන තවත් නිලධාරින් කිහිප දෙනෙකු සමඟ ජෙරාඩ් අත්අඩංගුවට ගැනීමට පොලිස් ස්ථානයෙන් පිටව ගිය බවත් එදිනම පිටත්ව ගිය සියලුම පොලිස් නිලධාරින් අත්අඩංගුවට ගත් ජෙරාඩ් ද සමඟ නැවත පොලිස් ස්ථානයට වාර්තා කළ බවත් පොලිස් පොතේ සඳහන් වන බවට අධිකරණය ඉදිරියේ සාක්ෂි ඉදිරිපත් වී ඇත.[20] එසේ නැවත පැමිණීමෙන් පසුව සුරේෂ් ගුණසේන විසින් උප සේවා පොලිස් කොස්තාපල් රත්නායක නම් තැනැත්තාට ජෙරාඩ්ව භාර දී ඇති බව ද සාක්ෂි අනුව අනාවරණය වී ඇත.

උප සේවා පොලිස් කොස්තාපල් රත්නායකගේ සාක්ෂි අනුව ජෙරාඩ්ව ඔහු වෙත භාර දෙන අවස්ථාව වන විට ඔහුගේ ශරීරයේ කිසිදු තුවාලයක් නොතිබුණ බවත්, ජෙරාඩ්ට පහර දුන් බවට හෝ හිරිහැර කළ බවට කිසිදු පැමිණිල්ලක් සිදු නොකළ බවත් අනාවරණය විය. ඉන් පසුව විනාඩි විස්සකින් පමණ පසුව උප සේවය වෙනත් නිලධාරියෙකුට භාර කළ බව සාක්ෂි වලින් ප්‍රකාශ වූ නමුත් එසේ බාර ගත් නිලධාරියා නිසැකවම හඳුනා ගෙන නැත. **අධිකරණයේ මතය වන්නේ එම අපැහැදිලිතාව මත මෙම නඩුවේ නිවැරදි විනිශ්චයකට පැමිණීම අපහසු බවයි.**

විත්තියේ සාක්ෂිකරුවකු ලෙස එවකට වත්තල පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයා වශයෙන් සේවය කළ සේන සූරවීර ද විත්තිය වෙනුවෙන් සාක්ෂි සඳහා කැඳවා ඇත. ඔහුගේ සාක්ෂි අනුව ජෙරාඩ් ත්‍රිපුද්ගල මනුෂ්‍ය ඝාතනයකට සැක පිට 2002-06-03 වන දින උප සේවයට භාර දුන් බවත් ඔහුව වත්තල පොලිසියේ සිර මැදිරියේ රඳවා තිබුණ බවත් අනාවරණය විය. තවදුරටත් සාක්ෂි දෙමින් පොලිස් ස්ථානාධිපතිවරයා කියා සිටියේ සිරිතක් වශයෙන් කෙරෙන

[20] H.C. 326/2003, මහාධිකරණ නඩු වාර්තාව, පිටු අංක 18

පරිදි තමා සිරකරුවන්ගෙන් ප්‍රශ්න කළ බවත් සිරකරුවන්ගෙන් ප්‍රශ්න කරන අවස්ථාවේදී ඔවුන්ට කිසිවෙකුගෙන් හිරිහැර සිදු වූ බවට පැමිණිල්ලක් නොලැබුණ බවත්ය. මොහුගේ සාක්ෂිය අනුව ජෙරාඩ් සිර මැදිරිය තුළ ද යහපත් සෞඛ්‍ය තත්වයේ සිටියේ නම් පොලිස් ස්ථානයෙන් මුදා හැරි විගසම රෝහල්ගත කිරීමට තරම් ඔහු රෝගාතුර වුයේ කෙසේද යන ගැටලුව අධිකරණය ඉදිරියේ මතු වේ.

මෙම සිද්ධිය සම්බන්ධයෙන් **SCFR 328/02** අංකයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ පැවති මූලික අයිතිවාසිකම් නඩුවේ 01 වන වගඋත්තරකරු වූයේ එවකට වත්තල පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයා වූ සේන සුරවීරය. මහාධිකරණ නඩුවේ ද සේන සුරවීර 04 වන වගඋත්තරකරු ලෙස මුල් අවස්ථාවේදී නම් කොට තිබුණත් පසුව අධිචෝදනා පත්‍රය සංශෝධනය කර ඔහු මෙම නඩුවෙන් ඉවත් කර ඇත. **නමුත් ඔහුව මෙම නඩුවෙන් ඉවත් කර ඇත්තේ ඇයිද යන කරුණ අධිකරණය ඉදිරියේ ගැටළුවක් ලෙස පවතී.**

ජෙරාඩ්ගේ බිරිඳ හා සොහොයුරා ලබා දුන් සාක්ෂි අනුව ඔවුන් ජෙරාඩ් අත්අඩංගුවට ගත් දිනට පසු දින ප්‍රාදේශීය සභා සභාපති ත්‍යාගි අල්විස් ද සමග වත්තල පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයා හමු වී ජෙරාඩ්ව මුදා හරින ලෙස ඉල්ලීමක් කොට ඇත. එම පොලිස් ස්ථානයේ පොලිස් පරීක්ෂකවරයෙකු වූ නවරත්න මෙම නඩුවේදී සාක්ෂි දෙමින් ප්‍රකාශ කර ඇත්තේ පොලිස් ස්ථානාධිපතිවරයා විසින් තමාට ප්‍රාදේශීය සභා සභාපති ත්‍යාගි අල්විස් ඇපකරුවෙකු වශයෙන් යොදවා ජෙරාඩ්ට ඇප ලබා දෙන ලෙස නියෝග කළ බවයි. නමුත් තමා එසේ නියෝග කළ බව වත්තල පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයා ප්‍රතික්ෂේප කරයි. **ත්‍යාගි අල්විස් පැමිණිල්ලේ සාක්ෂිකරුවෙකු ලෙස කැඳවූයේ නම් විනිශ්චයකට එළඹීම සඳහා එය වඩාත් වැදගත් ස්වාධීන සාක්ෂියක් වන නමුත් ඔහුව පැමිණිල්ල මඟින් සාක්ෂියක් ලෙස කැඳවා ද නැත.**

ජෙරාඩ්ගේ සෙහොයුරා සාක්ෂි දෙමින් උප පොලිස් පරීක්ෂක රේණුක හා තවත් පොලිස් කොස්තාපල්වරයෙකු විසින් ජෙරාඩ්ව අල්ලා ගෙන පොලිස් ස්ථානාධිපතිවරයාගේ කාමරයට රැගෙන යනු දුටු බවට පවසා ඇතත් **මෙම නඩුවේදී උප පොලිස් පරීක්ෂක රේණුක හෝ**

**පොලිස් කොස්තාපල්වරයා සාක්ෂිකරුවන් ලෙස කැඳවා නැත. එම සාක්ෂිකරුවන් මෙම නඩුවට කැඳවූයේ නම් සත්‍ය සිද්ධිය අනාවරණය කර ගැනීම අධිකරණයට පහසු වනු ඇත.**

කෙසේ වුවද ඉදිරිපත්ව ඇති සාක්ෂි අනුව අධිකරණයට පෙනී ගොස් ඇත්තේ ජෙරාඩ් 2002-06-03 වන දින වත්තල පොලිස් ස්ථානයේ උප සේවයට භාර දීමෙන් පසුව ඔහු ශාරීරික වධ හිංසාවන්ට ලක් වී තිබෙන නමුත් ඔහුව වධ හිංසාවට ලක් කොට ඇත්තේ මෙම නඩුවේ නම් කොට ඇති වගඋත්තරකරුවන් විසින් වන බව සාධාරණ සැකයෙන් ඔබ්බට[21] ඔප්පු වී නොමැති බවයි. මෙම නඩුවේ වගඋත්තරකරුවන් ලෙස නම් කොට ඇති පුද්ගලයින්ට අමතරව තවත් පොලිස් නිලධාරීන් ජෙරාඩ් සමඟ ගැටුන බවට සාක්ෂි ඉදිරිපත් වී ඇති අතර එම තැනැත්තන්ගේ ක්‍රියාවක ප්‍රතිඵලයක් ලෙස ජෙරාඩ්ට මෙම අනතුර සිදු වුණි ද යන සැකය අධිකරණය ඉදිරියේ මතුව ඇත. එබැවින් මෙම සැකයේ වාසිය විත්තිකරුවන්ට ලැබෙන අතර ඔවුන් වරදකරුවන් බව සාධාරණ සැකයෙන් ඔබ්බට ඔප්පු කරන තාක් කල් ඔවුන් නිර්දෝෂී වේ. එබැවින් මෙම නඩුවේදී අදාළ වගඋත්තරකරුවන් වරදකරුවන් වන බවට පැමිණිල්ල විසින් සාධාරණ සැකයෙන් ඔබ්බට ඔප්පු කොට නොමැති බැවින් එවකට මහාධිකරණ විනිසුරුවරිය වූ ජේ. එම්. ටී. එම්. පී. යූ. තෙන්නකෝන් මැතිණිය විසින් ඔවුන් නිදොස් කොට නිදහස් කර ඇත.[22]

[21] වරදක් කර ඇති බවට අධිකරණය ඉදිරියේ ඔප්පු කරන තෙක් විත්තිකරුවෙකු නිර්දෝෂී බව නීතිය පිළිගනී. පැමිණිලිකරු විසින් විත්තිකරු වරද සිදු කළ බව කිසිදු සැකයක් නොමැතිව ඔප්පු කළ යුතුය.

[22] 2008-04-02 වන දිනැති මීගමුව මහාධිකරණ නඩු අංක HC 326/03 නඩු වාර්තාවේ පිටු අංක 31

# උක්ත නඩු තීන්දුව කෙතරම් යුක්තිසහගත ද?...

මහාධිකරණ විනිසුරුවරිය වූ ජේ.එම්.ටී.එම්.පී.යූ. තෙන්නකෝන් මැතිණිය ප්‍රදානය කළ **එච්. සී. 326/2003** නඩු තීන්දුව තුළ සාධාරණ තීන්දුවකට එළඹීම සඳහා සළකා බැලිය යුතු බොහෝ කරුණු මඟ හැරී ගොස් ඇති බව පෙනී යයි. මෙම නඩුවේදී ඉදිරිපත් වූ සාක්ෂි අනුව පැහැදිලිව පෙනී යන්නේ 2002 ජූනි මස 02 වන දින 01 වන විත්තිකරු වන සුරේෂ් ගුණසේන හා තවත් නිලධාරින් පස් දෙනෙකු විසින් ජෙරාඩ්ව අත්අඩංගුවට ගෙන ඇති බවත් පසු දින මුදා හරින තෙක් ඔහු, ඔවුන් භාරයේ සිට ඇති බවත්ය. ජෙරාඩ් පොලිස් ස්ථානය තුළ සිටි කාල සීමාව මුළුල්ලේම ඔහුගෙන් ප්‍රශ්න කොට ඇත්තේ ඔහුව අත්අඩංගුවට ගත් පොලිස් නිලධාරින් කණ්ඩායම පමණක් බවද සාක්ෂි මඟින් තහවුරු විය.

අත්අඩංගුවට ගන්නා අවස්ථාවේ දී යහපත් සෞඛ්‍ය තත්වයෙන් පසු වූ ජෙරාඩ් අත්අඩංගුවෙන් මුදා හරින අවස්ථාවේදී අසාධ්‍ය ලෙස රෝගාතුරව සිටියේ නම් නීතියේ පිළිගන්නා එලන්බරෝ[23] නම් සිද්ධාන්තය අනුව ජෙරාඩ්ව අත්අඩංගුවේදී රඳවා තබා ගත් නිලධාරින්ට තම නිර්දෝශීභාවය පෙන්නුම් කිරීමට වගකීමක් පැවරෙයි. නමුත්

---

[23] එලන්බරෝ න්‍යාය රජු එරෙහි කොක්රේන් නඩුවේ දී එලන්බරෝ සාමිවරයා විසින් කළ පහත ප්‍රකාශය මත පදනම් වී ඇත.

"...සාමාන්‍යයෙන් අපරාධයක විත්තිකරුවෙකු ඔහුගේ හැසිරීම හා ඔහු පිළිබඳ සැකයට භාජනය වී ඇති කරුණු පිළිබඳව පැහැදිලි කිරීමක් කිරීමට බැඳී නැත. එහෙත් යමෙකුට විරුද්ධව මූලික නඩුවක් ඇති බව ඒත්තු ගැන්නුනාට පසුව ඔහුට සාක්ෂි දීමේ බලය පවතිද්දී ඔහු විසින් ඔහුගේ සැක කටයුතු ක්‍රියා කලාපය පිළිබඳව ඇති වී ඇති සාංකාව වැරදි බව පෙන්නුම් කිරීමටත් ඔහුගේ නිර්දෝශීභාවය පිළිබඳව පැහැදිලි කිරීමටත් හැකියාව තිබියදීත් ඔහු එසේ නොකරන්නේ නම් එසේ සාක්ෂි යටපත් කිරීම කරනු ලබන්නේ එසේ නොකළහොත් ඔහුට විරුද්ධව එම සාක්ෂිවලින් අගතියක් වේ යැයි සිතන නිසා බවට නිගමනය කිරීම බුද්ධිමත් හා සාධාරණ වේ.", රජු එරෙහි කොක්රේන්, 1814 ගණිස් වාර්තාවේ 499 පිටුව

මෙහිදී විත්තිකරුවන් විසින් තම භාරයේ සිටි ජෙරාඩ් වධහිංසාවට ලක් වූයේ කෙසේද යන්න පැහැදිලි කිරීමට හෝ එම වධහිංසාවට ලක් කිරීමට තමන් සම්බන්ධ නොවූ බව පෙන්වීමට නිදහසට කරුණු හෝ ඉදිරිපත් කර නැත.

යමෙකුට විරුද්ධව මූලික නඩුවක් ඇති බවට පැමිණිල්ල පැහැදිලිව කරුණු ඉදිරිපත් කර ඇති විට විත්තිකරු තමාට විරුද්ධව හට ගෙන ඇති සැකය දුරු කිරීමට අවශ්‍ය කරුණු හෙළිදරව් කිරීම පැහැර හරින්නේ ඔහු දන්නා කරුණු හෙළිදරව් කිරීමෙන් තමාට අගතියක් විය හැකි බවට වන බිය නිසාය. මේ පිළිබඳව ඉන්දීය ශ්‍රේෂ්ඨාධිකරණය දරන මතය **<u>නිලබාති බෙහෙර හෙවත් ලලිත් බෙහෙර</u>** **එදිරිව** **<u>ඔරිස්සා රාජ්‍ය හා වෙනත් අය [24]</u>** නඩුවේදී මෙසේ දක්වා ඇත.

> *"... 1987-12-01 වන දින උදේ 8ට පමණ පොලිසිය විසින් සුමන්බෙහෙර අත්අඩංගුවට ගෙන ඇති අතර ඊට පසු දින ඔහුගේ මළ සිරුර ජකයි කෙලා පොලිස් මුර පොල අසළ රේල් පාරක තිබී හමු විය. ඔහුගේ මරණය තුවාල ගණනාවක් සිදු වීමෙන් කෙරුණ අස්වාභාවික මරණයකි. මෙහිදී ඉතා පැහැදිලිව සුමන්බෙහෙර ඔහුගේ මරණයට හේතු වූ තුවාල ලැබුවේ කෙසේද යන්න විස්තර කිරීමේ භාරය වගඋත්තරකරුවන් (පොලිසිය) වෙත පැවරේ. තමන්ගේ නිර්දෝශීභාවය පෙන්නුම් කිරීමට වගඋත්තරකරුවන් විසින් පිළිගත හැකි පැහැදිලි කිරීමක් නොකරන්නේ නම් එයින් ස්වභාවිකව පැන නැගෙන නිගමනය නම් පොලිස් භාරකාරත්වයේ සිටි සුමන්බෙහෙර ලැබූ මරණීය තුවාලවලට වගකීම වගඋත්තරකරුවන් වෙත පැවරෙන බවය."*

ඉහත ඉන්දීය නඩුවේ දී පිළිගෙන ඇති සිද්ධාන්තය ජෙරාඩ්ගේ නඩුවට ද ආදේශ කළහොත් ජෙරාඩ්ව අත්අඩංගුවෙන් මුදා හරින විට ඔහුගේ අභ්‍යන්තරය දක්වා විහිද ගිය ඉතා අසාධ්‍ය තත්වයේ තුවාල වූ බවට වෛද්‍ය සාක්ෂි මඟින් ද අනාවරණය වී ඇති බැවින් එබඳු

[24] Case No: 1993 AIR 1960, Date of judgement 24-03-1993

තත්වයකදී විත්තිකරුවන් විසින් තමන් ජෙරාඩ්ට තුවාල සිදු නොකළ බවට පිළිගත හැකි පැහැදිලි කිරීමක් නොකරන්නේ නම් ඔවුන් ජෙරාඩ්ගේ මරණීය තුවාලවලට වගකිව යුතුය. මන්ද ජෙරාඩ් අත්අඩංගුවට ගත් අවස්ථාවේ සිට මුදා හරින තෙක්ම විත්තිකරුවන්ගේ භාරයේ සිටි බැවිනි. නමුත් එම කරුණ ගරු මහාධිකරණ විනිසුරුවරිය උක්ත තීන්දුවේදී අවධානයට ලක් කොට නැත.

මෙම නඩුවේ දී විත්තිකරුවන් විත්ති කූඩුවේ සිට[25] ප්‍රකාශ කොට ඇත්තේ ඔවුන් ජෙරාඩ්ව අත්අඩංගුවට ගෙන පොලිසිය වෙත ගෙන යන අතරතුර තේ බීමට තේ කඩයක් සමීපයේ නතර කළ බවත් එම අවස්ථාවේදී ජෙරාඩ් පොලිස් රථයෙන් පැන දිවූ බවත්ය. එසේ දුවන විට ජෙරාඩ් අවස්ථා කීපයකදීම බොරළු පාර මත ඇද වැටී තුවාල වූ බව ද ඔවුන්ගේ ප්‍රකාශයන්ගෙන් කියවිණි. නමුත් මෙම නඩුවේදීම සාක්ෂි දුන්, ජෙරාඩ්ව පොලිසියට රැගෙන ආ පසු ඔහුව භාර ගෙන සටහන් යෙදූ උප පොලිස් කොස්තාපල් රත්නායක නම් නිලධාරියා කියා සිටියේ තමා ජෙරාඩ්ව භාර ගන්නා අවස්ථාවේදී ඔහුට කිසිදු තුවාලයක් සිදු වී නොතිබුණ බවයි.

එසේම නවලෝක රෝහලේ දී ජෙරාඩ්ව පරීක්ෂා කළ මහාචාර්ය වෛද්‍ය රවින්ද්‍ර ප්‍රනාන්දු මහතාගෙන් පැමිණිල්ල වෙනුවෙන් පෙනී සිටි සොලිසිටර් ජෙනරල්වරයා, ජෙරාඩ්ගේ ශරීරයේ ඇති තුවාලවල ස්වභාවය ඔහු අත්අඩංගුවෙන් මිදී පළා යන විටක ඔහුව නැවැත්වීමට යොදන ලද අවම බලයක[26] ප්‍රතිඵලයක් ලෙස ඇති වූවන්

[25] සාක්ෂි ආඥා පනතේ 120(6) වගන්තිය අනුව විත්තිකරුවෙකුට විත්ති කූඩුවේ සිටම තමා වෙනුවෙන් සාක්ෂි ලබා දිය හැකිය. නමුත් මෙහිදී සාක්ෂි කූඩුවේ සිට සාක්ෂි දීමේදී මෙන් සත්‍ය ප්‍රකාශ කරන බවට දිවුරුම් දීමක් සිදු නොවන අතර හරස් ප්‍රශ්න ඇසීම ද සීමාසහිත වේ. සාක්ෂි කූඩුව තෝරා ගැනීමට අවස්ථාව තිබියදීත් විත්තිකරුවෙකු දිවුරුම් දීමකින් තොරව හා හරස් ප්‍රශ්නවලට ලක් නොවී සාක්ෂි ඉදිරිපත් කිරීමට විත්ති කූඩුව තෝරා ගැනීම තුළ එම සාක්ෂිවල විශ්වාසනීයත්වය පිළිබඳව සිතා බැලිය යුතු බවට විනිසුරු විසින් ජූරි සභාවට මඟපෙන්වීමක් කළ යුතුය.

[26] අපරාධ නඩු විධාන සංග්‍රහයේ 23(2) වගන්තිය අනුව යම් සිරකරුවකුව අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදී ඔහු එයට බලහත්කාරයෙන් ප්‍රතිරෝධය දක්වුවහොත් හෝ අත්අඩංගුවට ගනු ලැබීම මඟ හැරීමට තැත් කළහොත්, එම සැකකරුව අත්අඩංගුවට ගැනීම සඳහා සාධාරණ ලෙස අවශ්‍ය උපක්‍රම යෙදිය හැකිය.

ද යන්න විමසා සිටි විට වෛද්‍යවරයා ප්‍රකාශ කොට ඇත්තේ එම තුවාල අවම බලය යෙදීමකින් ඇති වූ තුවාල විය නොහැකි බවයි.[27] සාක්ෂිවල ඇති මෙම පරස්පරතාව මතම විත්තිකරුවන් අසත්‍ය ප්‍රකාශ කරන බවට සාධාරණ සැකයක් මතු වී ඇත. නමුත් ගරු මහාධිකරණ විනිසුරුතුමිය මෙම නඩුවේ සාක්ෂි විශ්ලේෂණයේදී එම සැකය හඳුනා ගෙන නොමැති බව පෙනී යයි.

විත්තිකරුවෙකු විසින් අධිකරණයක දී අසත්‍ය කරුණු ඇතුළත් සාක්ෂියක් ලබා දීමේදී ඔහු එසේ අසත්‍ය ප්‍රකාශ කිරීමට හේතුව ද අධිකරණයට වැටහිය යුතු බව නඩු තීන්දු ගණනාවක දී පිළිගෙන ඇත. **<u>රජු</u> එරෙහි <u>ලූකස්</u>** [28] නඩුවේදී ලේන් සාමිවරයා මෙසේ ප්‍රකාශ කොට ඇත.

> *"අධිකරණයේ දී බොරුවක් පැවසීම; පළමුවැනිව මනා ලෙස සිතාමතා සිදු කරන්නක් විය යුතුය. දෙවැනිව එය වැදගත් ප්‍රශ්නයක් හා සම්බන්ධ විය යුතුය. තුන්වැනුව බොරුව කීම සඳහා වන පෙළඹවීම වරදකාරිත්වය වටහා ගැනීමක් සහ සත්‍ය වෙත ඇති බියක් විය යුතුය. යම් කිසි හේතුවක් නිසා හෝ ලජ්ජාව නිසා හෝ සිය පවුල්වලින් නින්දිත හැසිරීම් වසන් කිරීමේ උත්සාහයක් නිසා මිනිසුන් ඇතැම් විට බොරු කියන බව යෝග්‍ය නඩුවලදී ජූරියට සිහි කැඳවිය යුතුය. "*

ලේන් සාමිවරයා දරන ලද මතයම **<u>අජිත් සමරකෝන්</u> එරෙහි <u>සමූහාණ්ඩුව[29]</u>, <u>කරුණානායක</u> එරෙහිව <u>කරුණාසිරි පෙරේරා[30]</u>** යන

---

[27] නඩු පිටපතෙහි 263 පිටුව

[28] (1981) 2 ALL ER 1008, 1011page

[29] "වැදගත් ප්‍රශ්නයක් සම්බන්ධයෙන් මිය ගිය තැනැත්තිය විසින් විත්තිකරුට ලියන ලද පෙම් හසුන් පිළිබඳ විත්තිකරු හිතාමතාම බොරුවක් කීවේ ඇත්ත කීවේ නම් තමන් විසින්ම තමන්ගේ ඉරණම විසඳන බව ඔහු දැන සිටි හෙයිනි." (2004) 2 SLR 210

[30] (1986) 2 SLR 27

නඩුවලදී ද අධිකරණය අනුගමනය කොට ඇත. ජෙරාඩ් වධ හිංසාවට ලක් කිරීමෙන් පසු ඇති වූ තුවාල, අත්අඩංගුවෙන් මිදී පලා යාමේදී බිම ඇද වැටීමෙන් හට ගත් තුවාල බවට වන රක්ෂණය යොදා ගැනීමට මෙම විත්තිකරුවන් විසින් සැලසුම් කොට අසත්‍ය ප්‍රකාශයන් ලබා දී ඇති බව පැහැදිලිවම පෙනී ගියත් උගත් මහාධිකරණ විනිසුරුවරිය එය හඳුනා ගැනීමට අපොහොසත් වී ඇති බව පෙනී යයි. මෙම නඩුවේ විත්තිකරුවන් විසින් අධිකරණයේ දී එසේ අසත්‍ය ප්‍රකාශ කරනුයේ තමා විසින් සිදු කොට ඇති වරද අනාවරණය වීම වැළැක්වීමට වන බවටත්, සත්‍ය ප්‍රකාශ කළහොත් තමාට හානියක් වන බව දන්නා නිසාත්ය. නමුත් එය මහාධිකරණ විනිසුරුවරිය විසින් අවබෝධ කොට ගැනීමට අසමත් වී ඇති බව පෙනේ.

මෙම සිද්ධිය සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ විභාග වූ **SCFR 328/2002** නඩු තීන්දුවේ දී විත්තිකරුවන් විසින් ජෙරාඩ් තුවාල වීමට බලපෑ හේතු ලෙස දක්වන ලද කරුණු සියල්ල ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරයා විසින් උපහාසයෙන් යුතුව ප්‍රතික්ෂේප කොට ඇත. සාමාන්‍යයෙන් ලංකාවේ නීතිය තුළ ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවකදී යම් කරුණක් සම්බන්ධයෙන් පැමිණි තක්සේරුවක් එලෙසින්ම පිළිගැනීමට පහළ අධිකරණයක විනිසුරුවරයෙකු බැඳී නොසිටියත් මෙම නඩු තීන්දුවේදී ජෙරාඩ් අසාධ්‍ය ලෙස තුවාල ලැබීමට හේතු ලෙස විත්තිකරුවන් විසින් ඉදිරිපත් කරන ලද කරුණු සත්‍ය ලෙස තමා පිළිගන්නේ මන්ද යන්නවත් අඩු තරමින් මෙම නඩු තීන්දුවේදී ගරු විනිසුරුවරිය සඳහන් කර නැත.

තවද විත්තිකරුවන් විසින් මෙම ප්‍රකාශයන් සිදු කොට ඇත්තේ විත්ති කූඩුවේ සිට වන අතර එවැනි අවස්ථාවක දිවුරුම් දීමකින් තොරව එම ප්‍රකාශ ලබා දෙන නිසාත්, හරස් ප්‍රශ්නවලට භාජනය වීමක් සිදු නොවන නිසාත් එම ප්‍රකාශයන් තමා පිළිගන්නේ මන්ද යන්න විශේෂයෙන්ම හේතු සහිතව විනිසුරුවරයා විසින් තීන්දුවේදී දැක්විය යුතුය. නමුත් එම ප්‍රකාශයන් සියල්ල ගරු විනිසුරුවරිය කිසිදු තක්සේරු කිරීමකින් තොරව ඔප්පු කරන ලද කරුණු ලෙස පිළිගෙන ඇත.

එවකට වත්තල පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයා වූ සේන සුරවීර මුල් අවස්ථාවේ ජෙරාඩ් වධ හිංසාවට ලක් කිරීම සම්බන්ධයෙන්

මෙම නඩුවේ වගඋත්තරකරුවකු ලෙස නම් කොට තිබුණත් පසුව නීතිපතිවරයා විසින් අධි චෝදනා පත්‍රය සංශෝධනය කොට ඔහුට විරුද්ධව ඇති නඩුව ඉවත් කර ගෙන ඇත. එය නීතිපතිවරයා අතින් සිදු වූ බරපතල වරදක් බව පැහැදිලිය. මන්ද පොලිස් ස්ථානයක ස්ථානාධිපතිවරයා යනු එම පොලිස් ස්ථානය තුළ සිදු වන සියලු ක්‍රියාවන් සම්බන්ධයෙන් අවධානයෙන් සිටිය යුතු හා වග කිව යුතු නිලධාරියෙකි. මෙම නඩුවේදී ඉදිරිපත් වූ සාක්ෂි අනුව ජෙරාඩ්ව පොලිස් ස්ථානයට රැගෙන ආ අවස්ථාවේදීත් ඔහුට වධ හිංසා කරනු ලැබුවා යයි කියන ඉදිරි පැය කිහිපයේදීත් පොලිස් ස්ථානාධිපතිවරයා පොලිස් ස්ථානය තුළම රැඳී සිටි බව අනාවරණය විය. පොලිස් ස්ථානාධිපතිවරයා වශයෙන් ඔහු යටතේ සිටි නිලධාරින් අධීක්ෂණය කිරීමේ හා පාලනය කිරීමේ බලය පවතින්නේ ඔහුටය. එබැවින් මෙම සිද්ධියේදී ජෙරාඩ් පොලිස් ස්ථානය තුළ දී වධ හිංසාවට ලක් වූයේ නම් ඒ සම්බන්ධව පොලිස් ස්ථානාධිපතිවරයා ද පැහැදිලිවම වග කිව යුතුය.

වත්තල පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයා මෙම නඩුවේ වගඋත්තරකරුවෙකු ලෙස නම් කොට නොතිබීම ද මහාධිකරණ විනිසුරුවරිය මෙම නඩුවේ තීන්දුවට එළඹීමේදී සළකා බලා ඇත. ස්ථානාධිපතිවරයා මෙම නඩුවේ වගඋත්තරකරුවෙකු ලෙස නම් නොකිරීම නීතිපතිවරයා අතින් වු වරදක් විය හැකි නමුත් අනෙකුත් වගඋත්තරකරුවන් සියලු දෙනා නිදොස් කොට නිදහස් කිරීමට එම කරුණ බලපාන බව සිතීම මහාධිකරණ විනිසුරුවරියගේ චින්තනය පටු වූ අවස්ථාවක් ලෙස සැළකිය හැකිය. අපරාධ වරදක සැකකරුවන් කිහිප දෙනෙකු සිටින අවස්ථාවක එක් ප්‍රධාන සැකකරුවෙකු විත්තිකරුවෙකු ලෙස නම් කොට නොතිබුණේ නම් හෝ විත්තිකරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් කොට තිබී පසුව ඉවත් කළේ නම් එම හේතුව මත අනෙක් සියලුම සැකකරුවන් නිදොස් කොට නිදහස් කිරීම කිසි ලෙසකින් සාධාරණීකරණය කළ නොහැක.

ජෙරාඩ්ට ඇප ලබා දීමට වත්තල පොලිස් ස්ථානයට පැමිණි බව පවසන පළාත් සභා මන්ත්‍රී ත්‍යාගී අල්විස් සමඟ ජෙරාඩ්ගේ බිරිඳ හා සහෝදරයා ස්ථානාධිපතිවරයාගේ කාමරයේ රැඳී සිටියදී උප පොලිස් පරීක්ෂක රේණුක හා තවත් පොලිස් නිලධාරියෙකු විසින්

ජෙරාඩ්ව අල්ලා ගෙන පැමිණි බව සාක්ෂි මඟින් ඉදිරිපත් වී ඇත. නමුත් මෙම නඩුවේදී ත්‍යාගි අල්විස් හෝ උප පොලිස් පරීක්ෂක රේණුක හෝ අනෙක් පොලිස් නිලධාරියා ද සාක්ෂිකරුවන් ලෙස නීතිපතිවරයා විසින් ඉදිරිපත් කොට නැත. මහාධිකරණ විනිසුරුවරියගේ මතය අනුව ඔවුන් පැමිණිල්ලේ සාක්ෂිකරුවන් ලෙස ඉදිරිපත් කළේ නම් මෙම සිද්ධියේ වැළලී ඇති බොහෝ කරුණු අනාවරණය කර ගත හැකිව තිබිණි. මෙම සිද්ධියේ දී සාක්ෂිකරුවන් ලෙස ඉදිරිපත් කළ යුතු පුද්ගලයින් පැහැදිලිව පෙනෙන විටත් ඔවුන් සාක්ෂිකරුවන් ලෙස ඉදිරිපත් කිරීමට අපොහොසත් වීම නීතිපතිවරයාගේ බලවත් දුර්වලතාවයක් ලෙස හඳුනා ගත හැකිය.

කෙසේ වුවද පොලිස් ස්ථානයක් තුළ පොලිස් නිලධාරින් විසින් සැකකරුවෙකුට පහර දෙනු ලබන්නේ පිටස්තර සමාජයට රහසිගතවය. සාමාන්‍ය අපරාධකරුවෙකු විසින් පුද්ගලයෙකුට පහර දුන් අවස්ථාවක ඊට විරුද්ධව සාක්ෂි දීමට සිද්ධිය ඇසූ, දුටු ඕනෑම පුද්ගලයෙකු ඉදිරිපත් වනු ඇත. නමුත් පොලිස් ස්ථානයක සිදු වන එබඳු පහර දීමක් එම පොලිස් ස්ථානයේම අනෙකුත් නිලධාරින් දුටුවත් තම සහෝදර පොලිස් නිලධාරින්ට විරුද්ධව සාක්ෂි දීමට ඉදිරිපත් වනු ඇතැයි කිසි විටකත් සිතිය නොහැක. නමුත් රජයේ නිලධාරින්ගෙන් සාමාන්‍ය ජනතාවට සිදු වන මෙවැනි හිරිහැර තවදුරටත් සිදු වීම වළකා ඔවුන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම අවිවාදිතවම රජය සතු වගකීමකි. එබැවින් මෙබඳු නඩුවලදී පැමිණිල්ල මෙහෙයවන රජයේ නීතිඥවරුන්ගේත්, තීන්දුව ලබා දෙන අධිකරණ විනිසුරුවරුන්ගේත් වගකීම වන්නේ සාමාන්‍ය ජනතාව නීතියෙන් අපේක්ෂා කරන යුක්තිය ඔවුන්ට ළඟා කර දී ඔවුන්ගේ ආරක්ෂාව තහවුරු කිරීමය.

**In State of M.P. Vs Shyamsunder Trivedi** [31] නම් නඩුවේදී ඉන්දීය ශ්‍රේෂ්ඨාධිකරණය මේ සම්බන්ධයෙන් ඉතාම ප්‍රශංසනීය අදහසක් ඉදිරිපත් කොට ඇත.

*"සාමාන්‍යයෙන් පොලිස් අත්අඩංගුවේදී සිරකරුවෙකු වධහිංසාවට ලක් වූ බව ඔප්පු කිරීමට පැමිණිල්ලට සාක්ෂි*

[31] 1995 (4) SCC 262

සොයා ගැනීම ඉතා අසීරුය. පොලිස් අත්අඩංගුවේදී සැකකරුවෙකු මිය ගිය විටක ඔහු වධ හිංසාවට ලක්ව මිය ගිය බව පෙන්වීමට පැමිණිල්ලට ඍජු සාක්ෂි නොමැති වීමෙන් විත්තිකරුවන්ගේ වාසියට නඩුවේ තීන්දුව ලැබුණ විට පොලිස් නිලධාරින් තුළ වධහිංසාවක් සිදු කොට සැඟවී සිටිය හැකි බවට (තමාට කිසිදු හානියක් නොපැමිණෙන බවට) විශ්වාසයක් ගොඩනැගේ. පොලිස් නිලධාරින් විසින් අත්අඩංගුවේදී සැකකරුවෙකු වධහිංසාවට ලක් කිරීම නිසා ඔහු මිය යාම නීතියේ ආධිපත්‍ය අගයන ශිෂ්ටසම්පන්න රටක බරපතල ගණයේ අපරාධවලින් එකක් බවට අධිකරණය අමතක නොකළ යුතුය. "කාකි" ඇඳුමින් සැරසුණ නිලධාරින් තමන් නීතියට ඉහළින් සිටින බව සිතීම හෝ නීතිය තම අතට ගෙන ක්‍රියා කිරීම ශිෂ්ටසම්පන්න සමාජයක ප්‍රතිරූපය කෙළසයි. මෙබඳු ක්‍රියා වැළැක්වීමට දැඩි පියවර නොගතහොත් අපරාධ යුක්ති ක්‍රමයේ අත්තිවාරම බිඳ වැටිය හැකි අතර එනිසාම ශිෂ්ටත්වය ද පිරිහෙනු ඇත. මෙනිසා විශේෂයෙන්ම අධිකරණය මෙබදු නඩුවලදී තාත්විකව හා සංවේදීව කරුණු සළකා බලමින් තීන්දු ලබා දිය යුතු අතර එසේ නොවුණහොත් සාමාන්‍ය පුරවැසියන්ට නීතිය කෙරෙහි පවතින විශ්වාසය දුරස් වන දිනය වැඩි ඈතක නොවනු ඇත. "

# මහාධිකරණ තීන්දුවට එරෙහිව අභියාචනාධිකරණය කරා....

ජෙරාඩ්ගේ සිද්ධිය සම්බන්ධයෙන් මුල සිටම අවධානයෙන් සිටි ආසියානු මානව හිමිකම් කොමිසම, රයිට් ටු ලයිෆ් මානව හිමිකම් සංවිධානය ඇතුළු සිවිල් සංවිධාන කීපයක් **HC 326/03** මහාධිකරණ නඩු තීන්දුවෙන් යුක්තිය ඉටු නොවුණ බැවින් එම තීන්දුව අභියෝගයට ලක් කළ යුතු බව තීරණය කළහ. 1994 අංක 22 දරන වධ දීමට හා අනෙකුත් කෲර අවමන්සහගත සැළකීමට එරෙහි සම්මුති පනත යටතේ **HC 326/03** නඩුව පවරනු ලැබුවේ නීතිපතිවරයා විසින් වූ බැවින් එහි තීන්දුව වෙනුවෙන් අභියාචනා කළ යුත්තේ ද නීතිපතිවරයා විසින් විය යුතුය. නමුත් ඉහත කී සිවිල් සංවිධාන විසින් කොතෙකුත් නීතිපතිවරයාගෙන් ඉල්ලා සිටියද නීතිපතිවරයා විසින් එම තීන්දුවට එරෙහිව අභියාචනා කළේ නැත. අනතුරුව සිවිල් සංවිධානයන්හි සහයෝගය ද ඇතිව ජෙරාඩ්ගේ බිරිඳ පද්මා වික්‍රමරත්න අගතියට පත් පාර්ශවයේ අභියාචනාධිකාරිය ලෙස ඉදිරිපත් වෙමින් උක්ත මහාධිකරණ තීන්දුවට එරෙහිව අභියාචනාධිකරණය වෙත අභියාචනයක් ගොනු කළාය. අභියාචනාධිකරණ නඩු අංක **5/2008** අංකයෙන් විභාග වූ මෙම නඩුවේ තීන්දුව සිසිර ද ආබෲ විනිසුරු හා කේ.ටී. කිත්සිරි විනිසුරුවරයා විසින් 2012-10-18 වන දින ප්‍රදානය කරන ලදී.

මහාධිකරණ නඩුවේදී ජෙරාඩ් පොලිස් ස්ථානය තුළදී වධ හිංසාවට ලක් වී ඇති බව විනිසුරුවරිය විසින් පිළිගෙන ඇත. නමුත් මෙම නඩුවේ විත්තිකරුවන්ට අමතරව තවත් පොලිස් නිලධාරින් ජෙරාඩ් සමඟ ගැටී ඇති බවට සාක්ෂි ඉදිරිපත් වී ඇති බැවින් එම තැනැත්තන්ගේ ක්‍රියාවක ප්‍රතිඵලයක් ලෙස ජෙරාඩ් වධ හිංසාවට ලක් වූයේද යන සැකය පවතින බව එතුමියගේ මතය වී ඇත. නමුත් මෙම නඩුවේ 01 වන, 02 වන හා 03 වන විත්තිකරුවන් විසින් ජෙරාඩ්ව අත්අඩංගුවට ගැනීම සිදු කළේ තමන් විසින් බව පිළිගෙන ඇති අතර

පසු දින අළුයම 2 වන තෙක් ඔහුගෙන් ප්‍රශ්න කළ බවද පිළිගෙන ඇත. සාක්ෂි මඟින් වැඩිදුරටත් තහවුරු වී ඇත්තේ ජෙරාඩ් වධහිංසනයට ලක්ව ඇත්තේ විත්තිකරුවන්ගේ භාරයේ සිටින කාල සීමාවේ දී බවයි. එබැවින් අභියාචනාධිකරණ විනිසුරන්ගේ අවසන් මතය වී ඇත්තේ එම කරුණ මතම එම විත්තිකරුවන් වගකීමට ලක් කළ හැකි බවයි.

මෙම කාල සීමාව මුළුල්ලේම 04 වන විත්තිකරු ද එම ස්ථානයේ හිඳිමින් ජෙරාඩ්ගේ ප්‍රකාශය සටහන් කර ගෙන ඇති අතර පිටු එක හමාරකින් සමන්විත කෙටි ප්‍රකාශයක් සටහන් කර ගැනීමට 04 වන විත්තිකරුට පැය තුන හමාරක කාලයක් ගත වී ඇත. පිටු එක හමාරක කෙටි ප්‍රකාශයක් සටහන් කර ගැනීම සඳහා එතරම් කාලයක් ගත වීමෙන් පැහැදිලි වන්නේ ප්‍රකාශය සටහන් කර ගන්නා අතරතුර ජෙරාඩ් වධ හිංසනයන්ට ලක් වී ඇති බවයි. ඒ අනුව ජෙරාඩ්ට හිරිහැර කිරීමේදී 01, 02, 03 හා 04 වන විත්තිකරුවන් සමාන අරමුණකින් ක්‍රියා කොට ඇති බව පැහැදිලිය.

වැඩිදුරටත් සාක්ෂි මඟින් අනාවරණය වී ඇත්තේ 05 හා 06 විත්තිකරුවන් ජෙරාඩ්ව අත්අඩංගුවට ගැනීමෙන් අනතුරුව තම රාජකාරිය අවසන් කොට පොලිස් ස්ථානයෙන් නික්ම ගොස් ඇති බවයි. මේ නිසා අභියාචනාධිකරණය විසින් 01, 02, 03 හා 04 වන විත්තිකරුවන් නිදොස් කිරීම අවලංගු කොට ඔවුන්ට එරෙහිව නැවත නඩු විභාගයක් පැවැත්වීමට නියෝග කර ඇති අතර 05 වන හා 06 වන විත්තිකරුවන් නිදොස් කිරීම තහවුරු කොට ඇත.

එම අභියාචනාධිකරණ තීන්දුවට එරෙහිව උක්ත නඩුවේ විත්තිකරුවන් විසින් ශ්‍රේෂ්ඨාධිකරණයට අභියාචනා කළ අතර ශ්‍රේෂ්ඨාධිකරණය විසින් අභියාචනාධිකරණ තීන්දුව නැවත තහවුරු කරමින් අදාළ විත්තිකරුවන්ට එරෙහිව 1994 අංක 22 දරන වධ දීමට හා අනෙකුත් කෲර අවමන්සහගත සැළකීමට එරෙහි සම්මුති පනත යටතේ මීගමුව මහාධිකරණයේ මුල සිට නඩුව නැවත වතාවක් විභාග කිරිමට නියෝග කරන ලදී. එම තීන්දුව අනුව අවශ්‍ය වේ නම් පැමිණිල්ල වෙනුවෙන් සාක්ෂිකරුවන්ගේ ලැයිස්තුවට නව සාක්ෂිකරුවන් එකතු කිරීමට ද නීතිපතිවරයාට අවස්ථාව ලබා දී ඇත.

2014 වසරේ සිට මීගමුව මහාධිකරණයේ මෙම නඩුව මුල සිට නැවත විභාග වෙමින් පවතී. ශ්‍රේෂ්ඨාධිකරණ නියෝගය අනුව මේ වන විටත් මෙම නඩුව සඳහා දීර්ඝ කාලයක් ගෙන ඇති බැවින් 2014 දෙසැම්බර් වන විට නඩුව අසා අවසන් කරන ලෙස දන්වා තිබුණද 2015 වසර ආරම්භ වී මාස නවයකටත් වඩා ඉක්ම ඇති මේ මොහොතේදීත් මීගමුව මහාධිකරණයේ එම නඩුව විභාග වේ.

මෙම සිද්ධියේ දී බාධක මධ්‍යයේ යුක්තිය සොයා යාමට නොබියව පියවර තැබූ චරිත කිහිපයක් විය. ඔවුන්ගේ සක්‍රිය දායකත්වය නොලැබෙන්නට අදටත් ජෙරාඞ් වෙනුවෙන් යුක්තිය ඉටු නොවී තිබෙන්නට බොහෝ විට ඉඩ තිබුනි. ඉන් එක් චරිතයක් වන්නේ දුක්, කරදර, බාධක මැද තම සැමියා වෙනුවෙන් යුක්තිය සොයා ගිය ඔහුගේ දයාබර බිරිඳ පද්මා වික්‍රමරත්න මහත්මියයි. අනෙක් ප්‍රධාන චරිතය වූයේ ආසියානු මානව හිමිකම් කොමිසමේ අධ්‍යක්ෂ (ප්‍රතිපත්ති හා සැලසුම්) නීතිඥ බැසිල් ප්‍රනාන්දු මහතායි. මේ දෙදෙනා රයිට් ටු ලයිෆ් මානව හිමිකම් සංවිධානය, ජනසංසදය, මහනුවර මානව හිමිකම් කාර්යාලය, සෙටික් ආයතනය හා මානව හිමිකම් පුරවැසි කමිටුව ඇතුළු සිවිල් සංවිධාන හා එක්ව ජෙරාඞ් මර්වින් පෙරේරා මහතාට යුක්තිය ලබා ගැනීම සඳහා අඛණ්ඩ අරගලයක් දියත් කරනු ලැබීය. එම සිවිල් සමාජ ක්‍රියාකාරීත්වය නොතිබෙන්නට ජෙරාඞ්ගේ බිරිඳටත් ජෙරාඞ්ට අත් වූ ඉරණමටම මුහුණ දීමට ඉඩ තිබුනි. නොඑසේ නම් ඇය ලද අපමණ දුක් කම්කටොලු මැද මෙම අරගල අතරමැද අතහැර දැමීමට ද බොහෝ ඉඩ තිබුනි.

ඒ සියලු අභියෝග මැද ජෙරාඞ් මරා දමා අවුරුදු 10කට පසුව හෝ ඔහු වෙනුවෙන් යම් කිසි යුක්තියක් ලබා ගැනීමට හැකි වීම ඉහත සඳහන් කළ චරිත හා සංවිධානත්, මේ රටේ යුක්තිය ඉල්ලා සිටි මහජනතාවත් ලැබූ ජයග්‍රහණයක් විය. මීළඟට දිග හැරෙනුයේ තමාගෙන් උදුරා ගත් සැමියා වෙනුවෙන් යුක්තිය සොයා යන ගමනේ දී තමාට මුහුණ පෑමට සිදු වූ දුෂ්කරතාවයන් පිළිබඳව හඬ අවදි කරන ***පද්මා වික්‍රමරත්න මහත්මියගේ කථාවයි.***

# ජේරාඩ්ගේ බිරිඳගේ කථාව...

*"පහුවදා අපි වත්තල පොලිසියට ගියාම එයාලට වුනේ වැරදීමක් කියලා ජේරාඩ්ව ආපහු අපට බාර දුන්නා. ඒත් ඊට කලින් දවසෙ අත්අඩංගුවට ගත්ත ජේරාඩ්ව නෙමේ මට ආපහු ලැබුණෙ. ඇවිදින්න බැරි, අත් දෙක වාරු නැති, කළු වෙච්ච, ඉදිමිච්ච ජේරාඩ් කෙනෙක්. පොලිසියෙදි එයාට එල්ලලා ගැහුවා කියලා ජේරාඩ් මට කිව්වා. අපි එයාව යක්කල ආයුර්වේදයට ගෙනිච්චට ආයුර්වේදෙන් එයාව බාර ගත්තෙ නෑ. ඉන් පස්සේ දවස් ගානක් හරියට මළ මිනීයක් වගේ, ජේරාඩ්ට නවලෝක රෝහලේ නැවතිලා ප්‍රතිකාර ගන්න සිද්ධ වුණා."*

පද්මා, තම සැමියාව වත්තල පොලිසියේ අත්අඩංගුවෙන් මුදා හැරිය පසුව ඔහුව දුටු ආකාරය පැහැදිලි කරන්නේ එලෙසිනි. පොලිස් අත්අඩංගුවේදී පහර කෑමට ලක් වීමෙන් පසුව වෛද්‍ය ප්‍රතිකාර ලබා ජේරාඩ් නිවසට පැමිණියත් ඔහුගේ දකුණු කන නොඇසුණ අතර වරින්වර ඔහුට කලන්තේ ගතියක් ඇති විය. ඒ කෙසේ වුවද රෝගියෙකු ලෙස හෝ තම සැමියා ඉතිරි වීම පිළිබඳව දහස් වතාවක් ඇය දෙවියන්ට පින් දුන්නාය.

සිදු වූ අසාධාරණයට විරුද්ධව ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කරන ලද මූලික අයිතිවාසිකම් පෙත්සම විභාග කොට ජේරාඩ් වෙනුවෙන් වගඋත්තරකරුවන්ට වන්දි ගෙවීමට ශ්‍රේෂ්ඨාධිකරණය නියෝග කරන ලදී. ඉන් පසුව මීගමුව මහාධිකරණයේ තවත් නඩුවක් පැවරුණ අතර එහි සාක්ෂි ලබා දීමට 2004-12-02 වන දින අධිකරණයට පැමිණෙන ලෙස දන්වා ජේරාඩ්ට සිතාසි ලැබුණි. 2004-11-21 වන දින අල්විස් ටවුමේ සිටි මිතුරෙකුගේ මාර්ගයෙන් පද්මාට දැන ගන්නට ලැබුණේ අහස, පොළව නොඋහුලන කථාවකි. ඒ, කිසිවෙකුටත් හිංසාවක් සිදු නොකළ, තමාවත්, තම දරු තිදෙනාවත් සෙනෙහසින් රැක බලා ගත් තම එකම රැකවලා කවුරුදෝ බස් රථයක්

තුළ වෙඩි තබා ඝාතනය කර ඇති බවයි. පද්මාට දැනුනේ මුළු ලෝකයම තම දෙපා මුල කඩා වැටුණාක් මෙනි.

ඒ වන විටත් මීගමුව මහාධිකරණයේ විභාග වෙමින් පැවති **HC 326/03** නඩුවේ තීන්දුව ඉන් වසර කීපයකට පසුව ලැබුණි. ඉන් කියවුණේ තම සැමියාට අනේකවිධ වධ හිංසා පමුණුවා ඔහුව මරා ගත් ඒ පොලිස් නිලධාරින් සියලු දෙනාම නිදොස් කොට නිදහස් කළ බවයි.

> *"ඒ තීන්දුව අහලා මට අදහා ගන්න බැරි උනා. දෙයියනේ කුරා කුඹියෙකුටවත් හිංසාවක් නොකරපු මගේ අහිංසක මනුස්සයාට කොච්චර වධ වේදනා දුන්නද මේ අමනුස්සයො. ඒ කරලා මදිව අන්තිමේදී මගෙ මනුස්සයාව මරලත් දැම්මා. මගෙ පොඩි උන් තුන් දෙනාට තාත්තා කියලා කථා කරන්න හිටිය මනුස්සයව නේද මුන් උදුර ගත්තේ. 'කරපු අපරාදෙට මුන්ට හෙන ගහන්න ඕනා' තීන්දුව අහලා මගෙ කටින් එහෙම පිට වුණේ මට ඒ තීන්දුව දරා ගන්න බැරි හින්දමයි. "*

තමාට ආසියානු මානව හිමිකම් කොමිසම, රයිට් ටු ලයිෆ් මානව හිමිකම් සංවිධානය ඇතුළුව සිවිල් සංවිධාන කීපයක්ම සහයෝගය ලබා දුන් බව පවසන පද්මා, එම සහයෝගයද ඇතිව මහාධිකරණ තීන්දුවට එරෙහිව අභියාචනා කර ඇත. අභියාචනාධිකරණය, මහාධිකරණ තීන්දුව දෝශසහිත බව දක්වමින් නැවත නඩු විභාගය මුල සිට විමසීමට නියෝග කර ඇත. මේ අතරතුර තම සැමියාගේ ඝාතනය සම්බන්ධයෙන් මීගමුව මහාධිකරණයේ විභාග වූ නඩුවේ ද තීන්දුව ලැබුණි. එම තීන්දුව ලැබීමට තම සැමියාගේ ඝාතනය සිදු වී දස වසරක් ගත වුවද අවසානයේ සාධාරණය ඉෂ්ට වීම පිළිබඳව ඇය අද සතුටු වන්නීය.

මෙම දශකය පුරාවට ජෙරාඩ්ගේ බිරිඳ පද්මා, දුක් කරදර බාධක හමුවේ නොසැළෙන අධිෂ්ඨානයෙන් තමාගෙන් උදුරා ගත් සැමියා වෙනුවෙන් යුක්තිය සොයා ගියාය. ජෙරාඩ්ගේ ඝාතන නඩුව විභාග වන අවධියේ පද්මාට එම නඩුව ඉදිරියට ගෙන යාමෙන් වළකින ලෙස විත්තිකාර පාර්ශ්වයෙන් බොහෝ බලපෑම් එල්ල විය. තම සැමියාට අත් වූ ඉරණම තමාට ද අත් වනු ඇතැයි සිතා ඇය තැති ගත් අවස්ථා

අනන්තය. තම දරුවන්ට අනතුරක් කරනු ඇතැයි සිතා ඇය බිය වැදුණ අවස්ථා අනේකය. නමුත් ඇය තම සැමියා වෙනුවෙන් යුක්තිය සොයා යන ගමන කිසිවිටකත් අත් හැරියේ නැත.

මෙම නඩුව ඉදිරියට ගෙන යාම සම්බන්ධයෙන් පද්මාගේ පවුලේ ඥාතීන්ගෙන් ද එතරම් යහපත් ප්‍රතිචාරයක් නොලැබුණ අතර සැමියාට අත් වූ ඉරණම ඇයට ද ලැබෙනු ඇතැයි සිතා ඇයගේ මව හා සහෝදරයා පද්මාට නඩුවට නොයන ලෙස කොතෙකුත් ඇවිටිලි කළහ. තම සැමියාට අත් වූ ඉරණම තමාට ද අත් වුවහොත් අසරණ දරු තිදෙනා අනාථ වන බව දැන සිටිය ද කිසිදු වරදක් නොකළ අහිංසකයෙකු වූ තම සැමියා ඝාතනය කළ මිනීමරුවන්ට විරුද්ධව යුක්තියේ පිළිසරණ සොයා යන ගමන කෙතරම් බාධක මැද වුවත් පද්මා අත් හැරියේ නැත.

ජෙරාඩ් මර්වින් ඝාතනය වූයේ 2004 වසරේදී ය. ඔහුගේ ඝාතකයින්ට මරණ දඬුවම ලැබුණේ 2015 වසරේදී ය. මීගමුව මහාධිකරණයේ වසර දහයක් පුරාවට ජෙරාඩ්ගේ ඝාතන නඩුව විභාග විය. විනිසුරුවරයාගේ නොපැමිණීම හෝ සාක්ෂිකරුවන් නොපැමිණීම මත නඩු දින කල් ගිය වාර අනන්තය. ජෙරාඩ්ගේ බිරිඳ පද්මාට තම සැමියාගේ ඝාතන නඩුවේ නියෝගය ලැබීම මෙතරම් ප්‍රමාද වන විට අධිකරණයෙන් යුක්තිය, සාධාරණය ඉටු නොවනු ඇතැයි සැක නොසිතුණා නොවේ. තම සැමියාගේ ඝාතකයින් නඩුවෙන් නිදහස්ව පැමිණ තමාට ද අනතුරක් කරනු ඇතැයි ඇය බිය වැදුණ අවස්ථා ද විය. කෙසේ වුවත් ප්‍රමාද වී හෝ ඇයගෙන් උදුරා ගත් සැමියා වෙනුවෙන් හෙළූ කඳුළු හමුවේ යුක්තියේ දෙවඟනගේ ළය තෙත් විණි.

අවසානයේ ඇය අපට කියන්නේ මෙවැනි කථාවකි.

> *"මටයි, මගෙ දරුවො තුන් දෙනාටයි වුනා වගේ අපරාධයක් මේ ලෝකේ කිසිම කෙනෙක්ට වෙන්න එපයි කියලයි මං හැමතිස්සෙම ප්‍රාර්ථනා කරන්නෙ. ඒත් එහෙම අසාධාරණයක් වුණොත් මං නම් කියන්නෙ බය වෙන්නෙ නැතිව නීතිය ඉස්සරහට ගිහින් තමන්ට වුන අසාධාරණයට විරුද්ධව සටන්*

*වදින්න කියලයි. එහෙම නොවුනොත් අපරාධ කරන මිනිස්සු බය නැතිව තවත් අපරාධ කරනවා. කොහොම උනත් මගෙන් උදුර ගත්ත මගෙ මහත්තයා වෙනුවෙන් අන්තිමට සාධාරණයක් ඉෂ්ට වුනා කියලා හිතෙන කොට මගෙ හිතට ලොකු සතුටක් දැනෙනවා.”*

# යුක්තිය සොයා යන වින්දිතයා හා යුක්තියට මඟ පෙන්වන සාක්ෂිකරුවා....

අසාධාරණයට ලක් වූ වින්දිතයෙකු නීතියේ පිළිසරණ සොයා යන්නේ තමන්ගේ දුක කියන්නට පියා සමීපයට යන කුඩා දරුවෙකු මෙනි. තමන්ගේ එකම වීරයා ලෙස සළකන පියා තමන්ගේ දුක තේරුම් ගෙන විසඳුමක් දෙන බවට කුඩා දරුවකු තුළ මහත් විශ්වාසයක් පවතී. එලෙසින්ම අසාධාරණයකට ලක් වූ වින්දිතයෙකු තමාට අසාධාරණය සිදු කළ පුද්ගලයාගෙන් පෞද්ගලිකව පළිගැනීම වෙනුවට  ජාති භේද, පංති භේද කිසිවක් නොසළකා සියල්ලන්ටම සමානව සළකන යුක්තියේ දෙවඟනගේ පිහිට පතා එන්නේ නීතිය පිළිබඳ ඇති දැඩි විශ්වාසය හේතු කොට ගෙනය. නමුත් නීතියේ පවතින බොහෝ හිඩැස් නිසා වින්දිතයෙකුට සිතෙන්නේ යුක්තිය සොයා යන මාවත වල, ගොඩැලි, රළු බාධක වලින් අඩුවක් නැති මඟක් ලෙසිනි.

ලංකාවේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ දක්වා ඇත්තේ මූලික අයිතිවාසිකම් පෙත්සමක් ඉදිරිපත් වී මාස දෙකක් තුළ මූලික අයිතිවාසිකම් නඩුකරයක් අසා නිම කළ යුතු බවයි.[32] නමුත් අපේ රටේ මාස දෙකකින් අසා නිම කළ එකදු මූලික අයිතිවාසිකම් නඩුකරයක්වත් මේ වන තෙක් වාර්තා වී නොමැති බව කිව යුතුය. මූලික අයිතිවාසිකම් නඩුකර පමණක් නොව මහේස්ත්‍රාත් උසාවියේ විභාග වන මූලික පරීක්ෂණ[33] පවා වසර ගණනාවක් තිස්සේ ඇදෙමින් පවතී.

ජෙරාඩ් මර්වින්ගේ ඝාතන සිද්ධියේ දී ඔහුගේ ඝාතනය සිදු වූයේ 2004 වසරේ නොවැම්බර් මස 21 වන දින ය. ඔහුගේ ඝාතකයින්ට

[32] 126(5) වගන්තිය, ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව

[33] යම් අපරාධයක් සිදු වූ විට එම සිද්ධියේ විත්තිකරුට එරෙහිව මහාධිකරණය ඉදිරියේ නඩුවක් පැවරීමට ප්‍රමාණවත් තරම් සාක්ෂි ඇත්ද යන්න විමසා බැලීම. මෙය මහේස්ත්‍රාත් අධිකරණයේ විභාග වේ.

විරුද්ධව පවරන ලද නඩුවේ තීන්දුව ප්‍රදානය කෙරුණේ 2015 වසරේ ජූනි මස 22 වන දිනය. එනම් වසර දහයකුත්, මාස හතක් ගත වූ පසුවය. සැකකරුවකු, මනුෂ්‍ය ඝාතකයෙකු වන බව නිසැකවම හඳුනා ගැනීමට ලංකාවේ අධිකරණය වසර දහයක් ඉක්මවන කාලයක් ගැනීම යනු එම අධිකරණයේ කාර්යක්ෂමතාවය කෙබඳු ද යන්න පිළිබඳව සිතා බැලිය යුතු කාරණයකි. තමාට සිදු වූ අසාධාරණයක් වෙනුවෙන් එතරම් කාලයක් යුක්තිය ලැබෙන තුරු බලා සිටීමට සිදු වීමම වින්දිතයෙකුට නීතිය කෙරෙහි පවතින විශ්වාසය හීන කරයි.

වසර ගණනාවක් තිස්සේ විභාග වන බොහෝ නඩුවල තීන්දුව ලැබීමට ප්‍රථම වින්දිතයා හෝ විත්තිකරු හෝ සාක්ෂිකරුවන් ස්වභාවිකවම මිය යන අවස්ථා ද පවතී. යම් අසාධාරණයකට ලක් වූ පුද්ගලයෙකුට තමන්ගේ ජීවිතයේ අවසානයට කලින් නීතියෙන් පිළිසරණක් ලැබිය නොහැකි නම් එරට නීතියෙන් බලාපොරොත්තු විය හැකි ඵලය පිළිබඳව අමුතුවෙන් කිව යුතු නොවන්නේය.

දශක ගණනාවක් තිස්සේ විභාග වන තවත් සමහර නඩු අවසාන වීමට විශාල කාලයක් ගත වීම නිසා සිද්ධිය ඇසින් දුටු සාක්ෂිකරුවන්ට පවා අධිකරණය ඉදිරියේ සාක්ෂි ලබා දීමට තරම් මතකයක් සිද්ධිය සම්බන්ධයෙන් නොපවතී. එබඳු අවස්ථාවක නිවැරදි සාක්ෂි අධිකරණයට නිසි පරිදි නොලැබීම නිසා යුක්තිය මඟ හැරී යන තීන්දු ලැබෙන අවස්ථා ද නැතුවාම නොවේ.

ලංකාවේ අධිකරණයක විභාග වන නඩුවක් නිම වීමට විශාල කාලයක් ගත වීම නිසා විත්තිකරුවෙකු ලෙස හෝ සාක්ෂිකරුවෙකු ලෙස හෝ පැමිණිලිකරු ලෙස සිතාසි ලැබෙන පුද්ගලයෙකුට නඩුව අවසන් වීමට පෙර විදේශගත වීමට හෝ වෙනත් ඈත ප්‍රදේශයක පදිංචි වීමට යාමට හෝ ජීවිතයේ ඇති වෙනත් බලාපොරොත්තුවක් ඉටු කර ගැනීමට ද අවකාශයක් නොලැබේ. මේ නිසා නඩුවක කොටස්කරුවකු වන පුද්ගලයෙකුගේ මුළුමහත් ජීවන රටාවම අවුල් වේ. පවතින නඩු ප්‍රමාදය නිසා තමන්ගේ මුළු ජීවිත කාලයම උසාවි ගානේ ගොස් රස්තියාදු වෙනවාට වඩා තමන්ට සිදු වූ වරද ඉවසා දරා ගෙන සිටීම බුද්ධිමත් තීරණයක් බව සිතන මිනිසුන් මේ වන විට සමාජයේ බොහෝය.

වින්දිතයා වෙනුවෙන් සාධාරණත්වය ඉටු කර දීම මෙන්ම වින්දිතයකු සාධාරණත්වය සොයා නීතිය ඉදිරියට යාමේ ප්‍රතිඵලයක් ලෙස අත්විඳින්නට සිදු විය හැකි ජීවිත අවදානමෙන් ඔවුන් ආරක්ෂා කර ගැනීම ද රටක රජයේ වගකීමකි. උක්ත සිද්ධියේදී ජෙරාඩ් ඝාතනයට ලක් වූයේ ඔහු තමන්ට අත්විඳින්නට සිදු වූ අසාධාරණයට එරෙහිව නීතිය ඉදිරියට ගිය බැවිනි. නීතියේ පිහිට පතන්නන් හෝ අසාධාරණයකට එරෙහිව නීතිය ඉදිරියේ සාක්ෂි ලබා දෙන්නන්ට මේ අයුරින් ජීවිතයෙන් වන්දි ගෙවීමට සිදු වන විට මුළුමහත් සමාජයටම තමාට මුහුණ පෑමට සිදු වූ අසාධාරණයකට විරුද්ධව නීතියේ පිහිට සෙවීමට මෙන්ම අසාධාරණයකට විරුද්ධව නැඟී සිටීමට ද තැති ගැන්මක් ඇති වේ.

වරදක් කළ පුද්ගලයෙකුට අධිකරණයෙන් දඬුවමක් පැනවීමෙන් සිදු වන්නේ එම අසාධාරණයට ලක් වූ වින්දිතයාට යුක්තිය ඉෂ්ට වීම පමණක්ම නොවේ. එසේ වරදකරුවකුට දඬුවමක් ලැබීමෙන් අපරාධයක් සිදු කොට සැඟව සිටිය නොහැකි බවට වක්‍රාකාර පණිවිඩයක් ද සමාජයට රැගෙන යයි. එනම් රටක නීතියක් පවත්වා ගෙන යාමේ අරමුණ වන්නේ එරට සමාජය වඩාත් සදාචාරසම්පන්න කිරීමයි. නමුත් මේ අයුරින් නීතියේ පවතින හිඩැස් නිසා සමාජය නීතියෙන් දුරස් වන විට නැවතත් අප නොදැනුවත්වම පිය නගන්නේ සියවස් ගණනාවකට එහා පැවති නීතියක් නැති අරාජික වූ යුගයකටය.

# පසුවදන

මෙහි විස්තර කර ඇති ආකාරයට මහාධිකරණයෙන් අභියාචනාධිකරණයට, අභියාචනාධිකරණයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයට, ශ්‍රේෂ්ඨාධිකරණයෙන් යළිත් මහාධිකරණය වෙත පැමිණි මෙම 1994 අංක 22 දරන වධහිංසාවට එරෙහි පනත යටතේ පැවරූ නඩුවේ තීන්දුව වර්ෂ 2019 ජූනි 28වන දින එනම් නඩුව මුලින්ම පැවරූ දින සිට වසර 17ක් ගත වූ පසු ලැබුණි. ගරු ශ්‍රේෂ්ඨාධිකරණය නියෝග කල පරිදි මෙම නඩුව නැවත මුල සිට විභාග කිරීම මීගමුව මහාධිකරණයේ ආරම්භ විය.

ශ්‍රේෂ්ඨාධිකරණය මෙහි දී තම තීන්දුව දෙමින් මහාධිකරණය වෙත වැඩිදුරටත් නියෝග කරනු ලැබුවේ මෙම නඩුව සඳහා 2003 වසරේ සිට 2013 වසර දක්වා වසර 10ක දීර්ඝ කාලයක් ගෙන ඇති බැවින් මෙම නඩුව 2014 වර්ෂය තුළ අසා නිම කොට 2014 දෙසැම්බර් මස 31ට පෙර තීන්දුව ලබා දිය යුතු බවයි. කෙසේ වුවද ශ්‍රේෂ්ඨාධිකරණයේ එම නියෝගය නිසි පරිදි ක්‍රියාත්මක කරමින් එකී කාලසීමාව ඇතුළත නඩුව අසා නිම කිරීමට මීගමුව මහාධිකරණය අපොහොසත් විය. නමුත් ඒ සම්බන්ධයෙන් අපට සෘජුවම මහාධිකරණය වෙත ඇඟිල්ල දිගු කළ නොහැක. එනම් ඊට ප්‍රධාන හේතු සාධක කිහිපයක් පවතී. ඒ අතර නීතීපති දෙපාර්තමේන්තුවේ නඩු සම්බන්ධයෙන් වන ක්‍රියාත්මක භාවයේ දූර්වලතාවය ප්‍රධාන වන අතර එමෙන්ම මෙලෙස නඩු ප්‍රමාදවීම ලංකාවේ සමස්ත අධිකරණ කාර්යපටිපාටියේ පවතින අකාර්යක්ෂමතාවය පිළිබිඹු කරන්නක් බව පෙනී යයි.

කෙසේ වුවද මෙම වධහිංසා නඩුව මීගමුව මහාධිකරණයේ නඩු අංක 326/2003 යටතේම නැවත මුල සිට විභාග වීම 2014 වසරේ මුල සිට ආරම්භ විය. ඒ යටතේ මෙහිදී නීතිපති දෙපාර්තමේන්තුව මේ සම්බන්ධයෙන් චූදිතයින් 04 දෙනෙකුට එරෙහිව 1994 අංක 22 දරන වධහිංසා පනත යටතේ අධිචෝදනා ගොනු කරනු ලැබීය. එම විත්තිකරුවන් වන්නේ,

1)මාකවිටගේ සුරේෂ් ගුණසේන, 2)ජයසිංහ ආරච්චිගේ නලීන් චන්දිමාල් ජයසිංහ, 3)හේරත් අධිකාරීලාගේ ප්‍රසාද් දිල්හාර පෙරේරා, 4)හේරත් මුදියන්සේලාගේ අසේල කුමාර හේරත් යන අය යි. පසුව මෙම නඩුව විභාග වෙමින් පවතින විට ඉහත සඳහන් කළ 03 වන චූදිත මිය යන ලදි. ඒ අනුව ඉතිරි වූ අනෙක් චූදිතයින්ට එරෙහිව මෙම නඩුව දිගටම විභාග කෙරුණි. මෙහිදී පැමිණිල්ලේ නඩුවේදී පැමිණිලි පාර්ශ්වය වෙනුවෙන් ඉදිරිපත් වූ ඍජු හා පරිවේෂණීය සාක්ෂි සලකා බැලූ මහාධිකරණය මෙහිදී බැලූ බැල්මටම චූදිතයින්ට එරෙහිව කරුණු පවතින බව පිළිගත් අතර එබැවින් එකී කරුණු බිඳ හෙළීම සඳහා චූදිතයින්ට තම විත්තිවාචක ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දුණි. ඒ අනුව චූදිතයින් තම විත්තිවාචක ගෙන හැර දැක්වීම සිදු විය.

මෙසේ පැමිණිල්ලේ නඩුව සහ අනතුරුව විත්තියේ නඩුව සඳහා 2014 වසරේ සිට 2019 වසර දක්වා වසර 05ක කාලයක් ගත කෙරුණු අතර අවසානයේදී වර්ෂ 2019 ජූනි මස 28 වන දින මෙහි තීන්දුව ලබා දීමට නියම විය. එහිදී තීන්දුව ලබා දීමට පෙර අධිකරණයේ අවසරය මත දෙපාර්ශ්වය වෙනුවෙන් පෙනී සිටි නීතීඥවරුන් විසින් තවදුරටත් කරුණු ඉදිරිපත් කිරීම සිදු කරන ලදි. එහිදී චූදිතයින් වෙනුවෙන් පෙනී සිටි නීතීඥ යසස් විජේසිංහ මහතා සහ නීතීඥ ගයනි වාසනා මහත්මිය අධිකරණය වෙත සාක්ෂි ආඥා පනතේ 53 වන වගන්තියේ විධිවිධාන අනුව චූදිතයින්ගේ යහපත් චරිතය පිළිබඳව කරුණු දැක්වීම සිදු කරන ලදි.

ඉන් අනතුරුව පැමිණිලි පාර්ශ්වය වෙනුවෙන් පෙනී සිටි රජයේ ජ්‍යෙෂ්ඨ අධිනීතීඥ නවරත්න මාරසිංහ මහතා කරුණු දක්වමින් කියා සිටියේ 2002 වසරේදී සිදු වූ මෙම කෲර අමානුෂික වධහිංසාව මූලිකවම මහාධිකරණයේ විභාග කෙරුණු බවත් එහි තීන්දුවෙන් අනතුරුව අභියාචනාධිකරණය වෙත අභියාචනා කෙරුනු බවත් ඉන් නොනැවතී ශ්‍රේෂ්ඨාධිකරණය දක්වා ගමන් කොට ඇති බවයි. එහිදී ශ්‍රේෂ්ඨාධිකරණයේ නියමය පරිදි නැවත මුල සිට මෙම නඩුව විභාග කිරීමට මෙම මහාධිකරණය වෙත යොමු කරනු ලැබූවේ මෙහි බැලූ බැල්මට විත්තියට එරෙහි ප්‍රබල නඩුවක් පවතින බව පෙනී ගිය නිසා බවයි. එසේ ම මෙම නඩුවේ දී පැමිණිල්ල වෙනුවෙන් සාක්ෂි ගෙන හැර දැක්වූ මහාචාර්ය රවින්ද්‍ර ප්‍රනාන්දු සහ විශේෂඥ වෛද්‍ය සඳුන්

විජේවර්ධන යන අයගේ අධිකරණ වෛද්‍ය විද්‍යාත්මක සාක්ෂි තුළින් මෙහිදී ජෙරාඩ් මර්වින් පෙරේරා යන අයව කෲර අමානුෂික වධබන්ධනයන්ට ලක් කර ඇති බව තවදුරටත් තහවුරු වූ බවද ඔහු ප්‍රකාශ කර සිටියේ ය. එසේ ම වැඩිදුරටත් අදහස් දැක්වූ අධිනීතිඥ නවරත්න මාරසිංහ මහතා කියා සිටියේ මෙම සිද්ධිය මානව හිමිකම් උල්ලංඝනය කිරීමක් වශයෙන් ජාත්‍යන්තරය දක්වා දිව ගිය එකක් බවත් ඒ අනුව මෙම නඩුව සම්බන්ධයෙන් ජාත්‍යන්තරයේ අවධානය යොමු වී තිබෙන බැවින් මෙම මහාධිකරණය ලබා දෙන තීන්දුව තුළින් ලාංකික වශයෙන් පමණක් නොව ජාත්‍යන්තර වශයෙන් ද මානව අයිතිවාසිකම් සුරක්ෂණය උදෙසා වැදගත් පණිවුඩයක් නිර්මාණය වන බව යි.

ඒ අනුව දෙපාර්ශවයෙන් ඉදිරිපත්වූ කරුණු සලකා බැලූ මීගමුව මහාධිකරණ විනිසුරු ආර්. ඒ. රණරාජ මැතිතුමා මෙහි තීන්දුව දෙමින් කියා සිටියේ මෙම නඩුවේ පැමිණිලි පාර්ශවය වෙනුවෙන් ඉදිරිපත් කර ඇති සාක්ෂිවලට අවධානය යොමු කිරීමේ දී ඒවායේ පරස්පරතාවයක් නොමැති බවත්, එම සාක්ෂි ඒකාකාරී බවත්, එම සාක්ෂිවල ගැළපීමක් ද තිබෙන බැවින් මෙම සියලු කාරණා අනුව පැමිණිල්ලේ සාක්ෂි "විය හැකි භාවයේ පරීක්ෂණයෙන් " සමත්වන බව යි.

අනතුරුව එතුමා මෙහි 04 වන චූදිත වන හේරත් මුදියන්සේලාගේ අසේල කුමාර හේරත් යන අය මෙම කෲර අමානුෂික වධහිංසා සිදු කිරීමේ සිද්ධියට සම්බන්ධ බවට අනුමිතියකට එළඹිය හැකි ආකාරයේ පරිවේෂණීය සාක්ෂි ඉදිරිපත් වී නොමැති බවත් මෙහි 01 හා 02 චූදිතයින් හා එක්ව එකී ක්‍රියාව සඳහා පොදු චේතනාවක් සහිතව ක්‍රියාකාරීව සහභාගී වූ බවට සාක්ෂි නොමැති බවත් සඳහන් කරනු ලැබීය. ඒ අනුව මෙම නඩුවේ එකී 04 වන චූදිත මෙම මෙම නඩුවේ චෝදනාවෙන් නිදොස් කොට නිදහස් කරන බවට තීන්දු කරන ලදි.

අනතුරුව එතුමා ප්‍රකාශ කර සිටියේ මෙම නඩුවේ ඉදිරිපත් වූ සියලු කරුණු අනුව මෙහි 01 හා 02 චූදිතයින් මෙම කෲර අමානුෂික වධහිංසා සිදු කිරීමේ සිද්ධියට සම්බන්ධ බවට සාධාරණ සැකයෙන්

තොරව ඔප්පු වී තිබීම හේතුවෙන් ඔවුන්ව මෙම නඩුවේ චෝදනාවට වරදකරුවන් වන බවයි. ඒ අනුව මෙහි 01 වන චූදිත වන මාකවිටගේ සුරේෂ් ගුණසේන හා 02 වන චූදිත වන ජයසිංහ ආරච්චිගේ නලින් චන්දිමාල් ජයසිංහ යන අයට වසර 10 බැගින් බරපතල වැඩ සහිත සිර දඬුවම් සහ රුපියල් 50,000ක් බැගින් දඩ මුදලක් ගෙවීමට නියම වූ අතර එකී දඩ මුදල් නොගෙවන්නේ නම් තවත් වසර 03 බැගින් ලිහිල් වැඩ සහිත සිර දඬුවම් නියම කරන ලදි.

මෙම තීන්දුව මිය ගිය ජෙරාඩ් මර්වින්ට හා ඔහුගේ පවුලේ අයට යුක්තිය ඉටු කිරීමක් පමණක් නොව වධහිංසනයෙන් හා කෲර අමානුෂික හා අවමන් සහගත සැලකිලි වලින් පීඩාවට පත් වින්දිතයන් ඇතුළු වධහිංසාවන්ට එරෙහි සියලු පුරවැසියන් ලැබූ ජයග්‍රහණයකි.

1994 අංක 22 දරන වධහිංසාව හා කෲර අමානුෂික හා අවමන් සහගත සැලකිලිවලට එරෙහි ජාත්‍යන්තර සම්මුති පනත යටතේ පවරා ඇති අවම සංඛ්‍යාවක නඩු හා ඒවායේ තීන්දු සලකා බැලූ පසු මෙලෙස එකී පනතේ දක්වා ඇති ආකාරයටම එනම් එකී පනත ඒ අයුරින්ම ක්‍රියාත්මක කරමින් විත්තිකරුවන්ට දණ්ඩනයන් පැනවීම් වාර්තා නොවන මට්ටමක පවතී. එවන් තත්වයක් තුළ එකී පනතේ දණ්ඩන වගන්ති ඒ අයුරින්ම ක්‍රියාත්මක කරමින් අදාළ සම්පූර්ණ සිර දණ්ඩනයම ලබා දීම මෙහිදී ගරු මහාධිකරණ විනිසුරුතුමා විසින් සිදු කර ඇත.

ඉහත කී පනත සම්මත කර වසර 25ක් ගතවන මේ වසරේදී මෙම තීන්දුව ලැබීම මෙම පනත යටතේ නඩු පැවරීම දිරිමත් කරවන්නක් මෙන්ම මානව හිමිකම් විෂයෙහි ඉදිරිගාමී මැදිහත්වීමක් වෙයි.

ලක්ෂාන් ප්‍රනාන්දු
02.08.2019

# පොලිසිය සහ පුරවැසියා....

සාමාන්‍යයෙන් පොලිස් නිලධාරීන් සැකකරුවන්ගෙන් තොරතුරු ලබා ගැනීමට භාවිත කරන ක්‍රමවේදය වන්නේ ඔවුන් දරුණු වධ හිංසාවන්ට ලක් කිරීමයි. එහි ප්‍රතිඵලයක් ලෙස අපේ රටේ පොලිස් සිර මැදිරි තුළ මිය ගිය සැකකරුවන්ගේ ප්‍රමාණය අතිවිශාලය. තව ද මිනීමරුවෙකු වුවත්, ස්ත්‍රී දූෂකයෙකු වුවත් කෙතරම් දරුණු අපරාධකරුවෙකු වුවත් ඝාතනය කිරීමට පොලිස් නිලධාරීන්ට කිසිදු අයිතියක් නැත. එබඳු ඝාතනයක් පොලිසිය විසින් සිදු කළ ද සැළකෙන්නේ මනුෂ්‍ය ඝාතනයක් ලෙසිනි. නමුත් අපේ රටේ වධහිංසාවට ලක් වීමේ අතුරුඵලයක් ලෙස මෙන් ම පොලිස් වෙඩි පහරින් ද මිය ගිය පුද්ගල සංඛ්‍යාව අසීමාන්තික ය.

බොහෝ විට මෙසේ පොලිසිය විසින් ඝාතනයට ලක් වන්නේ පාරේ බීමතින් ගමන් කිරීම, මාර්ග සංඥාවක් කඩ කරමින් යතුරු පැදියක් ධාවනය කිරීම වැනි ඉතා සුළු වැරදි කළ පුද්ගලයින් ය. පුත්තලම ප්‍රදේශයේ දී මාර්ග සංඥා නොතකා ධාවනය වූ යතුරුපැදියක් පසුපස පොලිස් නිලධාරීන් දෙදෙනෙකු හඹා ගොස් එම යතුරුපැදිය පුත්තලම මූලික රෝහල් පරිශ්‍රයට ඇතුළු වී නැවැත්වූ විට එක් පොලිස් නිලධාරියෙකු විසින් යතුරු පැදිය ධාවනය කළ පුද්ගලයාට රෝහල් පරිශ්‍රය තුළ වෙඩි තැබීමේ සිද්ධියක් 2015 වසරේ පෙබරවාරි මස වාර්තා විය. එම තරුණයා වේගයෙන් තම යතුරුපැදිය ධාවනය කොට තිබුණේ පුත්තලම රෝහලේ රෝහල්ගතව සිටි තම පියා බැලීමට ය. අපේ රට තුළ කොතෙකුත් මිනීමරුවන්, ස්ත්‍රී දූෂකයින්, මංකොල්ලකරුවන් වැනි දරුණු අපරාධකරුවන් සැඟව සිටියදීත් පොලිස් නිලධාරීන් මෙබඳු සුළු වරදක් කළ පුද්ගලයෙකු හඹා ගොස් වෙඩි තැබීමට තරම් පහත් තත්වයකට වැටීම ඛේදනීය තත්වයකි. ඒ එවැනි එක් සිදුවීමක් පමණි. අනෙක් අතට මෙහි පවතින අවදානම් තත්ත්වය නම් කිසියම් පොලිස් නිලධාරියෙකුට තමා සමඟ පෞද්ගලික අමනාපයක් පවතින පුද්ගලයෙකුට වුවද මේ අයුරින් වෙඩි තබා ඔහු

කිසියම් නීතියක් කඩ කළ බැවින් තමාට වෙඩි තැබීමට සිදු වූ බවට නිදහසට කරුණක් ලෙස කිව හැකි බැවිනි.

පසුගිය කාල වකවානුව තුළ අපේ රටේ දක්නට ලැබුණ තවත් සිදුවීම් දාමයක් වූයේ පොලිස් අත්අඩංගුවේ සිටින සැකකරුවන් සොර බඩු පෙන්වීමට රැගෙන යන අතරතුර එම සැකකරුවන් ගඟකට පැන මිය යාමේ සිද්ධීන් එක පෙළට වාර්තා වීමයි. තවද පොලිස් සිර මැදිරි තුළ සිය දිවි නසා ගන්නා සැකකරුවන්ගේ සංඛ්‍යාව ද මෑතක සිට සීමාවක් නැත. නමුත් පොලිස් සිරභාරයේ රඳවා ගෙන සිටින සැකකරුවන්ගේ ජීවිතය සම්බන්ධව පොලිසියට සෘජුවම වගකීමක් පවතී.

ඉන්දීය ශ්‍රේෂ්ඨාධිකරණය **ඉන්දර් සින්ග්** **එරෙහිව** **පන්ජාබ් රාජ්‍ය සහ තවත් අය** [34] නඩුවේදී "...නීතිය හා සාමය රැකීම මෙන්ම පුරවැසියන් ආරක්ෂා කිරීම ද පොලිස් නිල ඇඳුමින් සැරසුණ පොලිස් නිලධාරියෙකුගේ මූලික වගකීමක් බව පන්ජාබ් පොලිසියට අමතක වී ඇති බව පෙනී යයි..." ලෙස සිදු කළ ප්‍රකාශය අප රටට ද අදාළ වන බව මෙම සිදුවීම් දෙස බලන විට පෙනී යයි.

[34] 1995 (3) SCC 702

# මෙම කෘතිය සම්පාදනයේදී යොදා ගත් මූලාශ්‍ර


1. S.C.(FR) Application No. 328/2002 (ජෙරාඩ් පෙරේරාගේ ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දුව)

2. HC 326/03 (1994 අංක 22 දරන වධ දීමට හා අනෙකුත් කෲර අවමන්සහගත සැළකීමට එරෙහි සම්මුති පනත යටතේ පවරන ලද වධහිංසා නඩුව)

3. CALA 5/2008 ( HC 326/03 නඩුවේ තීන්දුවට එරෙහිව අභියාචනාධිකරණයට යොමු කළ අභියාචනයේ තීන්දුව)

4. HC 445/2005 (ජෙරාඩ්ගේ ඝාතන නඩුවේ තීන්දුව)

5. ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව - 1978

6. දණ්ඩ නීති සංග්‍රහය

7. සාක්ෂි ආඥා පනත

8. 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය

9. 2015 අංක 04 දරන අපරාධයක වින්දිතයින් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත

10. ශ්‍රී ලංකාවේ අපරාධ සාක්ෂ්‍ය නීතිය, ගුණසේන තේනබදු

11. Law of Evidence, G. L. Peiris

# ජෙරාඩ් පෙරේරා ගැන ලියවු කවි

ජෙරාඩ් නමැති හිතවතෙකුට කළ හදිය
හොඳ හැටි කියන්නට මාගේ කට මදිය
මර්ධන හස්තයෙන් ඔහු නැති කළ විදිය
සිහිකර හඬයි කැලණියේ මහ නදිය

උපතින් හැඳල හයියක් ඇති තරුණ රට
බයක් නොමැති හිතවත් කම ඇත සැමට
සිනාවක් මුවේ උපතින් උරුම කොට
පින්වත් තරුණයා අමතක නොවේ මට

මරණ තුනක් වුනු දිනදී වත්තලදී
පොලීසියට අග මැද මුල වැරදී
මොලයක් නැතිව කටයුතු කරනා විටදී
නීතිය මැකී භීතිය මතුවුන තැනදී

දරුවන් අරන් පාසල් ගිය මව නවතා
සැරකර රියක් ඇතුලට ගෙන බොරු පවසා
දුරකථනයෙන් හිතවත් සැමියා අමතා
යක්ෂ රැලක් ගොදුරක් සොයානා විලසා

ආදර හිතින් කඩිමුඩියේ පැමිණි පියා
මගදි අල්ලගෙන මේ හොරු අරන් ගියා
බාල්කයක එල්ලා ඇස් වසා තියා
පොල්ලෙන් පහර දුනි තොරතුරු අසා පියා

හසරක් නොදන කිසි අපරාධයක් ගැන
අසරණ තිදරු පියෙකුට කළ හැටිය විණ
සැලවී පසුව පවුලේ අය පැමිණ දින
වරදක් වුනා යයි පවසා බාර දින

රෝහලකට ගොහින් එතුමා ඇතුලු වුනා
බියකරු පුවත රට හැමතැන පැතිර වුනා
දොස්තරවරුන් කඩිමුඩියේ වැට ලැවුනා
වකුගඩු කඩා වැටිලා යයි නියම වුනා

තත්ත්වය නරක් වී දින දිනම
සිහිසුන් නැතිව ඔහු හිටියා සිටි තැනම
නැගිටින එකක් නෑ යන බිය හැම තැනම
අනේ කියා ඇඬුවා මුලු ලක් බිමම

යාලුවො නොමැත ඔහු අතහැර දැමුවේ
බිරිඳත් ලඟම සිටියා පවුරක් විලසේ
දෙස්තරවරුන් වෙහෙසුනි රෑ හා දවසේ
එළියක් නැවත ආවා පසලොස් දවසේ

සුව වුන පසුව කම්පා වී බිය නොවැදී
යුක්තිය සොයන්නට ඔහු දූන් මගට බසී
අධිකරණයේ උදහස පොලිසියට වදී
හිමිකම් කඩකලැයි එහි දී කියන ලදී

වධහිංසාව කර ඇත පෙත්සම් කරුට
දඩුවම් දිය යුතුය මේ කළ පොලීසියට
තරවටුවකුත් කර පොලිසියේ ලොක්කාට
ලිව්වා තීන්දුව දිග කොල ගණනකට

නීතිපතිගෙ උපදෙස් පිට අවනඩුව
සොයා බලන්නට පත්කළ දක්ෂ අය
සැකයක් නැතුව දූන හිංසා කරපු අය
දමාලා මංචුවේ
මවිතෙට පත්කලා මීගමු උසාවිය

වැරදිකාරයන් අල්ලන පොලීසිය
මෙදා නැංගා විත්ති කූඩුවට
අපරාධ නඩුවකට මූණ දෙන්නට
හත් අවුරුද්දයි නඩුව ඔප්පු උනෝතින්

අපරාධ කරපු ලොක්කෝ
දූන් බොහොම බය වෙලා
ඔහු පසුපසින් ආවා
නඩුවට නැවිත් ඉඳලා

අපිව බේරාගනින් සල්ලි දෙන්නන් කියලා
ඒක බාර නොගත් හින්දා
හොඳටම ප්ලෑන් කරලා
යන එනමන් බලලා
කාර් එකකින් පස්සෙන් එලවලා
බස් එකකදි වෙඩි තිබ්බා

එලෙසින් නිහඩ කළ නොහැකි වූ ඔහු හඬට
ලෝකය කිපී නිදි නැති විය ලොකු අයට
පරීක්ෂණේ රට හැම තැන පැතිරි විට
පව් කළ එවුන් හසුවූවා නීතියට

රජකම් කළත් කළ කම් පලදෙන බැවිනි
කාකි ඇන්ද මුත් නීතියේ ගැට ගැසිනි
ජනමතයයි කියා දෙයකුත් ඇති බැවිනි
මිදීමට නොහැක කාටත් කළ පවිනි

නොනැවත නැගුන හොත් හඬ මහ ආවේගෙන්
වධහිංසාව නැති කළ හැක ලංකාවෙන්
ජීවත් වී මොටද බිය මුසු සංකාවෙන්
අපි ඔහු පුදමු හිමිකම් ගැන බලවේගෙන්

**නීතිඥ බැසිල් ප්‍රනාන්දු - මානව හිමිකම් ධර්මාලංකාරයෙන් උපුටා ගන්නා ලදී.**